# දේශපාලන විද්‍යාව

## අ.පො.ස (උසස් පෙළ)

# ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

2009 සිට 12 වන ශ්‍රේණිය සඳහා

(මෙම විෂය නිර්දේශය අළලා ප්‍රථම වරට විභාගය පවත්වන්නේ 2011 දීය)

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

# හැඳින්වීම

වර්ෂ 2007 දී 6 සහ 10 ශ්‍රේණිවලට හඳුන්වා දෙන ලද නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්නුම් ප්‍රවේශය ක්‍රමයෙන් වසරින් වසර 7, 8 හා 11 යන ශ්‍රේණිවල විෂය මාලාව සම්බන්ධයෙන් ද යොදා ගන්නා ලද අතර 2009 වසරේදී එය අ.පො.ස (උ/පෙළ) පන්තිවලට අදාළ විෂයමාලාව සම්බන්ධයෙන් ද ව්‍යාප්ත කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකවරුන් සමත් වී තිබේ. එම නිසා 12 හා 13 වන ශ්‍රේණිවල විවිධ විෂය හා අදාළ විෂය නිර්දේශ ද ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ද සිසුන් තුළ ප්‍රගුණ කළයුතු නිපුණතා ද නිපුණතා මට්ටම් ද පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කොට තිබේ. මෙම තොරතුරු තම විෂය හා අදාළ ඉගෙනුම් - ඉගැන්නුම් අවස්ථා සම්පාදනයේදී ගුරුවරුන්ට මහත්සේ ප්‍රයෝජනවත් වනු ඇත.

අ.පො.ස. (උ.පෙළ) විෂය සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සකස් කිරීමේ දී විෂයමාලා සම්පාදකවරුන් විසින් කනිෂ්ඨ ද්විතියික විෂයමාලාව හා ජ්‍යෙෂ්ඨ ද්විතියික (10,11 ශ්‍රේණි) විෂය මාලාව සකසන විට අනුගමනය කොට ඇති ප්‍රවේශයට වඩා වෙනස් වූ ප්‍රවේශයක් අනුගමනය කොට ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි. 6, 7, 8, 9, 10, හා 11 යන ශ්‍රේණිවල දී විෂය කරුණු ඉගැන්වීමේදී අනුගමනය කළ යුතු ඉගෙනුම් හා ඉගැන්නුම් ප්‍රවේශ සම්බන්ධයෙන් ගුරුවරුන් අභිමත ආකෘතියකට යොමු කරන ලද මුත් අ.පො.ස. (උ.පෙළ) විෂය නිර්දේශය හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සම්පාදනයේ දී ගුරුවරුන්ට තම අභිමතය පරිදි ක්‍රියාකිරීමටත් ප්‍රශස්ත නිදහසක් භුක්ති විඳීමටත් ඉඩ ප්‍රස්ථාව සලසා තිබේ.මෙම තලයේ දී ගුරුවරුන්ගෙන් අපේක්‍ෂා කරනුයේ ඒ ඒ විෂයට ඒකකයට හෝ පාඩමට නියමිත නිපුණතා සහ නිපුණතා මට්ටම් වර්ධනය කිරිම පිණිස යෝජිත ඉගැන්නුම් ක්‍රමවලින් තමන් අභිමත ඉගැන්නුම් ක්‍රමයක් යොදා ගැනිමය. තමන් යොදා ගන්නා ඉගැන්නුම් ප්‍රවේශය සතුටුදායක හා කාර්යක්‍ෂම ලෙස යොදා ගනිමින් අපේක්‍ෂිත නිපුණතා හා නිපුණතා මට්ටම් ළඟා කර ගැනීම ගුරුවරුන් විසින් නොපිරිහෙළා ඉටු කරනු ලැබිය යුතුය. මෙම නිදහස ගුරුවරුන්ට ලබා දිමට තීරණය කරන ලද්දේ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ඇති වැදගත්කම සහ එම විභාගය කෙරෙහි අධ්‍යාපන පද්ධතියේ සියලු ම අය දක්වන සංවේදී බව සැලකිල්ලට ගෙන බව සටහන් කරනු කැමැත්තෙමි.

මෙම ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුන් හට මාහැඟි අත් පොතක් වේවා යි ප්‍රාර්ථනය කරමි.අපේ දරුවන්ගේ නැණසැස පාදන්නට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති තොරතුරු ක්‍රමවේද සහ උපදෙස් අපගේ ගුරුවරුන් හට නිසි මගපෙන්වීමක් කරනු ඇතැයි අපේක්‍ෂා කරමි.

මහාචාර්ය ලාල් පෙරේරා
අධ්‍යක්ෂ ජනරාල්

## සංඥාපනය

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 2009 වර්ෂයේ සිට 12 වන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා ගුරු භවතුන්හට ප්‍රයෝජනවත් වේ.

මෙම පොත සම්පාදනය කිරීමට පාදක කරගත් විෂය නිර්දේශය මෙතෙක් පැවති විෂය නිර්දේශවලට වඩා වෙනස් වූවකි. එම වෙනස හඳුනා ගැනීමට යොමුවන ඔබට එය නිපුණතා පාදක විෂය නිර්දේශයක් බව දැකිය හැකි ය. මෙහි දැක්වෙන නිපුණතාවක් එම ශ්‍රේණිය තුළදී ම සාක්ෂාත් කර ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. ඇතැම්විට ඒ සඳහා බොහෝ කලක් ගතවිය හැකි ය. එහෙත් නිපුණතා මට්ටම් හා එක් එක් නිපුණතා මට්ටම් යටතේ දැක්වෙන ඉගෙනුම් ඵල එම ශ්‍රේණිය තුළදී ම අත්පත් කර ගත යුතු වේ. එබැවින් ඔබට ශ්‍රේණියට අදාළ පාඩම් සැළසුම් කර ගැනීමේ දී එම නිපුණතා මට්ටම් හා ඉගෙනුම්ඵල බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම ඉගෙනුම්ඵල ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එක් එක් අරමුණු සකසා ගැනීමට මෙන් ම පන්ති කාමරයේ දී සිදු කෙරෙන ඇගයීම් උපකරණ සකස් කර ගැනීමේ දී නිර්ණායක ලෙස යොදා ගැනීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ. මෙම විෂය හැදෑරීමේ දී පරිශීලනය කළ යුතු අතිරේක පොත් පත් මෙන් ම වෙබ් අඩවි පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට ද මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට ප්‍රයෝජනවත් වේ.

මෙහි යෝජිත ක්‍රියාකාරකම් ඔබ නිර්මාණශීලී ගුරුවරයෙකු වශයෙන් ක්‍රියා කිරීමේ අපේක්ෂා සහිතව ආදර්ශවත් ලෙස ඉදිරිපත් කළ ඒවා වශයෙන් සලකන්න. ගුරු කේන්ද්‍රීය පන්ති කාමර ක්‍රියාවලිය වෙනස් කර ශිෂ්‍ය කේන්ද්‍රීය බවක් ඇති කිරීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ එබැවින් සිසුන් විවිධ පොත්පත් පරිශීලනයට අන්තර්ජාල භාවිතය වැනි ගවේෂණයට යොමු කෙරෙන ඉගෙනුම් අවස්ථා හැකි හැමවිට ම උදා කළ යුතු වේ. ඉගැන්වීමේ දී සාම්ප්‍රදායික ලෙස සටහන් ඉදිරිපත් කිරීම වෙනුවට ආකර්ෂණීය ලෙස නව දැනුම මූලධර්ම ආදිය ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා තාක්ෂණය හැකිතාක් දුරට යොදාගත් සන්නිවේදන උපක්‍රම භාවිත කිරීම නව පන්තිකාමරය තුළ දී උනන්දු විය යුතු වේ. ඒ සඳහා නව තාක්ෂණික උපකරණ හැකිතාක් දුරට භාවිත කිරීමට නිර්මාණශීලීවීම අවශ්‍ය වේ.

12 වන ශ්‍රේණියේ දී මෙම විෂය ඉගෙනීම අරඹන ඔබගේ සිසුන්ට විෂය නිර්දේශ මනාව පැහැදිලි කර දෙන්න. වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ඔබගේ ඉගැන්වීමේ සැළැස්ම හඳුන්වා දෙන්නේ නම් එය සිසුන් තුළ පෙළඹවීමක් වනු ඇත. මුළු විෂය නිර්දේශය ආවරණය කර ගැනීමට පාසල වෙත සිසුන් ආකර්ෂණය වේ. මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණ රටට දැනෙන පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ වෙනසක් ඇති කරනු සඳහා අදාළ විෂය නිර්දේශය මෙන් ම මෙහි යෝජිත ක්‍රියාවලි ඇසුරෙන් ඔබගේ නිර්මාණශීලී හැකියා පුබුදුවා ගන්නා මෙන් ඉල්ලමි.

මෙම මාර්ගෝපදේශ සැකසීමේ දී දායක වූ විද්වත් සැමට, ගුරුභවතුන්ට සහ ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරින්ට මගේ ස්තුතිය හිමි වේ. මේ කාර්යය සඳහා මඟපෙන්වූ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ලාල් පෙරේරා මැතිඳුන් මෙන් ම මුද්‍රණ කටයුතු සිදුකර පාසල්වලට ලබාදීමේ වගකීම භාරගෙන කටයුතු කළ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලයට මගේ විශේෂ ස්තුතිය පුද කරමි. මෙහි ඇතුළත් කරුණු පිළිබඳ ව සංවර්ධනාත්මක යෝජනා ඇතොත් මා වෙත ලබාදෙන්නේනම් කෘතඥ වෙමි.

විමල් සියඹලාගොඩ
සහාකාර අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය.

**උපදේශනය**

| | | |
|---|---|---|
| මහාචාර්ය ලාල් පෙරේරා මහතා | - | අධ්‍යක්ෂ ජනරාල් , ජාතික අධ්‍යාපන ආයතනය. |
| විමල් සියඹලාගොඩ මහතා | - | සහකාර අධ්‍යක්ෂ ජනරාල් ජාතික අධ්‍යාපන ආයතනය. |
| ආචාර්ය එච්.ඩී.ඒ. ලලිතා බටුවිටගේ මහත්මිය | - | අධ්‍යක්ෂ සමාජ විද්‍යා (විශ්‍රාමික) ජාතික අධ්‍යාපන ආයතනය. |
| ආචාර්ය යූ. නවරත්නම් මහතා | - | අධ්‍යක්ෂ සමාජ විද්‍යා (විශ්‍රාමික) ජාතික අධ්‍යාපන ආයතනය. |

**සම්බන්ධීකරණය**

ඩබ්.ඒ. කුමුදේනි සුදර්ශනී මිය - ව්‍යාපෘති නිලධාරි, ජාතික අධ්‍යාපන ආයතනය

**ව්‍යාපෘති කමිටුව**

| | | |
|---|---|---|
| ඩබ්.ඒ. කුමුදේනි සුදර්ශනී මිය (ව්‍යාපෘති නායක) | - | ව්‍යාපෘති නිලධාරි, ජාතික අධ්‍යාපන ආයතනය. |
| එස්. කරුණාකරන් මයා | - | සහකාර ව්‍යාපෘති නිලධාරි, ජාතික අධ්‍යාපන ආයතනය |

**විෂයමාලා උපදේශනය**

| | | |
|---|---|---|
| මහාචාර්ය එම්.ඕ.ඒ ද සොයිසා මයා | - | පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| මහාචාර්ය නවරත්න බණ්ඩාර මයා | - | පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| මහාචාර්ය පියදාස අතුකෝරල මයා | - | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධම්ම දිසානායක | - | කොළඹ විශ්ව විද්‍යාලය |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහේෂ් සේනානායක | - | කොළඹ විශ්ව විද්‍යාලය |
| ඒ.එල්.එස්. අබේවික්‍රම මයා | - | ව්‍යාපෘති නිලධාරි, ජාතික අධ්‍යාපන ආයතනය. |
| ඩබ්.ඒ. කුමුදේනි සුදර්ශනී මිය | - | ව්‍යාපෘති නිලධාරි, ජාතික අධ්‍යාපන ආයතනය. |

**ලේඛක මණ්ඩලය**

| | | |
|---|---|---|
| සද්ධා මංගල විතානාච්චි මයා | - | සහකාර කථිකාචාර්ය, කොළඹ විශ්ව විද්‍යාලය |
| බී.එල්.ආර්. රෝහණ කුමාර මයා | - | ව්‍යාපෘති නිලධාරි (විශ්‍රාමික), ජා. අ .ආ |
| එම්.එම්.ජී.සී. රත්නායක මිය | - | උසස් බාලිකා විදුහල, මහනුවර |
| ඒ.එම්.පී. අබේසිංහ මිය | - | තෙල්දෙණිය ජාතික පාසල, තෙල්දෙණිය |
| එල්.ඩබ්. සෝමතිලක මයා | - | ශ්‍රී සුමංගල පිරිමි විද්‍යාලය, පානදුර. |
| විමලසේන ගලන්ගේ මයා | - | පේරාදෙණිය මහා විද්‍යාලය, පේරාදෙණිය |
| ඩබ්.එම්.ඩබ්. බණ්ඩාර මයා | - | බදුල්ල මහා විද්‍යාලය, බදුල්ල |
| ඩබ්.එම්.ඩී.බී. සපුවිද මයා | - | ශාන්ත තෝමස් විද්‍යාලය, මාතලේ |
| එස්. පී. පේමවතී මිය | - | ශාන්ත තෝමස් උසස් බාලිකා විද්‍යාලය, මාතර |
| කේ.ඒ.එන්. පුෂ්ප කුමාර මයා | - | පොලේගොඩ මහා විද්‍යාලය, මහගම. |
| සුජීව මිරිහාගල්ල මයා | - | යකරාවත්ත මහා විද්‍යාලය, කිතලව |
| රංජිත් පෙරේරා මයා | - | ප්‍රජාපති බාලිකා විද්‍යාලය, හොරණ |
| එල්.ඩබ්.කේ. රූපිකා පෙරේරා මිය | - | කන්නන්ගර මධ්‍ය මහා විද්‍යාලය, කළුතර |
| ආර්.එම්.උපාලි මයා | - | අනු/ විද්‍යාදර්ශි මහා විද්‍යාලය, නොච්චියාගම |
| එස්.ජී. ශ්‍රියාලතා මිය | - | උසස් බාලිකා විදුහල, මහනුවර |
| බී.එම්. සුනිල් විමලසිරි මයා | - | ශ්‍රී සාරතී විද්‍යාරතන පිරිවෙන, පැණිදෙණිය |
| ඩබ්.ඒ. නන්දන කුමාරසිංහ මයා | - | ලුම්බිණි මහා විද්‍යාලය, කොළඹ 05 |
| ඩබ්.ඒ. ධර්මප්‍රිය මයා | - | කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම |
| ඒ.එස්. ඊබ්‍රාහිම් සාහිබ් මිය | - | බද්දුදීන් බාලිකා විද්‍යාලය, මහනුවර |

**භාෂා සංස්කරණය**

ජී. ගමගේ මිය - ගුරු සේවය (විශ්‍රාමික), ඔලබොඩුව සොයිසා ම.වි.

**වෙබ් අඩවිය**

www.nie lk

**පරිගණක අකුරු ඇමුණුම**

ඒ.එල්.එස්.පී. අතපත්තු මෙවි. - සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජා.අ.ආ.

**පිටකවර සැකසුම**

ඒ.එල්.එස.පී. අතපත්තු මෙවි. - සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජා.අ.ආ.

එම්.එන්.එෆ්. රිහානා මෙවි. - සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජා.අ.ආ.

**විවිධ සහය**

ශිරාණි දීප්තිකා සමරක්කොඩි මිය - සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජා.අ.ආ.

එම්.එන්.එෆ්. රිහානා මෙවි. - සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජා.අ.ආ.

ආර්.එම්. රූපසිංහ මයා - සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජා.අ.ආ.

# පටුන

පිටු අංක


| | | |
|---|---|---|
| 1 | දේශපාලන විද්‍යාවේ ස්වභාවය | 07 - 13 |
| 2 | දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය | 14 - 16 |
| 3 | රාජ්‍යයේ ස්වභාවය | 17 - 25 |
| 4 | ආණ්ඩුවේ ස්වභාවය, ආණ්ඩු ක්‍රම ආකෘති සහ කාර්යයන් | 26 - 36 |
| 5 | ආණ්ඩුකරණයට ජනතාව සම්බන්ධ වන විධික්‍රම | 37 - 43 |
| 6 | ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය අතර පවත්නා අන්තර් සම්බන්ධතාව | 44 - 50 |
| 7 | ශ්‍රී ලංකාවේ පැවති යටත් විජිත පාලනයේ ස්වභාවය | 51 - 61 |
| 8 | නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේ පසුබිම | 62 - 80 |
| 9 | පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම | 82 - 83 |
| 10 | පාසල පදනම් කරගත් ඇගයීම් | 84 - 87 |

# දේශපාලන විද්‍යාවේ ස්වභාවය

**නිපුණතාව 01 :-** දේශපාලන විද්‍යාවේ ස්වභාවය පිළිබඳ අවබෝධයක් සහිත සහ දේශපාලන විද්‍යාව පිළිබඳ දැනුවත් භාවයකින් යුත් පුද්ගලයෙකු ලෙස කටයුතු කරයි.

**නිපුණතා මට්ටම :-** **කාලච්ඡේද (25)**

1.1 දේශපාලන විද්‍යාව සමාජ විද්‍යාවක් ලෙස අර්ථ කථනය කරයි.
1.2 දේශපාලන විද්‍යාව සහ අනෙකුත් සමාජීය විද්‍යා විෂයයන් අතර පවත්නා සම්බන්ධතාව විග්‍රහ කරයි.
1.3 දේශපාලන විද්‍යාවේ විකාශනය පිළිබඳ අවබෝධය වර්තමාන දේශපාලන පසුබිම ගවේෂණය කිරීමේදී යොදා ගනියි..
1.4 විෂයට අනන්‍ය වූ විවිධ ප්‍රවේශ භාවිතා කරමින් දේශපාලන විද්‍යාව හදාරයි.

**ඉගෙනුම් ඵලය :-**

- දේශපාලන විද්‍යාව යනු කුමක්ද? යන්න අවබෝධ කර ගනියි.
- දේශපාලන විද්‍යාව හා අනෙකුත් සමාජ විද්‍යා විෂයයන් අතර සම්බන්ධතාව වටහා ගනියි.
- කාලයත් සමඟ විවිධ යුගවල දේශපාලන විද්‍යා විෂය පරිපථයට එක් වූ නව තේමාවන් අවබෝධ කර ගනියි.
- දේශපාලන විද්‍යාව හැදෑරීමේ විධික්‍රම ලැයිස්තු ගත කරයි.
- දේශපාලන විද්‍යාව හැදෑරීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**හැඳින්වීම :-**

- ග්‍රීක යුගයෙන් ආරම්භ වන දේශපාලන විද්‍යා විෂය අධ්‍යයනය කිරීම මේ වන විට විවිධ ක්ෂේත්‍ර ඔස්සේ වර්ධනය වෙමින් ඉදිරියට පැමිණ ඇත. ග්‍රීක යුගයෙන් පටන් ගෙන මධ්‍යතන යුගයේ අවසානය දක්වා වූ සමස්ත කාලය පුරාම දේශපාලනය හැදෑරුවන්ගේ මූලික අවධානය යොමු වූයේ රාජ්‍ය කේන්ද්‍රගත අධ්‍යයනයකටය. නූතන යුගයේ ආරම්භයත් සමග දේශපාලන විද්‍යාව බලය පිළිබඳ හදාරන විෂය ලෙස ඉදිරියට පැමිණ ඇත.
  19 වන සියවසේ අගභාගයේ සිට ඉදිරියට එන රාජ්‍ය සුභසාධකවාදය සමඟ දේශපාලන විද්‍යාව රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, රාජ්‍ය පරිපාලනය හා කළමණාකරණය පිළිබඳ හැදෑරීමක් ලෙසත් අද වන විට ගැටුම් කළමණාකරණය හා ගැටුම් නිරාකරණය පිළිබඳ හැදෑරීමක් ලෙසත් වර්ධනය වි ඇත.
  මෙසේ දේශපාලන විද්‍යාව කාලීනව ඇතිවන සිදුවීම් සමඟ වෙනස් වෙමින් ඉදිරියට පැමිණෙන බවත් ඒ අනුව අධ්‍යයනය කරන විෂය පරිපථය පුළුල් වී ඇති බවත් අධ්‍යයනය කිරීම මෙම ඒකකයෙන් බලාපොරොත්තු වේ.

**විෂයකරුණු පැහැදිලි කරගැනීම සඳහා අත්වැලක්**

**1. දේශපාලන විද්‍යාව හඳුනා ගැනීම**

1.1
- දේශපාලන විද්‍යාව අයත් වන්නේ සමාජීය විද්‍යා ගණයටය.
- සමාජ විද්‍යාවක් මගින් කරනුයේ මිනිසාගේ සමාජ හැසිරීම හා සම්බන්ධ විවිධ පැතිකඩ අධ්‍යයනය කිරීමය.

- මේ අනුව දේශපාලන විද්‍යාව මගින් කරනුයේ මිනිසා දේශපාලන ජීවියෙකු ලෙස සංවිධිත දේශපාලන සමාජයක් තුළ හැසිරෙන ආකාරය අධ්‍යයනය කිරීමය.
- එමගින් අදහස් කරන්නේ මිනිසා දේශපාලන තීරණවලට එළඹෙන්නේ කෙසේද? එම තීරණ සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියා කරන්නේ කෙසේද? දේශපාලන අරමුණු ඉටුකර ගැනීම සඳහා මිනිසා දේශපාලන සමාජයක් තුළ ගොඩ නගා ඇති දේශපාලන ආයතන සමග සම්බන්ධතා පවත්වන්නේ කෙසේද යන්නයි.
- මිනිසාගේ දේශපාලන හැසිරීම තීරණය වීම කෙරෙහි බලපාන්නේ දේශපාලන කරුණු පමණක්ම නොවේ.

  ආර්ථික
  සංස්කෘතික
  ආගමික
  සමාජයීය
  මනෝවිද්‍යාත්මක
  භූගෝලීය
  පුද්ගල
  ඓතිහාසික උරුමයන් යනාදී වශයෙන් පුළුල් සාධක සමූහයක් ඒ කෙරෙහි බලපානු ලැබේ.

## 1.2 දේශපාලන විද්‍යාව සහ අනෙකුත් සමාජීයීය විද්‍යා විෂයයන්

දේශපාලන විද්‍යාව අනෙක් සමාජයීය විද්‍යාවන් සමග ඉතා කිට්ටුවෙන් බැඳී තිබෙන ආකාරය දැකිය හැක.

- ඉතිහාසය

  ආර්ථික විද්‍යාව
  භූගෝල විද්‍යාව
  දර්ශනය
  සමාජ විද්‍යාව
  නීතිය
  මානව විද්‍යාව
  සංඛ්‍යාන විද්‍යාව යනාදිය නිදසුන් ලෙස දැක්විය හැක.

මෙම සමීප සම්බන්ධතාව හේතු කොට ගෙන දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම දේශපාලන විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් පමණක් කළ නොහැකි බව ඇතැම් විද්වතුන්ගේ අදහස වේ.

ඒ සඳහා අන්තර් විෂයාත්මක දෘෂ්ටිකෝණ යොදාගත යුතු බව ඔවුන් ප්‍රකාශ කොට ඇත.

පර්යේෂණ ක්‍රමවේද, විෂය අන්තර්ගතය සහ විෂය තුළ වර්ධනය වී ඇති න්‍යාය සහ සංකල්ප සලකා බලමින් දේශපාලන විද්‍යාව අර්ථාන්විතවම නියම විද්‍යාවක් බවට විද්වතුන් පිරිසක් තර්ක කරන අතර තවත් විද්වත් පිරිසක් දේශපාලන විද්‍යාව ශාස්ත්‍රීය විෂයක් පමණක් බවට මත පල කරති.

## 1.3 දේශපාලන විද්‍යාව අධ්‍යයනය විෂයක් ලෙස

- දේශපාලන විද්‍යාව විෂයක් ලෙස අධ්‍යයනය කිරීම ආරම්භ වන්නේ ක්‍රි . පූ . 3 වන සියවසයේ දී පමණ ඉපැරණි ග්‍රීසිය තුළය.
- මේ සම්බන්ධයෙන් පදනම දැමූවන් ලෙස සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් යන ග්‍රීක දේශපාලන හා සමාජ දාර්ශනිකයන් තිදෙනා හඳුනා ගත හැක.
- ග්‍රීක යුගයේ සිට මේ දක්වා ඉදිරියට පැමිණ ඇති දේශපාලන විද්‍යා විෂය අධ්‍යයනය කිරීමේ පහසුව සඳහා යුග වලට බෙදා තිබෙන ආකාරය දැකිය හැක.
  ඒවා නම් -
  - ග්‍රීක යුගය
  - රෝම යුගය
  - මධ්‍යතන යුගය
  - නූතන යුගය
- ක්‍රි . පූ . 7 වන සියවසේ සිට 15 වන සියවස දක්වා කාලය ඉහත දැක්වූ මුල් යුග තුනට ද,15 වන සියවසෙන් පසු කාලය නූතන යුගයට අයත් කාලය ලෙස ද සලකනු ලැබේ.
- දේශපාලන විද්‍යා විෂයයේ විකාශය දෙස බැලීමේ දී පෙනී යන ප්‍රධානතම ලක්‍ෂණය වන්නේ ඒ ඒ යුගවල දී සිදුවී ඇති දේශපාලන සිදුවීම් සමග දේශපාලන විද්‍යාවේ අවධානය යොමු කරන විෂය කරුණු ප්‍රසාරණය වී ඇති බවය.
- නිදසුන් ලෙස ග්‍රීක,රෝම හා මධ්‍යතන යුගවල දී දේශපාලන සහ සමාජ දාර්ශනිකයින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළේ මිනිසාට උපරිම භෞතික හා ආධ්‍යාත්මික වර්ධනයක් ලබාදිය හැකි වඩාත් හොඳ රාජ්‍ය ක්‍රමය හා ආණ්ඩු ක්‍රමය කුමක්ද යන්න ගවේෂණය කිරීමටය.
- එබැවින් මෙම කාලය තුළ දේශපාලන විද්‍යාවේ ප්‍රධාන තේමාව වූයේ රාජ්‍ය හා ආණ්ඩුව පිළිබඳව හැදෑරීමය. එම නිසා දේශපාලන විද්‍යාව වූ කලී රාජ්‍ය හා ආණ්ඩුව පිළිබඳ හදාරන විෂය ලෙස ප්‍රචලිත විය.
- 15 වන සියවසෙන් පසුව ආරම්භ වන නූතන යුගය තුළ දේශපාලන විද්‍යාවේ තේමාව රාජ්‍ය හා ආණ්ඩුව පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් ඔබ්බට විහිදීයන ආකාරය දැකිය හැක.

මේ සම්බන්ධයෙන් බලපෑ මූලික කරුණු කිහිපයක් පෙන්වා දිය හැක.
ඒවා නම්

- ★ ජාතික රාජ්‍ය ක්‍රමයේ ආරම්භය
- ★ නව ආණ්ඩුක්‍රම ආකෘතීන් ඉදිරියට ඒම.
- ★ නව අධ්‍යයන ක්‍රම ඉදිරිපත් වීම
- ★ අනෙක් සමාජයීය විද්‍යා හා ස්වාභාවික විද්‍යා අධ්‍යයනය කිරීමෙන් ලබාගත් ප්‍රතිඵල වල බලපෑම.

- ඉහත කරුණුවල බලපෑමෙන් දේශපාලන බලය, රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා කළමනාකරණය, ගැටුම් නිරාකරණය හා ගැටුම් කළමනාකරණය, අන්තර් ජාතික දේශපාලනය යන විෂය ධාරාවන් ද දේශපාලන විද්‍යාව තුළට එක්වන ආකාරය හඳුනා ගත හැකි විය.

- මෙයට අමතර 20 වන සියවසයේ දෙවන භාගය තුළ වර්ධනය කළ චර්යාවාදී අධ්‍යයන ක්‍රමය ද දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය ප්‍රසාරණය කිරීම සම්බන්ධයෙන් ඉමහත් දායකත්වයක් සපයා ඇත. නිදසුන් ලෙස
    - දේශපාලන චර්යාව
    - දේශපාලන සමාජානුයෝජනය
    - දේශපාලන සංස්කෘතිය
    - දේශපාලන ප්‍රභූන්
    - දේශපාලන ක්‍රම අධ්‍යයනය (පද්ධති අධ්‍යයනය) යනාදිය පෙන්වා දිය හැකිය.

## 1.4 දේශපාලන විද්‍යාව අධ්‍යයන කිරීමේ ප්‍රවේශ / ක්‍රම

දේශපාලන විද්‍යාව අධ්‍යයනය සඳහා භාවිතයට ගැනෙන අධ්‍යයන ක්‍රම වේද කිහිපයක් ඇත. මේවා අතරින් වැදගත් ඒවා ලෙස පහත දැක්වෙන අධ්‍යයන ක්‍රමවේද හැඳින්විය හැක.

1. දාර්ශනික අධ්‍යයන ක්‍රමය
2. තුලනාත්මක අධ්‍යයන ක්‍රමය
3. ඓතිහාසික අධ්‍යයන ක්‍රමය
4. සමාජ විද්‍යාත්මක ක්‍රමය
5. චර්යාවාදී අධ්‍යයන ක්‍රමය
6. පද්ධති විශ්ලේෂණ ක්‍රමය
7. සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රමය

## 1. දාර්ශනික අධ්‍යයන ක්‍රමය

- සිතින් නිර්මාණය කරගත් ප්‍රශස්ත දේශපාලන ක්‍රමයක් පදනම් කර ගෙන එය ගොඩනැගීම සඳහා පැවතිය යුතු දේශපාලන පරිසරය විස්තර කිරීම මුල් කොට ගෙන මෙම අධ්‍යයන ක්‍රමය ගොඩනැගී ඇත.
- මෙම ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණය වන්නේ අවසාන ඉලක්කය ප්‍රථමයෙන් තීරණය කොට එම ඉලක්කය වෙත ළඟාවිය යුතු ගමන් මාර්ගය දෙවනුව විස්තර කිරීමය.
- ප්‍රායෝගික තත්ත්වය නොව මනඃ කල්පිත වාදය මෙම අධ්‍යයන ක්‍රමය හරහා වේ.
- ප්ලේටෝ ගේ "පරමාදර්ශ රාජ්‍ය", තෝමස් මෝර් ඉදිරිපත් කළ "උටෝපියානු රාජ්‍ය ක්‍රමය", රූසෝ ගේ පොදු කැමැත්ත, මාක්ස් ගේ " කොමියුනිස්ට් සමාජය" මෙම අධ්‍යයන ක්‍රමය පදනම් කරගෙන නිර්මාණය කර ඇති දේශපාලන සංකල්ප වේ.

## 2. තුලනාත්මක අධ්‍යයන ක්‍රමය

- දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ පැරණිතම අධ්‍යයන ක්‍රමයක් ලෙස මෙය හඳුන්වා දිය හැක.
- විවිධ දේශපාලන ක්‍රම සහ දේශපාලන ආයතන එකට ගෙන ඒවායේ හොඳ නරක, සම - අසමතා අධ්‍යයනය කරමින් වඩාත් ප්‍රශස්ත දේශපාලන ක්‍රමයක් හා ආයතන ගොඩනගා ගැනීම මෙම අධ්‍යයන ක්‍රමයේ හරය වේ. එමෙන්ම විෂයයට අදාළ නව දැනුම නිෂ්පාදනය සහ න්‍යාය සංවර්ධනය තුලනාත්මක හැදෑරීම්වල මූලික අරමුණ වේ.
- ඇරිස්ටෝටල් ගේ "දේශපාලනය" කෘතිය තුලනාත්මක අධ්‍යයනය පදනම් කරගෙන ලියන ලද විවිධ දේශපාලන කෘතීන්ට නිදසුන් ලෙස දැක්විය හැක.

- වර්තමානය වන විට තුලනාත්මක අධ්‍යයන ක්‍රමය ගුණාත්මක විශ්ලේෂණ ක්‍රමයක් ලෙස භාවිත කරයි.
- තුලනාත්මක දේශපාලන විද්‍යාව ( Comparative Politics) ලෙස විෂය ප්‍රභේදයක් වර්ධනය වීමට මෙම අධ්‍යයන ක්‍රමය මූලික වී ඇත.

**3. ඓතිහාසික අධ්‍යයන ක්‍රමය**

- දේශපාලන ආයතනයන්ගේ සහ දේශපාලන ක්‍රම වල ඓතිහාසික වර්ධනය හා වර්තමාන තතත්වය අධ්‍යයනය කරමින් ඒ මත ලබා ගන්නා ප්‍රතිඵල මත අනාගත ප්‍රවණතා කථනය කිරීම මත ඓතිහාසික අධ්‍යයන ක්‍රමය ගොඩ නැගී ඇත.

**4. සමාජ විද්‍යාත්මක ක්‍රමය**

- අන්තර් විෂයාත්මක සම්බන්ධතාවය තුළින් ගොඩනැගුණු ප්‍රවේශයක් ලෙස හැඳින්විය හැක. සමාජ විද්‍යාව ( Sociology ) හා මානව විද්‍යාව ( Anthropology) මෙයට මූලික වේ.
- සමාජ යාන්ත්‍රණය හා පුද්ගලයින්ගේ දේශපාලන හැසිරීම අවබෝධ කර ගැනීමට සමාජ විද්‍යාත්මක අධ්‍යයන ක්‍රම වඩාත් ඵලදායී වේ.
- සමාජ විද්‍යාත්මක අධ්‍යයන ක්‍රමයේ උපකරණ කිහිපයකි.
  1. සහභාගිත්ව පරීක්ෂණ
  2. ඍජු නිරීක්ෂණ
  3. සම්මුඛ සාකච්ඡා
  4. ප්‍රශ්නාවලී
  5. සිද්ධි අධ්‍යයනය

**5. චර්යාවාදී අධ්‍යයන ක්‍රමය**

- මිනිසාගේ සැබෑ දේශපාලන හැසිරීම පදනම් කොට ගෙන මෙම අධ්‍යයන ක්‍රමය ගොඩනැගී ඇත. මෙම අධ්‍යයන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණය වන්නේ
  - I සැබෑ තත්ත්වයන් පමණක් අධ්‍යයනයට ලක් කිරීම.
  - II සදාචාරාත්මක කරුණු හෝ ඉලක්ක අධ්‍යයනය නොකිරීම.
  - III අනවශ්‍ය අගය කිරීම්වලින් තොරවීම.
  - IV විද්‍යාත්මක ශිල්ප ක්‍රම භාවිතය යනාදියයි.

**6. පද්ධති විශ්ලේෂණ ක්‍රමය**

- මෙය ව්‍යුහ - කාර්ය විශ්ලේෂණ ක්‍රමය ලෙස ද හඳුන්වනු ලැබේ.
- ඇමෙරිකානු දේශපාලන විද්‍යාඥයන් දෙදෙනෙකු වූ ගබ්රියල් ආමන්ඩ් සහ ඩේවිඩ් ඊස්ටන් මෙම අධ්‍යයන ක්‍රමය හඳුන්වා දීමේ ප්‍රමුඛයෝ වෙති.
- දේශපාලන ක්‍රමයක් ගොඩනැගී ඇති ව්‍යුහයන් සහ ඒවා මගින් ඉටු කරන කාර්යයන් සමස්තයක් ලෙසගෙන අධ්‍යයනය කිරීම මත මෙම ක්‍රමය ගොඩනැගී ඇත.
  නිදසුන් ලෙස :- ගබ්රියල් ආමන්ඩ් විසින් ඉදිරිපත් කළ "ව්‍යුහ කාර්ය විශ්ලේෂණ ක්‍රමය" ඩේවිඩ් ඊස්ටන් ඉදිරිපත් කළ "යෙදවුම් - නිමවුම්" විශ්ලේෂණ ක්‍රමය දැක්විය හැක.

7. **සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රමය**

- ගණිතමය ශිල්ප ක්‍රම තුළින් දේශපාලනික ප්‍රපංචයන් හා සංසිද්ධීන් හඳුනා ගැනීම හා විශ්ලේෂණය කිරීමට සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රමය යොදා ගනී. මේසම්බන්ධයෙන් වැදගත් චින්තකයින් ලෙස බ්‍රයිස් සාමි, ග්‍රෙහැම් වොලර්ස්, ඩී වැල්ඩෝ ( Waldo ), එච්. ඩී. ඇන්ඩර්සන් දැක්විය හැක.
- ප්‍රමාණාත්මක විශ්ලේෂණයක් ලබාදීම සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රමයෙන් බලාපොරොත්තුවේ. ඒ නිසා එහිදී මූලික වශයෙන් දත්ත එකතු කිරීම වැදගත් වේ. ඉන් පසු මෙම දත්ත විශ්ලේෂණය කරයි. එහිදී ප්‍රස්ථාර, වගු ආදිය යොදා ගන්නා අතර සංඛ්‍යාත්මක මිනුම් ක්‍රමද යොදා ගනී. විශේෂයෙන්ම රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ දී නියදි හරහා තෝරා ගන්නා දත්ත මත පූර්ව නිගමනවලට එළඹීමට ,මැතිවරණ විශ්ලේෂණ කිරීම, ගැටුම් විශ්ලේෂණය දිළිඳුකම පිටුදැකීමේ සේවාවන් ආදිය නිරීක්ෂණය කිරීමේදී යොදා ගනී.

★ දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේදී ඉහතින් දක්වන ලද කිසිදු න්‍යායයක් නිරපේක්ෂ වශයෙන් යොදා ගත නොහැක.

★ එබැවින් ඒවා අවශ්‍යතාවයන් අනුව සම්මිශ්‍රණය කරමින් යොදා ගන්නා ආකාරය දැකිය හැකිවේ.

## 1.4 දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ වැදගත්කම

- දේශපාලනය අධ්‍යයනය කරන්නේ ඇයි?
- එසේ කිරීමේ ප්‍රයෝජනවත් භාවය කුමක්ද?
- කරුණු විමසීමේදී පෙනීයන්නේ දේශපාලන සමාජය තුළ ජීවත් වන සියළු දෙනාම දේශපාලන ජීවීන් බැවින් සහ දේශපාලන ක්‍රමයේ ක්‍රියාකාරිත්වයට ඔවුන් සියළු දෙනාම සහභාගිවන බැවින් දේශපාලන විද්‍යා අධ්‍යයනය කිරීම තාර්කික දේශපාලන ජීවියෙකු ලෙස ජීවිතය පවත්වා ගෙනයාම සඳහා අවශ්‍ය වන දෙයක් බවය.

- දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ ප්‍රයෝජනවත් භාවය පහත සඳහන් ආකාරයට දැක්විය හැක.
  - ★ තාර්කික දේශපාලන ජීවියෙකු බවට පත්වීමට හැකිවීම.
  - ★ තමා ජීවත් වන දේශපාලන පරිසරය පිළිබඳ අවබෝධ කර ගැනීම.
  - ★ වගකීම් හා යුතුකම් අවබෝධකර ගත් හොඳ පුරවැසියකු බවට පත්වීමට හැකි වීම.
  - ★ විචාරශීලිත්වය වර්ධනය කර ගැනීමට හැකිවීම.
  - ★ දේශපාලන ක්‍රමයේ විවිධ වෘත්තීන් සඳහා අවශ්‍ය කුසලතා වර්ධනය කර ගැනීම.
  - ★ අන්තර් ජාතික සමාජය පිළිබඳ අවබෝධ කර ගැනීමට හැකිවීම.
  - ★ රාජ්‍ය තාන්ත්‍රිකයන් බිහි කිරිම.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම

- සඟරාවක් සැකසීම
- ග්‍රීක යුගයේ සිට නව යුගය දක්වා ක්‍රමිකව සිදු වූ සමාජ විකාශනයේ ප්‍රතිඵලයක් ලෙස දේශපාලන විද්‍යාව අධ්‍යයනය විෂයයක් ලෙස ආරම්භ වූ ආකාරය පිළිබඳ සිසුන් තුළ පවත්නා අවබෝධය පරීක්‍ෂා කර බැලීම මෙම ක්‍රියාකාරකමෙන් බලාපොරොත්තු වේ.
- එක් එක් කණ්ඩායමට පහත සඳහන් යුගවල දේශපාලන විද්‍යාවේ විකාශය පිළිබඳ තොරතුරු විවිධ මූලාශ්‍ර ඇසුරෙන් ගවේෂණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
    - ග්‍රීක යුගය
    - රෝම යුගය
    - මධ්‍යතන යුගය
    - නූතන යුගය
- සිසුන් ගොනු කරන ලද කරුණු නිවැරදි ලෙස සංවිධානය කර යුග අනුව සඟරාව නිර්මාණය කිරිමට යොමුකරවන්න.
- ඉගෙනුම් ඵල වලට අදාළ නිර්ණායක පදනම් කරගෙන සිසුන් ඇගයීමට ලක්කරන්න.
- සඟරාව සිසුන්ගේ පරිහරණය සඳහා පුස්තකාලයට ලබාදෙන්න.

## මූලාශ්‍රය


1. **ඉලංගසිංහ මංගල , (2002) , පෙරදිග දේශපාලන චින්තනය - ආරිය ප්‍රකාශන**

2. **උයන්ගොඩ, ජයදේව (2003 අගෝස්තු) ගැටුම් , ගැටුම් සමථනය , මධ්‍යයනය සහ සාමය ගොඩ නැගීම - සමාජ විද්‍යාඥයින්ගේ සංගමය**

3. **සොයිසා, එම්.ඕ. ඒ. ද (2003) දේශපාලන විද්‍යාවේ මූලික සිද්ධාන්ත. කීතෘ ප්‍රකාශන.**

4. **දික්වැල්ල, රංජිත් , ප්‍රියන්ත රේණුක හා හෙට්ටිආරච්චි ශිරානි (සංස්කරණ (2003) ගැටුම් නිරාකරණ න්‍යාය සහ භාවිතය - ආරිය ප්‍රකාශකයෝ**

5. **Mail, Hugh, Ramsbotham, Oliver and Woodhouse, Tom (1999): Con temporary Conflict Resolution Cambridge Polity Press**

# දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය

**නිපුණතාව 02 :-** දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය පිළිබඳ පුළුල්ව කරුණු විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :-** **කාලච්ඡේද (10)**

- දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට අයත් විෂය කරුණු හදාරයි.
- සිවිල් ජන ජීවිතය යහපත් කිරීම සඳහා දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයේ කරුණු බලපාන ආකාරය පිළිබඳ දැනුවත් පුද්ගලයකු වෙයි.

**ඉගෙනුම් ඵලය :-**

- දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය විස්තර කරයි.
- රාජ්‍යයේ කාර්ය සහ දේශපාලන අවබෝධයේ වර්ධනයට සාපේක්ෂව විෂය ක්ෂේත්‍රය පුළුල් වන බව සාකච්ඡා කරයි.
- දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයට ඇතුළත් අංග පිළිබඳ බිත්ති පුවත් පතක් නිර්මාණය කරයි.

**හැඳින්වීම :-**

- දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය පිළිබඳ හැදෑරීමේදී පොදුවේ පිළිගත් මතවාදයක් නොමැති බවත් අධ්‍යයනය ක්ෂේත්‍රයේ ප්‍රධාන මාතෘකාව ලෙස තවමත් පිළිගනු ලබන්නේ රාජ්‍ය පිළිබඳව හැදෑරීම බවත් සඳහන් කළ හැකිය. රාජ්‍ය කේන්ද්‍ර කොට ගත් ඒ ආශ්‍රිතව මූලිකාංග අධ්‍යයනය කිරීම දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත් වන නමුත් කලින් කලට විෂය ක්ෂේත්‍රයට අයත් කරුණු වෙනස් වෙමින් පවතින ආකාරය හඳුනාගත හැකිය. දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත් අංග පිළිබඳ පොදුවේ පිළිගත් අර්ථකථනයක් නොමැති අතර ඒ පිළිබඳ මේ දක්වා පොදු එකඟතාවයක්ද ඇති වී නැත. මේ අනුව කාලයත් සමග එකතු වූ නව තේමාවන් ඔස්සේ දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රය වෙනස් වූ ආකාරය වටහා දීමට මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

**විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්**

**2. දේශපාලන විද්‍යාවේ අධ්‍යයන ක්ෂේත්‍රය**

2.1
- දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රය පිළිබඳව පොදුවේ පිළිගත් අර්ථකතනයක් දැක්විය නොහැක. එයට අයත් වන්නේ කුමක්ද? යන්න පිළිබඳව මේ දක්වා පොදු එකගතාවයක්ද ඇති වී නොමැත.
- කලින් කලට විෂය ක්ෂේත්‍රයට අයත් කරුණු වෙනස් වෙමින් පවතී.
- මේ අනුව වර්තමානයේ දේශපාලන විද්‍යාව තුළ අධ්‍යයනය කරන මාතෘකා පහත සඳහන් ආකාරයට දැක්විය හැකිය.

- දේශපාලන දර්ශනය, දේශපාලන චින්තනය, දේශපාලන න්‍යාය හා දේශපාලන මතවාද
- දේශපාලන ආයතන
- රාජ්‍යය හා ආණ්ඩුව
- දේශපාලන බලය

- දේශපාලන ක්‍රියාදාමය
- නීතිය හා අධිකරණය
- තුලනාත්මක ආණ්ඩු ක්‍රමය
- රාජ්‍ය පරිපාලනය
- රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණය
- ගැටුම්, ගැටුම් ප්‍රභවය, කළමනාකරණය හා නිරාකරණය
- අන්තර් ජාතික දේශපාලනය.

( මෙම විෂය කරුණු පිළිබඳ දළ අවබෝධයක් මූලික අවස්ථාවේ දී ලබා දී ඒ ඒ මාතෘකා ආශ්‍රිත පාඨ ග්‍රන්ථ කියවීමට, දත්ත සහ තොරතුරු රැස් කිරීමට නියමිත ව්‍යාපෘතින් කිරීමට ශිෂ්‍යයින්ට මඟ පෙන්විය යුතුය.)

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම

- බිත්ති පුවත්පතක් නිර්මාණය කිරීම
- දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය පිළිබඳ සිසු දැනුම වර්ධනය කිරීම සඳහා කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස බිත්ති පුවත්පතක් නිර්මාණය කිරීම.
- සිසුන් කණ්ඩායම් කර දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළ කරුණු පිළිබඳ අධ්‍යයනයට යොමු කරවන්න.
- සිවිල් ජන ජීවිතය යහපත් කරගැනීම සඳහා දේශපාලන විද්‍යා ක්ෂේත්‍රයේ කරුණු බලපාන ආකාරය පිළිබඳ පැහැදිලි කිරීමට යොමු කරවන්න.
- සෑම කණ්ඩායමක්ම නිම කරන ලද වාර්තා එක්කර බිත්ති පුවත්පත නිර්මාණය කරවන්න.
- මේ සඳහා තොරතුරු ලබාගත් මූලාශ්‍රවල නම් අකාරාදී පිළිවෙලට සඳහන් කිරීමට උපදෙස් දෙන්න.

## මූලාශ්‍රය


1. **ද සොයිසා , එම්. ඕ. ඒ (2003) දේශපාලන විද්‍යාවේ මූලික සිද්ධාන්ත. මහරගම තරංජි ප්‍රින්ට්ස්**
2. **දික්වැල්ල, රංජිත්, රේණුක ප්‍රියන්ත හා හෙට්ටිආරච්චි ශිරාණි, (සංස්කරණ), 2003, ගැටුම් නිරාකරණය න්‍යාය සහ භාවිතය.**
3. **ප්‍රනාන්දු, වින්සන් මර්වින් (2008) හැට වසරක ශ්‍රී ලංකාවේ ආර්ථිකය. කතෘ ප්‍රකාශන**
4. **ලැස්කි, හැරල්ඩ් ජේ. (1948) දේශපාලන ව්‍යාකරණය**
5. **දේශපාලන විද්‍යාවේ මූලිකාංග I (1998 පළමු මුද්‍රණය) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**
6. **Mahajan, V.D (1988) Political Theory (Principle of Political Science) , NEW DELHI S. Chand & Company Ltd**

# රාජ්‍යයේ ස්වභාවය

**නිපුණතාව 03** :- රාජ්‍යයේ ස්වභාවය පිළිබඳව අවබෝධකර ගැනීමට විමර්ශනශීලීව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** :- **කාලච්ඡේද (40)**

3.1 "රාජ්‍ය" සංකල්පය විවරණය කරයි.

3.2 රාජ්‍යයේ ආරම්භය හා විකාශය පිළිබඳ අත්දැකීම් සහිතව නූතන රාජ්‍ය සංකල්ප විමර්ශනය කරයි.

3.3 රාජ්‍ය සම්භවය පිළිබඳ විවිධ න්‍යාය හා විවිධ රාජ්‍ය ආකෘති තුලනාත්මකව විග්‍රහ කරයි.

**ඉගෙනුම් ඵලය** :-

- දේශපාලන විද්‍යාවේ කේන්ද්‍රීය සාධකය රාජ්‍යය බව විස්තර කරයි.
- ජාතික රාජ්‍ය බිහිවීමට තුඩුදුන් හේතු ලියා දක්වයි.
- රාජ්‍යයක මූලික ලක්ෂණ විග්‍රහ කරයි.
- ඒ ඒ යුගවල ක්‍රියාත්මක වූ විවිධ රාජ්‍යයන් පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.
- රාජ්‍ය සම්භවය පිළිබඳ මතවාද විමර්ශනය කරයි.
- රාජ්‍ය ස්වභාවය ඒ ඒ මතවාදයන්ට අනුව විමර්ශනය කරයි.
- රාජ්‍ය හා සමාජය අතර වෙනස පෙන්වා දෙයි.
- රාජ්‍ය සහ අනෙකුත් සමාගම් අතර සමාන අසමානකම් පැහැදිලි කරයි.
- රාජ්‍යය සහ ආණ්ඩුව අතර වෙනස වගු ගත කරයි.

**හැඳින්වීම** :-

දේශපාලන විද්‍යා විෂයයේ කේන්ද්‍රීය තේමාව වන්නේ රාජ්‍යයයි. එබැවින් රාජ්‍යයේ ආරම්භය, එහි විකාශය සහ වර්තමාන තත්ත්වය පිළිබඳව විචාරාත්මක දැනුමක් හා අවබෝධයක් ලබා ගැනීම දේශපාලන විද්‍යාව අධ්‍යයනය කරන්නෙකු විසින් අනිවාර්යයෙන්ම කළ යුත්තකි. රාජ්‍යයේ ආරම්භය හා විකාශය දෙස බැලීමේදී පෙනීයන ලක්ෂණයක් වන්නේ යුගයෙන් යුගයට රාජ්‍යයේ කාර්යභාරය වෙනස්වෙමින් ඉදිරියට ගමන් කර ඇති බවයි. පවතින දේශපාලන, ආර්ථික සහ සමාජීය තත්ත්වයන් අනුව මෙම වෙනස්වීම සිදුව ඇත. රාජ්‍ය ක්‍රමයේ ආරම්භය ලෙස සැලකෙන්නේ ග්‍රීක නාගරික රාජ්‍ය ක්‍රමයයි. ඉන් අනතුරුව රෝම අධිරාජ්‍ය ක්‍රමය, මධ්‍යතන යුගය, වැඩවසම් රාජාණ්ඩු ක්‍රමය හරහා ඉදිරියට ගමන් කළ අතර 17 වන සියවසේ ජාතික රාජ්‍ය වශයෙන් සංවිධානය වන ආකාරය දැකිය හැකිය. ජාතික රාජ්‍ය ගොඩ නැඟී තිබෙන්නේ භූමිය, ජනගහනය, ආණ්ඩුව සහ ස්වාධිපති බලය යන සාධක හතරේ එකතු වෙනි. මීට අමතරව අන්තර ජාතික වශයෙන් පිළිගැනීම තවත් කොන්දේසියක් ලෙස සමහර නූතන දේශපාලන විද්‍යාඥයන් පිළිගෙන ඇත. ජාතික රාජ්‍ය ක්‍රමයේ විකාශය දෙස බැලීමේදී පෙනී යන්නේ ප්‍රථමයෙන් නිර්බාධවාදී රාජ්‍ය ලෙස පටන් ගෙන අනතුරුව සුභ සාධක රාජ්‍ය ලෙස ක්‍රියාත්මක වී මේ වන විට අවම රාජ්‍ය ක්‍රමයට මාරු වී ඇති බවයි. අවම රාජ්‍ය ලෙස සලකන්නේ නිර්බාධවාදය හා සුභසාධකවාදයට අතර මැදි තත්ත්වයක්ය.

රාජ්‍ය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී රාජ්‍ය හා බැඳී පවතින තවත් දේශපාලන සංකල්ප කිහිපයක් හඳුනා ගතහැක. ඒවා නම් ජාතිය, ජාතිකත්වය, ජනවාර්ගිකත්වය, රාජ්‍ය හා සමාජය, රාජ්‍ය හා ආණ්ඩුව සහ රාජ්‍ය සහ අනෙක් සමාජ සංවිධාන යනාදියයි. මෙම සංකල්ප මඟින් විදහා දක්වන තේමාවන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ දී අනිවාර්යයෙන්ම කළ යුත්තකි.

- භූමිය
- ජනගහනය
- ආණ්ඩුව
- ස්වාධිපති බලය

ඉහතින් දක්වන ලද මූලිකාංග අතරින්

- භූමිය හා ජනගහනය රාජ්‍යයෙන් රාජ්‍යයට වෙනස් විය හැක.
- ස්වාධිපති බලය සෑම රාජ්‍යයකටම පොදුවේ හිමි වූවකි.
- ආණ්ඩුව ආකෘති අතින් වෙනස් විය හැකි වූවද සෑම රාජ්‍යයකම පැවැත්ම සඳහා ආණ්ඩුව අත්‍යවශ්‍ය සාධකයක් වේ.
- රාජ්‍යයක් ලෙස යම් දේශපාලන ඒකකයක් හඳුනාගැනීම සම්බන්ධ ජාත්‍යන්තර එකඟතාවක් මොන්ටිවීඩියෝ සම්මුතිය (Montevideo Convention 1933) තුළින් ලැබුණි. එහිදී ජාත්‍යන්තර සමාජය තුළ ඇති සබඳතා හා පිළිගැනීමද රාජ්‍යයක් ලෙස හඳුනා ගැනීමේ මූලිකාංගයක් බවට පත්විය.

## විෂයකරුණු පැහැදිලි කරගැනීම සඳහා අත්වැලක්

### රාජ්‍යයේ ආරම්භය හා විකාශය

- රාජ්‍යයේ ආරම්භය හා විකාශනය සලකා බැලීමේදී ග්‍රීක යුගයෙන් පටන් ගෙන වර්තමාන ජාතික රාජ්‍ය ක්‍රමය දක්වා දිගු විකාශනාත්මක ගමනක රාජ්‍යය ඉදිරියට ගමන් කර ඇත.
- ඒ ඒ යුගවල ක්‍රියාත්මක වූ රාජ්‍ය පහත සඳහන් ආකාරයට හඳුනාගත හැක.

### ග්‍රීක නාගරික රාජ්‍ය ක්‍රමය

- ක්‍රි . පූ . 7වන සියවසේ ග්‍රීසිය තුළ ක්‍රියාත්මක වූ රාජ්‍ය ක්‍රමය නාගරික රාජ්‍ය ක්‍රමය ලෙස හඳුන්වනු ලැබේ.
- භූමි ප්‍රමාණයෙන් අතිශයින්ම කුඩා රාජ්‍ය ක්‍රමයක් වූ අතර ග්‍රීසියේ සෑම ප්‍රධාන නගරයක් පදනම් කරගෙන එක් රාජ්‍යයක් බැගින් පිහිටුවා තිබුණි.
- ග්‍රීක නාගරික රාජ්‍ය ක්‍රමය තුළ සමාජ ක්‍රමය ගොඩ නැගී තිබුණේ ප්‍රධාන සමාජ පන්ති 3 ක් පදනම් කරගෙනය
  - රදලයින්
  - නිදහස් වැසියන්
  - වහලුන්
- නාගරික රාජ්‍ය ක්‍රමය තුළ දේශපාලන බලය හිමිවූයේ රදලයින්ට / වහල් හිමියන්ට පමණි.
- විදේශිකයන්ට, ස්ත්‍රීන්ට, ළමයින්ට හා වහලුන්ට දේශපාලන බලය හිමි නොවීය.
- රදල පන්තිය ප්‍රමාණයෙන් කුඩා එකක් වූ නිසා සියලු දෙනාම දේශපාලන කටයුතු වලට එනම් ව්‍යවස්ථාදායක, විධායක සහ

අධිකරණ කටයුතු වලට සහභාගි වූ අතර එම හේතුවෙන් මෙම ක්‍රමය හඳුන්වනු ලැබුවේ ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ලෙසය.

- මෙහි අනෙක් ලක්ෂණය වූයේ රාජ්‍ය පාලනයේ වැඩ කටයුතු එනම් ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණ කටයුතු කාර්යය වශයෙන් බෙදා වෙන් කොට නොතිබීමයි.

**වැඩවසම් රාජ්‍ය ක්‍රමය**

- රෝම අධිරාජ්‍යය බිඳ වැටීමෙන් පසුව ආරම්භ වන පාප් අධිරාජ්‍යය තුළ ක්‍රියාත්මක වූ ක්‍රමය වැඩවසම් රාජ්‍යය ක්‍රමය ලෙස හඳුන්වා දිය හැක.
- මෙම ක්‍රමයේ මූලික ලක්‍ෂණය වූයේ රාජාණ්ඩු පාලන ක්‍රමයක් ක්‍රියාත්මක වීමයි.
- මේ කිසිදු රාජ්‍යයක් ශක්තිමත් මධ්‍ය බල අධිකාරයක් යටතේ ගොඩනැගී නොතිබුණි.
- ප්‍රාදේශීය වශයෙන් බලය විසිරී පැවති අතර ප්‍රාදේශීය රදලයින් ප්‍රාදේශීය මට්ටමින් බලය ක්‍රියාත්මක කරනු ලැබීය.
- රාජ්‍ය පාලකයින් පත් කිරීම, ඉවත් කිරීම, පිළිබඳව අවසාන බලධාරිත්වය දැරුවේ පාප් වහන්සේය.
- ආර්ථික ක්‍රමය කෘෂිකර්මාන්තය මත පදනම් විය.

**ජාතික රාජ්‍ය ක්‍රමය**

- 16 වන සියවස පමණ කාලයේ මධ්‍යම යුරෝපය තුළ ජාතික රාජ්‍ය ක්‍රමයේ ආරම්භය සිදු විය.
- මේ කාලය තුළ තමන්ගේම පාලන ප්‍රදේශ, ස්වාධීන පරිපාලන ක්‍රමය, ජාතික හමුදාවක්, ගොඩනගා ගන්නා අතර එය තහවුරු කිරීමට ස්වාධිපති බලය පිළිබඳ මතවාදය වර්ධනය විය.
- ජාතික රාජ්‍ය ක්‍රමය බිහිවීම කෙරෙහි බලපෑ හේතු සාධක කිහිපයකි.
    - පාප් අධිරාජ්‍යය බිඳවැටීම.
    - වැඩවසම් ක්‍රමය බිඳවැටීම
    - ධනවාදය ආරම්භවීම
    - ක්‍රිස්තියානි ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය
    - කාර්මික විප්ලවය
    - පුනර්ජීවන විප්ලවය
- මේ අනුව බිහිවන ජාතික රාජ්‍ය ගොඩ නැගෙන්නේ එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන සංකල්පය පදනම් කරගෙනය.
- භූමිය, ජනගහනය, ස්වාධිපති බලය හා ආණ්ඩුව යන සාධක හතර පදනම් කොට ගෙන ගොඩ නැගී ඇත.
- ජාතික රාජ්‍ය ක්‍රමයේ පදනමට අවශ්‍ය දේශපාලන මතවාද බොඩෑන්, මැකියාවේලි සහ හොබ්ස් විසින් සපයනු ලැබූ අතර නෛතික පදනම 1648 වෙස්ට්ෆෝලියා සාම සම්මුතියෙන් සපයන ලදි.
- ආරම්භක අවස්ථාවේදී සෑම ජාතික රාජ්‍ය ක්‍රමයකම පාලන ක්‍රමය ගොඩ නැගී තිබුණේ රාජාණ්ඩුවාදී පාලන ක්‍රමයක් පදනම් කරගෙනය.
- වර්තමානය දක්වා ජාතික රාජ්‍ය ක්‍රමය විකාශය වීමේදී රාජාණ්ඩුවාදී පාලන ක්‍රම, ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම දක්වා පරිවර්තනය වී ඇති අතර ජාතික රාජ්‍යයේ ආර්ථික මුහුණුවර කාලයත් සමග වෙනස්වීම් වලට භාජනය වී ඇත.
- එසේ සිදුවූ වෙනස් වීම් නිසා රාජ්‍යයේ ආර්ථික මුහුණුවර තුනක් හඳුනා ගත හැකිවීම

- නිර්බාධවාදී රාජ්‍යය
- සුභසාධක රාජ්‍යය
- අවම රාජ්‍යය

**නිර්බාධවාදී රාජ්‍යය**

නිර්බාධවාදී රාජ්‍ය ක්‍රමයේ මූලික ලක්ෂණ

- පෞද්ගලික වාදය
- රාජ්‍යය ආර්ථික කටයුතුවලින් මුළුමනින්ම ඈත්වීම.
- ආර්ථික කටයුතු මෙහෙයවීම පුද්ගලයා විසින් කළ යුතු වීම.
- වෙළඳපොළ බලවේග මගින් ආර්ථිකය හැසිරවීම.
- රාජ්‍යයේ කාර්යභාරය වන්නේ මිනිසාට තම පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීමට අවශ්‍ය සමාජ කොන්දේසි නිර්මාණය කොට පවත්වාගෙන යාමය.
- රාජ්‍යයේ කාර්යභාරය වන්නේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමයි.

**සුභසාධක රාජ්‍යය**

- 1928 - 29 තුළ ඇති වූ ලෝක ආර්ථික අවපාතයෙන් පසු නිර්බාධවාදී රාජ්‍ය ක්‍රමය සුභ සාධක රාජ්‍ය ක්‍රමයට පරිවර්තනය වීම දැකිය හැකිය. II ලෝක යුද්ධයෙන් පසු සුභ සාධක රාජ්‍ය ක්‍රමය ශක්තිමත් විය.
- ජෝන් මේනාඩ් කෙන්ස්ගේ ආර්ථික දර්ශනය තුළින් (කෙන්සියානු දර්ශනය) සුභ සාධක රාජ්‍ය සංකල්පයට න්‍යායික පසුබිමක් ලැබුණි.
- මෙම පරිවර්තනය කෙරෙහි බලපෑ හේතු සාධක කිහිපයකි.

    1. නිර්බාධවාදී රාජ්‍යය ක්‍රමය යටතේ සමාජ බහුතරය අවම වරප්‍රසාද සහිත අය බවට පත්වීම සහ ඔවුන් වෙනුවෙන් රාජ්‍ය මැදිහත් විය යුතුය යන සමාජ ඉල්ලීම.
    2. ලෝක යුද්ධ දෙකක් මගින් සිදුවන විනාශය සහ ඒවා ප්‍රතිසංස්කරණය කිරීමට රාජ්‍යය සක්‍රීය ලෙස මැදිහත් විය යුතුය යන ඉල්ලීම.
    3. පෞද්ගලික අංශය අඩු අවධානයක් දක්වන හෝ මුළුමනින්ම අවධානයක් නොදක්වන ක්ෂේත්‍රයන්හි වර්ධනය සඳහා රාජ්‍යය සෘජුව මැදිහත් වීම.
    4. විවිධ සමාජ සුභ සාධක හා සංරක්ෂණ කාර්යයන් ක්‍රියාවට නැංවීම.
    5. සමාන පුරවැසියන් හා සමාන ඉඩ ප්‍රස්තාවන් යන සිද්ධාන්තය පදනම් කරගෙන රාජ්‍ය විසින් දේශපාලන ආර්ථික හා සමාජ කාර්යයන් කළමනාකරණය කිරීම.
    6. අවසාන වශයෙන් මෙහි හරය වන්නේ ආර්ථික හා සමාජ කටයුතු කළමනාකරණය සඳහා රාජ්‍ය සෘජුව මැදිහත් වෙමින් සමාජයේ පීඩාවට පත් කොටස්වල භෞතික වර්ධනය උදෙසා ක්‍රියා කිරීමය

**අවම රාජ්‍යය**

- 1970 ගණන්වලින් පසු ජාතික රාජ්‍ය ක්‍රමය ආශ්‍රිතව වර්ධනය වන නව රාජ්‍ය සංකල්පය අවම රාජ්‍ය වශයෙන් හඳුන්වනු ලැබේ.
- අවම රාජ්‍ය යනුවෙන් අදහස් කරන්නේ ආර්ථික කටයුතුවලින් රාජ්‍ය හැකිතාක් දුරට ඉවත් වීමය.

- මිල්ටන් ෆ්‍රීඩ්මාන්ගේ ධනවාදය හා නිදහස යන ආර්ථික දර්ශනය අවම රාජ්‍ය සංකල්පයට න්‍යායික පසුබිම සැපයීම.
- නමුත් නිර්බාධවාදී රාජ්‍ය ක්‍රමය තුළ සිදුවූවාක් මෙන් රාජ්‍ය මුළුමනින්ම ආර්ථික කටයුතුවලින් ඈත්වීමක් සිදු නොවේ.
- සත්‍ය වශයෙන් දැකිය හැකි වන්නේ නිර්බාධවාදී රාජ්‍යයට වඩා තරමක් ඉදිරියට ගිය සුභසාධක රාජ්‍යයෙන් පසුපසට පැමිණි අතරමැදි තත්ත්වයකි.
- මේ අනුව සමාජ කටයුතු වලදී එහි අවමය කළමනාකරණය කිරීම රාජ්‍ය විසින් ද ආර්ථික කටයුතු කළමනාකරණය කිරීම පෞද්ගලික අංශය විසින් ද කළ යුතු බව අවම රාජ්‍ය සංකල්පයෙන් අවධාරණය කෙරේ.

**නව රාජ්‍ය**

- නව රාජ්‍යයන් යනුවෙන් හඳුන්වනු ලබන්නේ II ලෝක යුද්ධයෙන් පසු යටත් විජිත වලින් නිදහස ලැබූ ආසියා, අප්‍රිකා, ලතින් ඇමරිකානු ප්‍රදේශවල බිහිවූ රාජ්‍යයන්ය.
- මේ සෑම රාජ්‍යයක් ආශ්‍රිතවම පොදු ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය.
- එනම් - ආර්ථික වශයෙන් - අසංවර්ධිත වීම
  දේශපාලන වශයෙන් - නවීකරණය නොවීම
  සමාජීය වශයෙන් - බහුවිධ ස්වරූපයක් ගැනීම
- මෙම රාජ්‍යයන් තුන්වන ලෝකයේ රාජ්‍ය ලෙසද හඳුන්වනු ලැබේ.
- අතීතයේ සිට මේ දක්වා මෙම රාජ්‍ය මුහුණ දී ඇති ගැටලු වන්නේ
  - ජාතිය ගොඩනැංවීම සහ ආර්ථික සංවර්ධනය අයත් කර ගැනීමය.

**රාජ්‍ය සම්භවය පිළිබඳ මතවාද**

★ දේවවරම්වාදය

- මෙහි හරය වන්නේ රාජ්‍ය දෙවියන් වහන්සේ විසින් නිර්මාණය කළ බවයි.
- දෙවියන් වහන්සේ විසින් පාලකයා පත් කොට ඔහුට පාලන බලතල පවරා ඇත.
- පාලකයා එම බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් දෙවියන් වහන්සේට වගකිව යුතුය.
- දේවවරම්වාදයේ විශේෂ ලක්ෂණය වන්නේ එය ප්‍රජාතන්ත්‍රවාදයට මුළුමනින් පටහැනි සිද්ධාන්තයක් වීමය.
- එමගින් අයහපත්, ආඥාදායක, රාජාණ්ඩුවාදී පාලන ක්‍රම බිහිවීම වැළැක්විය හැකි නොවේ.

★ සමාජ සම්මුතිවාදය

- සමාජ සම්මුති වාදය නව යුගය තුළ රාජ්‍ය පිළිබඳ නව මතවාදයක් ලෙස හැඳින්විය හැක.
- මෙම මතවාද ඉදිරිපත් කිරීමට මුල්වූයේ එංගලන්ත ජාතික තොමස් හොබ්ස් , ජෝන් ලොක් හා ප්‍රංශ ජාතික ජීන් ජැක්වින් රූසෝය.
- මොවුන් තිදෙනා දරණ පොදු මතය වන්නේ රාජ්‍ය වූ කලි මිනිසුන් අතර ඇතිකරගත් සමාජ සම්මුතියක ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය බිහි වූ බවයි.

- නමුත් සම්මුතියෙන් ඇති කර ගත් රාජ්‍ය හොබ්ස් දැක් වූ ආකාරයට අසහාය බලැති රාජාණ්ඩු ක්‍රමයක් වේ.
- ජෝන් ලොක් විසින් තම සමාජ සම්මුතිවාදී අදහස තුළින් පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය අදහස ඉදිරිපත් කළේය.
- රූසෝ දක්වන ආකාරයට මහජන ස්වාධිපත්‍ය පදනම් කරගත් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් වේ.
- මෙම මතවාදයන් මගින් එතෙක් කල් පිළිගෙන තිබූ දේවවරම්වාදය ප්‍රතික්ෂේප කරමින් රාජ්‍යයට ජනතා පදනමක් සපයන ආකාරය හඳුනා ගත හැක.
- යුරෝපා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය වර්ධනයට මෙම මතවාදය මඟින් විශාල මෙහෙයක් සිදු වූ බව පොදුවේ පිළිගැනේ.

★ විකාශනාත්මකවාදය

- සමාජ විකාශනයේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය බිහි වූ බව විකාශනාත්මකවාදය මගින් කියැවේ.
- රාජ්‍ය බිහිවීම සම්බන්ධයෙන් මිනිසුන් එකට එක්තැන් වීම තීරණාත්මක සාධකයක් වූ බව විකාශනාත්මකවාදයෙන් දැක්වේ.
- මිනිසුන් එකට එක්තැන් වීම කෙරෙහි බලපෑ සමාජ බන්ධන ලෙස විකාශනාත්මකවාදීන් දක්වන්නේ ඥාති සම්බන්ධතා, ආගම, පොදු වාසස්ථානයක පදිංචි වීම, ආරක්ෂාව, ආර්ථික අවශ්‍යතා සහ දේශපාලන හැඟීම් යනාදියයි.
- මෙයාකාරයට ආරම්භ වූ රාජ්‍ය විකාශය වූයේ ගෝත්‍ර රාජ්‍ය, පෙරදිග රාජ්‍ය, ග්‍රීක නාගරික රාජ්‍ය, රෝම අධිරාජ්‍ය, වැඩවසම් රාජ්‍ය සහ නූතන ජාතික රාජ්‍ය ක්‍රම හරහාය.
- රාජ්‍යයේ පැවැත්ම සදාතනික දෙයක් ලෙස විකාශනාත්මකවාදීන් දකින අතර මිහිපිට මිනිසුන් වාසය කරන තෙක් රාජ්‍ය ද නොනැසී පවතීය යන්න විකාශනාත්මකවාදයේ හරය වේ.

★ ලිබරල්වාදය

- ලිබරල්වාදය හා විකාශනාත්මකවාදය අතර එතරම් පැහැදිලි වෙනසක් හඳුනාගත නොහැක.
- ලිබරල්වාදීන් ප්‍රකාශකරන්නේ රාජ්‍ය වූකලි මිනිසුන් විසින් තම පොදු යහපත උදෙසා පිහිටුවාගත් පොදු සංවිධානයක් ලෙසය.
- මේ අනුව මිනිසාගේ භෞතික සංවර්ධනය සඳහා කටයුතු කිරීම රාජ්‍යයේ ප්‍රධාන කාර්යය ලෙස ලිබරල්වාදීහු හඳුනා ගනිති.
- විවිධත්වය සහිත මිනිසුන්ගෙන් යුත් සමාජයක පොදු යහපත ගොඩනැගීමට නම් රාජ්‍ය වැනි පොදු සංවිධානයකින් ඔවුන් පාලනය කිරීම අවශ්‍ය වන බව ලිබරල්වාදීන් කියා සිටියි.

★ රාජ්‍ය පිළිබඳ පැසිස්ට්වාදී මතය

- පැසිස්ට් රාජ්‍ය ආරම්භය පිළිබඳ කථා කරන මතවාදයක් නොව රාජ්‍යයේ ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය පිළිබඳ අදහස් ඉදිරිපත් කරන්නා වූ මතවාදයක් ලෙස හැඳින්විය හැකිය.
- උත්තරීතර බලයක් සහිත ආඥාදායක රාජ්‍ය ක්‍රමයක් පැසිස්ට්වාදීන්ගේ ආදර්ශය වේ.
- මෙම රාජ්‍ය තුළ මිනිසා රාජ්‍යයේ සේවකයකු මිස රාජ්‍යය මිනිසාගේ සේවකයකු නොවේ.

★ රාජ්‍ය පිළිබඳ සමාජවාදී මතය

- සමාජවාදී මතය දකින්නේ රාජ්‍ය පංති ආයුධයක් ලෙසය.
- ඇති - නැති ලෙස සමාජය බෙදී ගිය පසු ඇති පන්තියේ ඕනෑ එපාකම් හා ආශාවන් ආරක්ෂා කොට පවත්වා ගෙන යාම සඳහාත් නැති පන්තිය පාලනය කරමින් සූරා කෑම සඳහාත් රාජ්‍ය නැමති උපකරණය ඇති පන්තිය විසින් පිහිටුවාගත් බව සමාජවාදීන්ගේ අදහස වේ.
- සමාජවාදින් රාජ්‍ය සදාකාලික දෙයක් ලෙස නොසලකන අතර රාජ්‍යයේ බිහිවීමට පදනම වූ පෞද්ගලික දේපළ ක්‍රමය අහෝසි කිරීමෙන් රාජ්‍ය ද අහෝසි වන බව කියා සිටී.
- සමාජවාදීන්ගේ මතයට අනුව මිනිසාට සැබෑ විමුක්තිය උදාවන්නේ රාජ්‍ය පෙරළා දමා ගොඩනගන කොමියුනිස්ට් සමාජ ක්‍රමය තුළය.

★ රාජ්‍ය, ජාතිය, ජනවාර්ගිකත්වය හා ජාතිකත්වය

- රාජ්‍ය සහ ජාතිය අතරත්, ජාතිය හා ජාතිකත්වය අතරත්, ජාතිය හා ජනවාර්ගික කණ්ඩායම් අතරත් පවත්නා සම්බන්ධතාව අධ්‍යයනය කිරීම මෙම මාතෘකාවෙන් අදහස් වේ.
- රාජ්‍ය හා ජාතිය අතර පවතින්නේ ඉතාමත් සමීප සම්බන්ධතාවයක්ය.
- බොහෝ රාජ්‍යයන්ගේ නිළ නාමය ගොඩනැගී තිබෙන්නේ ඒ රාජ්‍ය තුල ජීවත්වන ජාතිය පදනම් කොට ගෙනය.
- රාජ්‍ය තුළ ජීවත්වන සියළුදෙනාම එම රටේ පුරවැසියන් ලෙස සලකන අතර එම පුරවැසියන් ජාතියක් ලෙස සංවිධානය වී රාජ්‍ය පිළිබඳ ගොඩනගා ගන්නා හැඟීම් මාලාව ජාතිකත්වය යන්නෙන් අදහස් වේ.
- ජනවාර්ගිකත්වය යන්නෙන් අදහස් කරන්නේ රාජ්‍ය තුළ ජීවත් විය හැකි වාර්ගික ජන කොටස්ය.
- වාර්ගික ජන කොටසකට තමන්ට වෙන් වූ භාෂාවක්, ආගමක්, සංස්කෘතියක්, ඓතිහාසික උරුමයන් සමූහයක් සහ අනාගත අපේක්ෂාවන් තිබිය හැක.
- රාජ්‍යයක් තුළ අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට වෙනස් ජනවාර්ගික කණ්ඩායම් කිහිපයක් ජීවත් විය හැකිය.
- එම ජනවාර්ගික කණ්ඩායම් පටු වාර්ගිකත්වයෙන් මිදී ජාතියක් ලෙස සිතන්නේ නම්, කටයුතු කරන්නේනම් එහි දී වාර්ගිකත්වය යටපත් වී පොදු ජාතිකත්වය ඉදිරියට පැමිණෙන්නේය.

★ රාජ්‍ය සහ සමාජය

- යම් භූමි ප්‍රදේශයක් තුළ ජීවත්වන ජනතාව විසින් තමන්ගේ ඕනෑ එපාකම් සපුරා ගැනීම සඳහා පිහිටුවා ගෙන ඇති සමස්ත සංවිධාන ජාලාවේ එකතුවකි.
- මේ අනුව රාජ්‍යය ද සමාජ සංවිධානයක් වේ.
- සමාජයේ දේශපාලන අවශ්‍යතා ඉටු කර ගැනීම පිණිස සමාජය විසින් රාජ්‍ය පිහිටුවා ගෙන ඇත.
- නමුත් රාජ්‍ය බිහි වූ පසුව සමාජය රාජ්‍යයට යටත් වූ තත්ත්වයක් දැකිය හැකිය.
- රාජ්‍ය බලයට සමාජය යටත් වන්නේ විවිධත්වය පදනම් කර ගත් සමාජය අභිවෘද්ධිය කරා ඉදිරියට මෙහෙයවීමේ වගකීම රාජ්‍යයට පැවරී ඇති නිසාය.

- ★ රාජ්‍ය සහ ආණ්ඩුව
    - ආණ්ඩුව රාජ්‍ය ගොඩනැගී ඇති සංයුතික සාධක හතරින් එකකි.
    - න්‍යායාත්මකව ගත්විට ආණ්ඩුව රාජ්‍යයේ නියෝජිතයා වුවද ප්‍රායෝගිකව ගත් විට දැකිය හැකි තත්ත්වය වන්නේ ආණ්ඩුව රාජ්‍යයේ ස්වාමියා වීමය.
    - ප්‍රායෝගික ක්ෂේත්‍රයේ සැබෑ වශයෙන්ම සිදු වන්නේ රාජ්‍යයට වුවමනා දේ ආණ්ඩුව විසින් කිරීම නොව ආණ්ඩුවට අවශ්‍ය දේ රාජ්‍යයේ නාමයෙන් කර ගැනීමය.

- ★ රාජ්‍ය සහ සමාගම්
    - අනෙකුත් සමාජ සංවිධාන යනුවෙන් අදහස් කරන්නේ රාජ්‍ය තුළ ජීවත්වන මිනිසුන් විසින් තමන්ගේ පෞද්ගලික අවශ්‍යතා සපුරා ගැනීම පිණිස ගොඩනගා ඇති සංවිධානයන්ය.
    - සමාජ සංවිධානවල ක්‍රියාකාරිත්වය තීරණය වන්නේ රාජ්‍යය විසින් ඒවාට ක්‍රියාත්මක වීමට ඉඩ දී ඇති ප්‍රමාණය අනුවය.
    - රාජ්‍යයේ කැමැත්තට යටත්ව සමාජ සංවිධාන ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍යයේ කැමැත්තට පරිබාහිරව ක්‍රියාත්මක වන සංවිධාන දියකර හරිනු ලැබේ.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම

- ප්‍රශ්නෝත්තර සංග්‍රහයක් සකස් කිරීම.
- පන්තියේ සිසුන් කණ්ඩායම්කර පහත සඳහන් මාතෘකා යටතේ ප්‍රශ්න සකස් කිරිමට උපදෙස් දෙන්න.
    - නාගරික රාජ්‍ය ක්‍රමය
    - වැඩවසම් රාජ්‍ය ක්‍රමය
    - ජාතික රාජ්‍ය ක්‍රමය
    - නව රාජ්‍ය ක්‍රමය
- මාතෘකා ඔස්සේ කණ්ඩායමක් කෙටි ප්‍රශ්න 10 බැගින් සකස් කරන්න.
- ප්‍රශ්නාවලිය සකස් කිරීම සඳහා අවශ්‍ය මූලාශ්‍ර පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
- මාතෘකාවට අදාළ පරිදි ප්‍රශ්න සකස් කිරිම පිළිබඳ අවධානය යොමු කරන්න.

## මූලාශ්‍රය


1. ජෙනිස් , අයිවර් , (2005 ) , නීතිය හා ආණ්ඩුක්‍රමය, අධ්‍යාපන ප්‍රකාශ දෙපාර්තමේන්තුව
2. සොයිසා , එම්. ඕ.ඒ.ද. (2003) , දේශපාලන විද්‍යාවේ මූලික සිද්ධාන්ත - කතෘ ප්‍රකාශන
3. විතානවසම් , අතුල (2007) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය සහ දේශපාලනය - කතෘ ප්‍රකාශන
4. Heywood, Andrew, (1994), **Political Ideas and Concepts (An introduction),** London; Mac Millan
5. Mahajan, V.D, (2008), **Political Theory (Principles of Political Science),** New Delhi; S.Chand and Company.

# ආණ්ඩුවේ ස්වභාවය, ආණ්ඩු ක්‍රම ආකෘති සහ කාර්යයන්

**නිපුණතාව 04:-** ආණ්ඩුවේ ස්වභාවය, ආණ්ඩු ක්‍රම ආකෘති සහ කාර්යභාරය පිළිබඳ පවත්නා පුළුල් අවබෝධය ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :-** **කාලච්ඡේද (75)**

4.1 "ආණ්ඩුව" පිළිබඳ සංකල්පය අර්ථකථනය කරයි.

4.2 ආණ්ඩුවේ බලය හා එම බලය යොදන ආකාරය.

4.3 ආණ්ඩුක්‍රම වර්ග හඳුනා ගනිමින් ඒවායේ ව්‍යුහය හා කාර්යභාරය පිළිබඳ තීක්ෂණ දෘෂ්ටිය ප්‍රදර්ශනය කරයි.

**ඉගෙනුම් ඵලය :-**

- ආණ්ඩුව පිළිබඳ විවිධ අර්ථකථන ගොනු කරයි.
- ආණ්ඩුව සමාජ සංවිධානයක් ලෙස අනෙක් සමාජ සංවිධාන වලින් වෙනස් වන ආකාරය ගවේෂණය කරයි.
- ස්වාධිපති බලය ක්‍රියාත්මක කරන්නා ලෙස එය ක්‍රියාවට නංවන විධික්‍රම නම් කරයි.
- අණ්ඩුක්‍රම ආකෘති, දේශපාලන මතවාද අනුව බලය බෙදීම අනුව හා විධායක බලය ක්‍රියාත්මක කරන ආකාරය අනුව වෙනස්වන අයුරු වගුගත කරයි.
- ආණ්ඩුවේ කාර්යය විශ්ලේෂණය කරයි.

**හැඳින්වීම :-**

දේශපාලන වශයෙන් සංවිධානය වූ මිනිස් සමාජයක පාලන කටයුතු ක්‍රියාත්මක කරන දේශපාලන ආයතනය "ආණ්ඩුව" ලෙස හැඳින්වෙන අතර මෙම ඒකකයෙන් ඒ පිළිබඳ අධ්‍යයනය කිරීම අපේක්ෂා කෙරේ. ආණ්ඩුව සමාජ සංවිධාන අතරින් සුවිශේෂ සමාජ සංවිධානයක් වේ. එයට හේතුව දඬුවම් කිරීමේ තර්ජනය සහිතව අධිකාරී බලය ක්‍රියාවට නංවමින් මිනිස් සමාජය පාලනය කිරීමට ඇති හැකියාවයි. මෙවැනි අධිකාරී බලයක් ක්‍රියාවට නැංවීමට කිසිම ආයතනයකට හැකියාවක් නොමැත.

මෙම ඒකකය මඟින් අපේක්ෂා කරන්නේ ඉහත දැක්වූ ආකාරයට ආණ්ඩුව සුවිශේෂී සමාජ සංවිධානයක් වන්නේ ඇයිද? යන්න හඳුනා ගැනීම, විවිධ ආණ්ඩුක්‍රම අකෘතින්, ආණ්ඩුක්‍රම ව්‍යුහයන් හා කාර්යයන් හඳුනා ගැනීම යනාදිය ගවේෂණය කිරීමයි.

**විෂයකරුණු පැහැදිලි කරගැනීම සඳහා අත්වැලක්**

**ආණ්ඩුව**

- ආණ්ඩුව හඳුනා ගැනීම
- ආණ්ඩුව සම්බන්ධයෙන් විවිධ අර්ථකථන ඉදිරිපත් වී ඇත.
- " මිනිස් සමාජයක කාර්යය මෙහෙයවීමේ අධිකාරී බලය සහිත ආයතනය ලෙස"
- " මිනිස් සමාජය පාලනය කරන ආයතනය ලෙස"
- " රාජ්‍ය පාලනය කරන්නා වූ පුද්ගල කණ්ඩායම"
- " රාජ්‍ය හෝ මිනිස් සමාජය පාලනය කරනු ලබන්නා වූ ක්‍රම"

මෙයට අමතරව විවිධ රාජ්‍ය ආකෘතීන් අවබෝධ කර ගැනිමේදී රාජ්‍ය පිළිබඳ හැදෑරීම අනිවාර්යයෙන් කළ යුත්තක් වේ. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතිය,

පැසිස්ට් රාජ්‍ය ආකෘතිය සහ සමාජවාදී රාජ්‍ය ආකෘතිය හඳුනා ගැනීම ද විෂය අධ්‍යයනය කිරීමේ දී කළ යුතුය.

- **රාජ්‍ය හඳුනා ගැනීම**
  - ''රාජ්‍ය'' සමාජ සංවිධාන අතරින් උත්තරීතර ම සමාජ සංවිධානය වේ.
  - රාජ්‍යයේ ආරම්භය කවදා කොතැනකදී සිදුවූවා දැයි යන්න නිශ්චිත වශයෙන් කිව නොහැක.
  - රාජ්‍යයක මූලිකාංග සහිත රාජ්‍ය ක්‍රමයක් ඉතිහාසය තුළ දැකිය හැකි වන්නේ පැරණි ග්‍රීසිය තුළ ක්‍රියාත්මක වූ නාගරික රාජ්‍ය ක්‍රමය ආශ්‍රිතවය.
  - ඉන් අනතුරුව වර්ධනය වන රාජ්‍ය ක්‍රමය නූතන ජාතික රාජ්‍ය ක්‍රමය දක්වා විකාශය වී ඇත.
  - දේශපාලන විද්‍යාව තුළ රාජ්‍යයක් ලෙස හඳුනා ගන්නේ පහත දැක්වෙන මූලිකාංග හතරින් සමන්විත සංවිධානයකි.
  - මේ අනුව ස්වාධිපති බලය ක්‍රියාවට නංවන ඒජන්තවරයා ලෙස ආණ්ඩුව විසින් එම බලය පොලීසිය, සන්නද්ධ සේවාවන් හා නිලබල ක්‍රමය හරහා ක්‍රියාවට නංවනු ලැබේ.
  - ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදී වූවද, ඒකාධිපති වූවද, සෑම ආණ්ඩුවක්ම මුහුණ දෙන පොදු ගැටළුවක් වන්නේ ආණ්ඩුවේ නීතිවලට ජනතාව අවනත කරගන්නේ හා බැඳ තබා ගන්නේ කෙසේද යන්නයි.
  - ආණ්ඩුව මෙය ක්‍රියාවට නංවන්නේ සහයෝගයෙන්, තර්ජනය කිරීමෙන් සහ වාරණ ක්‍රියාවට නැංවීමෙනි.
  - ආණ්ඩුවට යෙදිය හැකි වාරණ භෞතික, ආර්ථික, මානසික සහ හිංසාකාරී වශයෙන් විවිධ වේ.

    නිදසුන්:- කෙනෙකුට යම් ව්‍යාපාරයක හෝ වෘත්තියක යෙදීමට අවශ්‍ය බලපත්‍ර නොදී සිටීමේ අයිතිය ආණ්ඩුවට ඇත.
    - ඡන්දය දීමේ අයිතිය අහෝසි කිරීමේ බලය ඇත.
    - රාජ්‍ය තනතුරු දීම වැලැක්වීම
    - මූල්‍ය ආධාර අත්හිටුවීම
    - පාඨශාලාවකින් හෝ විශ්ව විද්‍යාලයකින් පන්නා දැමීම.
    - අවසාන වශයෙන් රටින් පිටුවහල් කිරීමේ අයිතිය ඇත.
  - ස්වාධිපති බලය ක්‍රියාත්මක කිරීමේ නීත්‍යානුකූල හිමිකරුවා ලෙස මේ සෑම වාරණයක්ම අවශ්‍ය අවස්ථාවලදී ක්‍රියාවට නැංවීමට ආණ්ඩුවට හැකියාව ඇත.
  - මෙමගින් ආණ්ඩුව ජනතාව බලයට යටත් කර ගැනීමට පොළඹවා ලීම සඳහා උදාහරණ සපයනු ලැබීම.

    උදා:-
    - නීති කඩකරන්නන්ට මුහුණ දීමට සිදුවන වාරණ මොනවාදැයි පෙන්වා දීම.
    - එසේ උදාහරණ සැපයීම මගින් නීතිවලට අවනත වීම හෝ කඩ කිරීම වලක්වා ගැනීමට ක්‍රියාකරනු ලැබීම.
  - නමුත් ඉහත දැක්වූ වාරණ හරහාම ආණ්ඩු නීති ක්‍රියාවට නැංවීමට උත්සාහ නොගනී.
  - සමහර විට ආණ්ඩුව ජනතාවගේ ස්වේච්ඡාත්මක කැමැත්ත මත නීතිවලට අවනත කර ගැනීමට ද උත්සාහ ගනී.
  - මෙම ස්වේච්ඡාත්මක කැමැත්ත ලබා ගැනීම කරනු ලබන්නේ ආණ්ඩුව හා ජනතාව අතර ඇති කර ගන්නා එකඟතාවන් මතයි.

- ★ බලය යෙදීමේ උපකරණ
    - පොලීසිය
    - සිවිල් සේවය

- **පොලීසිය**
    - අණ්ඩුව විසින් බලය ක්‍රියාවට නැංවීමට යොදා ගන්නා හස්තය වන්නේ පොලිසියයි.
    - පොලීසියට පැවරී ඇති කාර්යය වන්නේ නීතිය හා සාමය රැකීමත්, නීති කඩකරන්නන් නීතියේ රැහැනට කොටු කර අධිකරණ ක්‍රියා මාර්ග හරහා නියමිත දඬුවම් ලබා දීමත් ය.
    (මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ පොලීසිය සංවිධානය කර ඇති ආකාරය, පොලීසියට බලය පැවරී ඇති අණ පනත්, පොලීසිය බලය ක්‍රියාවට නංවන ආකාරය ගුරුවරයා විසින් පන්ති කාමරය තුළ ඉගැන්විය යුතුය.)
- **සිවිල් සේවය**
    - ආණ්ඩුවේ ප්‍රතිපත්ති හා තීරණ ජනතාව වෙත ගෙන යන හස්තය නිලබල ක්‍රමය හෙවත් නිලබල යාන්ත්‍රණය ලෙස හැඳින්වේ.
    - ශ්‍රී ලංකාව තුළ සිවිල් සේවය සංවිධානය කර ඇති ආකාරය, සිවිල් සේවයේ කාර්යභාරය යනාදිය ගුරුවරයා විසින් පන්ති කාමරය තුළ ඉගැන්විය යුතුය.

- ආණ්ඩුවේ බලය සංවරණය කිරීමේ මාර්ග
    - ආණ්ඩුව කුමන ස්වරූපයක් ගත්ත ද එහි බලය සංවරණය නොකළහොත් සහ එම බලය තනි පුද්ගලයෙකු අත ඒකරාශි වුවහොත් අනිවාර්යයෙන් ඒක තන්ත්‍ර, හිතුවක්කාරී පාලනයක් ඇතිවීම වැලැක්විය නොහැක.
    - ඇක්ටන් සාමිවරයාගේ නිදහස ආරක්ෂා කිරීම සඳහාත් ආණ්ඩුව හිතුවක්කාරී වීම වැලැක්වීම සඳහාත් ආණ්ඩුවේ බලය සංවරණය කිරීම අනිවාර්යයෙන්ම කළ යුතු වේ.
    - ආණ්ඩුවේ බලය සංවරණය කිරීමට යොදා ගත හැකි උපක්‍රම දෙකකි.
        - බලතල බෙදීම
        - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ව්‍යවස්ථානුකූල වාදය

    - බලතල බෙදීම දෙයාකාරයකට කළ හැක.
        - ප්‍රාදේශීය වශයෙන් බලතල බෙදීම
        - කාර්යාත්මක ලෙස බලතල බෙදීම
    - ප්‍රාදේශීය වශයෙන් බලතල බෙදීමේදී රාජ්‍යය දේශපාලන ඒකක කිහිපයකට බෙදමින් සෑම ඒකකයකටම ආණ්ඩුවක් සහිතව පවරාදී කාර්යයන් ක්‍රියාවට නැංවීමේ වගකීම පවරනු ලැබීම.
    - කාර්යාත්මක වශයෙන් බලතල බෙදීම කරනු ලබන්නේ ආණ්ඩුවේ කාර්යයන් බෙදා දැක්වීමය.
    - මෙම ක්‍රමයේ මූලික වාසි තුනක් හඳුනා ගත හැක.
        - බලතල එක් පුද්ගලයෙකු හෝ ආයතනයක් අත ඒකරාශි වීම වලක්වාලීමෙන් ඇති වන වාසි
        - විශේෂිකරණය කිරීම තුළින් ලබා ගත හැකි වාසි ආණ්ඩුවේ බලතල කාර්යාත්මක වශයෙන් බෙදීම යනුවෙන් අදහස් කරන්නේ විධායක, ව්‍යවස්ථාදායක, අධිකරණ යන ආයතන අතර බෙදා හැරීමය.
    (ආණ්ඩුව හිතුවක්කාර සහ අත්තනෝමතිකවීම වැලැක්වීමට මෙයාකාරයට

බලතල බෙදීම අවශ්‍ය දෙයක් ලෙස පිළිගැනීම සහ පැහැදිලි න්‍යාය ද සවිස්තරාත්මකව ඉගැන්විය යුතුයි).
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ව්‍යවස්ථානුකූල වාදය (මේ යටතේ පහත මාතෘකා ගුරුවරයා විසින් සාකච්ඡා කළ යුතුයි)

- ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්ද?
- ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක අන්තර්ගත විය යුතු මූලිකාංග
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ගීකරණය කරන ආකාරය
- ව්‍යවස්ථානුකූලවාදය යනු කුමක්ද?
- ව්‍යවස්ථානුකූලවාදයට ඇති සීමාවන්

- ආණ්ඩු ක්‍රම ආකෘතිය (දේශපාලන මාතවාද අනුව)

* දේශපාලන මතවාද අනුව ආණ්ඩු ක්‍රම කොටස් තුනකට වර්ග කළ හැක.

1. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී
2. පැසිස්ට්වාදී
3. සමාජවාදී

1. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක මූලික අංග ලක්ෂණ පහත සඳහන් ආකාරයට හඳුනා ගත හැක.
   (I) මහජන ස්වාධිපතිත්වය
   (II) සමානාත්මතාව
   (III) අයිතිවාසිකම්
   (IV) නියෝජන ආණ්ඩු ක්‍රමය
   (V) කාලීනව පවත්වන නිදහස් සහ සාධාරණ මැතිවරණ
   (VI ව්‍යවස්ථානුකූල ආණ්ඩුව
   (VII) වගකීම් සහිත ආණ්ඩුව
   (VIII) නීතියේ ආධිපතිත්වය
   (IX) අධිකරණයේ ස්වාධීනත්වය
   (X) තරගකාරී දේශපාලන පක්ෂ ක්‍රමය
   (XI) නිදහස් බලපෑම් කණ්ඩායම් ක්‍රියාකාරිත්වය
   (XII) නිදහස් මහජන මතයේ ක්‍රියාකාරිත්වය
   (XIII) යහ පාලනය
   (XIV) නිදහස් ජන මාධ්‍ය
   (XV) පාලකයින්ගේ සහ පාලිතයින්ගේ ප්‍රජාතන්ත්‍රවාදී චර්යාව

* මෙම කරුණු පංති කාමරය තුළ දී ගුරුවරයා විසින් සවිස්තරාත්මකව සිසුන්ට ඉගැන්විය යුතුය.

2. පැසිස්ට්වාදී ආණ්ඩු ක්‍රමයක මූලික ලක්ෂණ
   - ප්‍රජතාන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයන් ආශ්‍රිතව පවතින ඉහතින් දක්වන ලද මූලික ගුණාංග කිසිවක් පැසිස්ට් ආණ්ඩු ක්‍රමය තුළ දැක ගත නොහැක.
   - මේ අනුව පැසිස්ට් ආණ්ඩු ක්‍රමයක මූලික අංග ලක්ෂණ පහත දැක්වෙන ආකාරයට හඳුනා ගත හැක.
     I තනි පුද්ගලයෙකු විසින් මෙහෙයවන ආඥාදායක පාලනය
     II ආණ්ඩුවේ කාර්යයන්, ව්‍යුහයන් කාර්යාත්මක පදනමක් මත පැහැදිලි ව සහ විධිමත්ව විභේධීකරණය කර නොතිබීම

III ඒක පක්ෂ ක්‍රමයේ ක්‍රියාකාරිත්වය
IV දැඩි ජාතිවාදය
V රාජ්‍යයේ උත්තරීතරභාවය
VI පුද්ගලයා සහ සමාජය රාජ්‍යයේ බලයට නිර්දය ලෙස යටත් කොට පාලනය කිරීම
VII දේශපාලන ක්‍රියාදාමයේ සෑම මූලිකාංගයක්ම අකර්මන්‍ය කිරීම
VIII යුද්ධකාමී වීම

3. සමාජවාදී ආණ්ඩු ක්‍රම

* මාක්ස්, ලෙනින්වාදී දේශපාලන සහ ආර්ථික සිද්ධාන්ත පදනම් කොට ගෙන මෙම ආණ්ඩුක්‍රම ගොඩ නගා ඇත.
* ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම තුළ දැකිය හැකි බොහෝ මූලික ගුණාංග සමාජවාදී ආණ්ඩුක්‍රමය තුළ දැකිය නොහැක.
* සමාජවාදී ආණ්ඩුක්‍රමයක මූලික අංග ලක්ෂණ පහත සඳහන් ආකාරයට හඳුනාගත හැක.

I ඒක පක්ෂ පාලන ක්‍රමය සහ පක්ෂයේ අධිපතිත්වය
II කොමියුනිස්ට් මූලධර්ම පදනම් කරගෙන ආණ්ඩුවේ ව්‍යුහයන් ගොඩනඟා තිබීම සහ කාර්යයන් විභේධීකරණය කර තිබීම
III නිදහස් සහ තරගකාරී වෙළෙඳ පොළ වෙනුවට රාජ්‍ය විසින් ආර්ථිකය පාලනය කිරීම - මධ්‍යගත සැලසුම් ක්‍රමය
IV කොමියුනිස්ට් මූලධර්ම වලට අනුව ජනතාවගේ දේශපාලන, ආර්ථික හා සමාජ ජීවිතය පාලනය කිරීම

* මෙම ආණ්ඩුක්‍රමය ඉගැන්වීමේ දී පැරණි සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු ක්‍රමය ආදර්ශයට ගතහැක.

4. සමාජ - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම

* ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන න්‍යායන් සහ සමාජවාදයේ ආර්ථික න්‍යායයන් එකට එකතු කරමින් ගොඩ නගන ලද මිශ්‍ර ආණ්ඩු ක්‍රමයක් මෙයින් නිරූපණය වේ.
* මේ අනුව ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් තුළ දැකිය හැකි ව්‍යවස්ථානුකූල පාලනය, වගකීම, මැතිවරණ, දේශපාලන පක්ෂ, බලපෑම් කණ්ඩායම්, අධිකරණයේ ස්වාධීනත්වය යනාදී සෑම ගුණාංගයක්ම මෙම ආණ්ඩුක්‍රම තුළ ද ක්‍රියාත්මක වන ආකාරය දැකිය හැකි ය.
* නමුත් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක මූලිකම ලක්ෂණය වන්නේ ආර්ථිකය කළමනාකරණය කිරීමට රාජ්‍ය දැඩි ලෙස මැදිහත් වීමය.
* එසේ වුවද, සමාජවාදී ආණ්ඩුක්‍රමයක් තුළ මෙන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩුක්‍රමයක් තුළ දැඩි මධ්‍යගත සැලසුම් ක්‍රමයක් යටතේ රාජ්‍ය විසින් ආර්ථිකය පාලනය කරනු නොලැබේ.
* රාජ්‍ය කරනු ලබන්නේ නිෂ්පාදනය හා බෙදා හැරීමේ කාර්යයන්ට රාජ්‍ය ඍජුව ම සහභාගී වීම හරහා රාජ්‍යයේ අරමුණු අනුව ආර්ථිකය මෙහෙයවීමය.
* දෙවන ලෝක යුද්ධයෙන් පසු කාලය තුළ බිහි වූ තුන්වන ලෝකයේ බොහෝ රටවල් විසින් මෙම දේශපාලන හා ආර්ථික දර්ශනය ක්‍රියාවට නංවන ලදි.

* අවම රාජ්‍ය සංකල්පය මේ වන විට පෙරමුණට පැමිණ තිබෙන්නේ මෙම ක්‍රමය අසාර්ථක වීමේ ප්‍රතිඵලයක් ලෙසයි.

(ඉහතින් දක්වන ලද ආණ්ඩුක්‍රම වර්ග හතරේ සාපේක්ෂ වාසි හා අවාසි ගුරුවරයා විසින් පංති කාමරය තුළ දී ඉගැන්විය යුතු ය).

- ආණ්ඩුක්‍රම ආකෘතීන් - බලය බෙදීම අනුව

ආණ්ඩුක්‍රමය හඳුනා ගැනීම සඳහා යොදා ගත හැකි තවත් නිර්ණායකයක් ලෙස රාජ්‍යයේ ස්වාධිපති බලය ක්‍රියාවට නංවන ආකාරය පෙන්වා දිය හැක. මේ අනුව ඒකීය, සන්ධීය සහ සහසන්ධීය යනුවෙන් ආණ්ඩුක්‍රම වර්ග තුනක් හඳුනා ගත හැක.

1. ඒකීය ආණ්ඩුක්‍රමය

- රාජ්‍යයේ ස්වාධිපති බලය තනි මධ්‍යම ආණ්ඩුවක් විසින් ක්‍රියාවට නැංවීම
- ඒකීය පරිපාලන ක්‍රමය, ඒකීය අධිකරණය, ඒකීය පුරවැසිභාවය, යනාදිය ප්‍රධාන ලක්ෂණ වේ.
- එසේ වුවද ඒකීය ආණ්ඩුක්‍රමයන් තුළ පළාත් පාලන ආයතන වලට බලය පවරා දී ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාවට නැංවිය හැක.
- මෙසේ බලය පැවරීම බලය බෙදා දැක්වීමක් නොව බලය අවධාරිත කිරීමක් වේ. ඒ අනුව අවධාරිත කරන ලද බලය මධ්‍යම ආණ්ඩුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර මධ්‍යම ආණ්ඩුවට අවශ්‍ය ඕනෑම අවස්ථාවක එම බලය යලි පවරා ගත හැක.

(මෙම ආණ්ඩුක්‍රමයේ වාසි හා අවාසි ගුරුවරයා විසින් පංති කාමරයේ දී සිසුන්ට සවිස්තරාත්මකව පහදා දිය යුතුය)

2. සන්ධීය ආණ්ඩුක්‍රමය

- රාජ්‍යයේ ස්වාධිපති බලය ක්‍රියාවට නැංවීම සඳහා බල මධ්‍යස්ථාන හෙවත් ආණ්ඩු කිහිපයක් සහභාගී වීම මෙම ආණ්ඩුක්‍රමයේ මූලිකම ලක්ෂණය වේ.
- මේ අනුව සන්ධීය ආණ්ඩුක්‍රමයන් තුළ එක් මධ්‍යම ආණ්ඩුවක් සහ ප්‍රාන්ත ආණ්ඩු කිහිපයක් ක්‍රියාත්මක වන ආකාරය දැකිය හැකිය.
- මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු අතර බලය බෙදා තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.
- බලය බෙදීම සඳහා යොදා ගන්නා ක්‍රම තුනක් තිබේ.

  I මධ්‍යම ආණ්ඩුවේ බලය දක්වා ඉතිරි බලතල ප්‍රාන්ත ආණ්ඩුවලට අත් හැරීම.

  II ප්‍රාන්ත ආණ්ඩුවල බලතල දක්වා ඉතිරි බලතල මධ්‍යම ආණ්ඩුවට අත් හැරීම.

  III මධ්‍යම, ප්‍රාන්ත සහ සමගාමී වශයෙන් ලැයිස්තු තුනක් යටතේ බලතල බෙදා හැරීම

  (මේ සඳහා ලෝකයේ ක්‍රියාත්මක වන සන්ධීය ආණ්ඩුක්‍රම ආශ්‍රයෙන් අවශ්‍ය නිදසුන් ගුරුවරයා විසින් සිසුන්ට දැක්විය යුතුය.)

- සන්ධීය ආණ්ඩුක්‍රම අධ්‍යයනයේ දී පහත දැක්වෙන කරුණු කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය.

  (අ) සන්ධීය ආණ්ඩුක්‍රම පිහිටුවා ගැනීම කෙරෙහි බලපාන හේතු සාධක හා අරමුණු

(ආ) සන්ධීය ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ ව්‍යවස්ථාවේ උත්තරීතරභාවය, අධිකරණයේ කාර්ය භාරය, මධ්‍යම ආණ්ඩුව තුළ ප්‍රාන්ත ආණ්ඩුවලට නියෝජනය සැපයීම, භෞතික හා ආර්ථික සම්පත් බෙදා හරින ආකාරය යනාදිය.

(ඇ) සන්ධීය ආණ්ඩුක්‍රමයක වාසි හා අවාසි

(ඈ) සන්ධීය ආණ්ඩුක්‍රමයන්හි නූතන ප්‍රවණතා

3. සහසන්ධීය ආණ්ඩුක්‍රමය

- ඒකීය හා සන්ධීය ආණ්ඩුක්‍රම වර්ග දෙකට අතර මැදිව පවතින ආණ්ඩුක්‍රමයක් ලෙස සහසන්ධීය අණ්ඩුක්‍රමය හඳුන්වා දිය හැක.
- ප්‍රධාන ලක්ෂණය වන්නේ ප්‍රාන්ත රාජ්‍යයන්ට තමන්ගේ ස්වාධිපති බලය ඒයාකාරයෙන්ම ආරක්ෂා කර ගනිමින් සමහර කරුණු සම්බන්ධයෙන් පමණක් එක්සත් වී ක්‍රියා කිරීමට හැකිවීමය.
- මෙම ක්‍රමය යටතේ ශක්තිමත් ප්‍රාන්ත ආණ්ඩු ක්‍රමයක් සහ දුර්වල මධ්‍යම ආණ්ඩුවක් ක්‍රියාත්මක වන ආකාරය දැකිය හැකි වේ.
- ආණ්ඩුවේ අස්ථාවරභාවය ප්‍රධානතම දුර්වලතාව වේ. හේතුව තමන් කැමති ඕනෑම අවස්ථාවක දී ප්‍රාන්ත ආණ්ඩු වලට වෙන්ව යෑමේ අයිතිය හිමිවීම නිසාය. මේ සඳහා සලසා ඇති ව්‍යවස්ථානුකූල විධි විධාන රටින් රටට වෙනස්වේ.
- ක්‍රි . ව. 1789 ට පෙර ඇමරිකා එක්සත් ජනපදය තුළ කියාත්මක වූ සහසන්ධීය ආණ්ඩුක්‍රමය මේ සඳහා දිය හැකි හොඳම නිදසුනක් වේ.

- ආණ්ඩුක්‍රම ආකෘතීන් විධායක බලය ක්‍රියාවට නංවන ආකාරය අනුව
    - ආණ්ඩුක්‍රම හඳුනාගැනීම සඳහා භාවිතයට ගත හැකි තවත් නිර්ණායකයක් ලෙස ආණ්ඩුක්‍රමය තුළ විධායක බලය ක්‍රියාවට නැංවීම සඳහා ගොඩනගා ඇති ව්‍යුහයන්ගේ ස්වරූපය හඳුන්වා දිය හැක.
    - මෙම පදනම මත ආණ්ඩුක්‍රම වර්ග හතරක් හඳුනා ගතහැක.
        1. කැබිනට් ආණ්ඩුක්‍රමය
        2. ජනාධිපති ආණ්ඩුක්‍රමය
        3. මිශ්‍ර විධායකය
        4. ඒකපුද්ගල තන්ත්‍රය

1. කැබිනට් ආණ්ඩුක්‍රමය

- මෙම ආණ්ඩු ක්‍රමය තුළ විධායක බලතල ක්‍රියාවට නංවන්නේ අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයක් විසිනි.
- ව්‍යවස්ථාදායකයේ (නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ) බහුතර ආසන සංඛ්‍යාවක් ජයග්‍රහණය කරන පක්ෂයේ නායකයා අගමැති ධුරයට පත්වන අතර ඔහුගේ අභිමතය අනුව කැබිනට් මණ්ඩලයේ අනෙක් සාමාජිකයින් පත්කරනු ලැබේ.
- විධායක බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයට සාමූහිකව වගකිව යුතුය. යන්න කැබිනට් ආණ්ඩුක්‍රමයක පිළිගත් එක් පදනම් මූලධර්මයක් වේ.
- කැබිනට් ආණ්ඩුක්‍රමයක විධායකය හා ව්‍යවස්ථාදායකය අතර පවතින්නේ සමීප සම්බන්ධතාවයක් ය. හේතුව විධායකය ව්‍යවස්ථාදායකයෙන් තේරීපත් වීමත්, විධායකය ව්‍යවස්ථාදායකයේ සාමාජිකයින් ගෙන් සමන්විත වීමත්, විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී සිටීමත්ය.

- කැබිනට් ආණ්ඩුක්‍රමයක විධායකයේ පැවැත්ම තීරණය වන්නේ ව්‍යවස්ථාදායකයෙන් එයට ලැබෙන සහයෝගය අනුවය.
- සාමාන්‍යයෙන් විධායකයට එරෙහිව ඉදිරිපත් කරන විශ්වාසභංග යෝජනාවක් මගින් හෝ අයවැය පනත වැනි වැදගත් රාජ්‍ය ප්‍රතිපත්තියක් අනුමත නොකිරීම මගින් හෝ විධායකය බලයෙන් ඉවත් කිරීමේ හැකියාව ව්‍යවස්ථාදායකය සතුවේ.
- විධායක බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් සාමූහිකව ක්‍රියාකිරීමක් න්‍යායාත්මක වශයෙන් ප්‍රකාශ වූවද, කැබිනට් ආණ්ඩුක්‍රමයක ඒ සම්බන්ධයෙන් අගමැතිවරයාගේ ක්‍රියා කලාපය විශේෂයෙන් වැදගත් වේ.
- නූතන ප්‍රවණතාව වන්නේ කැබිනට් ආණ්ඩුක්‍රමය සත්‍ය වශයෙන්ම අගමැතිගේ ආණ්ඩුවක් බවට වර්ධනය වීමය.
- ආණ්ඩුව තනි පක්ෂයකින් සමන්විත වන්නේ නම් සහ ස්ථාවර බහුතරයක සහයෝගය ව්‍යවස්ථාදායකය තුළ ආණ්ඩුවට තිබෙන්නේ නම් එවැනි තත්ත්වයක් තුළ අගමැතිවරයාගේ තත්ත්වය, ජනාධිපති ආණ්ඩුක්‍රමයක ජනාධිපතිවරයෙකුගේ තත්ත්වයට සමාන වේ.

2. ජනාධිපති ආණ්ඩුක්‍රමය
   - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විධායක බලතල ක්‍රියාවට නැංවීමේ වගකීම හා බලය ඒක පුද්ගල විධායකයකට පැවරී තිබෙන ආණ්ඩුක්‍රම ජනාධිපති ආණ්ඩුක්‍රම ලෙස හඳුනාගත හැක.
   - මෙවැනි ආණ්ඩුක්‍රම වල ජනාධිපතිවරයා ජනතාව විසින් ඍජුවම නිශ්චිත නිල කාලයක් සඳහා තෝරා පත් කර ගනී.
   - ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී නොමැත. (මේ තත්ත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන අනුව රටෙන් රටට වෙනස් විය හැක.)
   - ව්‍යවස්ථාදායකයේ පාලනයෙන් ජනාධිපතිවරයා නිදහස් වන බැවින් සහ දෝෂාභියෝගයක් මගින් හැරුණ විට ජනාධිපතිවරයා තනතුරෙන් ඉවත් කිරීමට නොහැකි බැවින් විධායක බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා පුළුල් නිදහසක් භුක්ති විඳී.
   - විධායක බලතල ක්‍රියාවට නැංවීම පිළිබඳ ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සංවරණ යොදා නැත්නම් එහිදී ජනාධිපතිවරයාගේ තත්ත්වය අතිශයින්ම බලසම්පන්න වේ.
   - කැබිනට් විධායකයකට වඩා ජනාධිපති විධායකය කාර්යක්ෂමතාවෙන් වැඩි බැව් පොදු පිළිගැනීම වේ.
3. මිශ්‍ර විධායකය
   - විධායක බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් විධායකයන් දෙකක් ක්‍රියාත්මක වන ආණ්ඩු මේ සම්බන්ධයෙන් දැක්විය හැක.
   - 1958 පස්වන සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ප්‍රංශය තුළ ද, 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාව තුළ ද ගොඩනගා තිබෙන්නේ මෙවැනි ආණ්ඩුක්‍රමයන් ය.
   - මිශ්‍ර විධායකයක් පවතින තත්ත්වයන් තුළ විධායක බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයෙකු සහ අගමැති ප්‍රධාන අමාත්‍ය මණ්ඩලයක් සහභාගී වන ආකාරය දැකිය හැක. නමුත් මෙයින් වඩාත් වැදගත් වන්නේ ජනාධිපති තනතුරය. අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයට විධායක බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් සහභාගි විය හැකි ප්‍රමාණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

මගින් සපයා ඇති ප්‍රතිපාදන අනුව තීරණය වේ.

- ද්විත්ව විධායකයේ ජනාධිපතිවරයා කෙළින්ම ජනතාව විසින් තෝරා පත් කර ගනී. ජනාධිපතිවරයා විසින් අගමැති ප්‍රධාන අමාත්‍ය මණ්ඩලය ව්‍යවස්ථාදායකයෙන් තෝරා පත් කරනු ලැබේ.
- මේ අනුව ජනාධිපතිවරයා සහ ව්‍යවස්ථාදායකය අතර ඍජු සම්බන්ධතාවක් නොමැති අතර අගමැති සහ අමාත්‍ය මණ්ඩලයත්, ව්‍යවස්ථාදායකයත් අතර ඍජු සම්බන්ධතාවක් පවතී.
- අගමැති සහ අමාත්‍ය මණ්ඩලය ව්‍යවස්ථාදායකයට වගකිව යුතු අතර, විශ්වාසභංග යෝජනාවක් මගින් ඔවුන් ඉවත් කිරීමේ බලයද ව්‍යවස්ථාදායකය සතු වේ. නමුත් එසේ කරන ඉවත් කිරීමක් ජනාධිපති තනතුර කෙරෙහි බලපන්නේ නැත.

4. ඒක පුද්ගල තන්ත්‍රය

- එක් පුද්ගලයකු අත විධායක බලතල ඒකරාශී වීමත්, එම බලය ක්‍රියාවට නැංවීම කෙරෙහි සීමාවන් හෝ සංවරණ නොමැති වීමත් මෙම ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණය වේ.
- රාජාණ්ඩු පාලන ක්‍රම, මිලිටරි ආඥාදායක පාලන ක්‍රම නිදසුන් ය. නමුත් මෙම තත්ත්වය සමහර විට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රම තුළ ද දැකිය හැකිය.
- විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක වුවද, විධායක බලතල සංවරණය කර නොමැත්තේ නම් සහ තනි පුද්ගලයෙකු අත විධායක බලතල ඒකරාශී කර තිබේ නම් එවැනි තත්ත්වයන් තුළ ඒක පුද්ගල තන්ත්‍ර පාලන ක්‍රමයන් පැවතිය හැක.

- ආණ්ඩුව - ව්‍යුහ හා කාර්යයන්

    - මෙම මාතෘකාව යටතේ අධ්‍යයනය කරනු ලබන්නේ ආණ්ඩුක්‍රමයක විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය යන ව්‍යුහ සහ ඒවා මගින් ඉටු කරන කාර්යයන් පිළිබඳව ය.

1. විධායකය
    - (අ) සංවිධානය කර ඇති ආකාරය හා අදාළ න්‍යායාත්මක මූලධර්ම
    - (ආ) බලතල හා කාර්යය
    - (ඇ) ව්‍යවස්ථාදායකය හා අධිකරණය සමඟ පවත්නා අන්තර් සම්බන්ධතා
    - (ඈ) තෝරාපත් කරන ආකාරය
    - (ඉ) නිලයෙන් ඉවත් කරන ආකාරය
    - (ඊ) නූතන ප්‍රවණතා

    - මේ සම්බන්ධයෙන් ජනාධිපති හා කැබිනට් ආණ්ඩුක්‍රම වල විධායකය පදනම වශයෙන් ගෙන ඉගැන්වීම කළ යුතුය.

2. ව්‍යවස්ථාදායකය
    - (අ) සංවිධානය කිරීමේ මූලධර්ම - ඒක මාණ්ඩලිකවාදය හා ද්විමාණ්ඩලිකවාදය
    - (ආ) බලතල හා කාර්යයන්
    - (ඇ) නූතන ප්‍රවණතා

3. අධිකරණය
  (අ) සංවිධානය කිරීමේ මූලධර්ම
  (ආ) බලතල හා කාර්යය
  (ඇ) විනිශ්චයකරුවන් පත් කරන ආකාරය සහ ඉවත් කරන ආකාරය
  (ඈ) අධිකරණයේ ස්වාධීනත්වය

- ආණ්ඩුව - කාර්ය

බාහිර හා අභ්‍යන්තර වශයෙන් කොටස් දෙකකට බෙදිය හැක.

- බාහිර කාර්ය
  - ජාතික ආරක්ෂාව තහවුරු කිරීම. මෙය කොටස් 3 කින් සමන්විත වේ
  - දේශසීමා එකඟතාව ආරක්ෂා කිරීම
  - දේශපාලන නිදහස ආරක්ෂා කිරීම
  - රාජ්‍යයේ භෞතික පැවැත්ම ආරක්ෂා කිරීම

  - ජාතික ආර්ථිකය වර්ධනය කිරීම
  - ජාතික සුභසාධනය ඉහළ නැංවීම
  - ජාතික අභිමතය ආරක්ෂා කිරීම
  - ජාතික දේශපාලන මතවාදය ආරක්ෂා කිරීම

  - අභ්‍යන්තර කාර්යයන්
  - නීතිය හා සාමය ආරක්ෂා කිරීම
  - සමාජ සුභසාධනය
  - සමාජ කළමණාකරණය
  - පරිසර කළමණාකරණය
  - අධ්‍යාපනික හා සංකේතාත්මක කාර්යයන්

(මෙම එක් එක් කාර්යය පිළිබඳ ව ගුරුවරයා නිදසුන් සහිතව පංති කාමරයේ දී ඉගැන්විය යුතුය.)

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම

- පැවරුමක් ක්‍රියාත්මක කිරීම.
- ආණ්ඩුවේ ස්වභාවය හා ක්‍රියාකාරිත්වය යන මාතෘකාව ඔස්සේ පැවරුම සකස් කරන්න.
- ආණ්ඩුවේ ස්වභාවය ගැන කරුණු එක්රැස් කිරීමේ දී පහත සඳහන් ශීර්ෂ කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම වැදගත් වේ.
    - විවිධ අර්ථකථන
    - ආණ්ඩුව සම්බන්ධ පොදු නිර්වචනයක් (විවිධ චින්තකයින්ගේ නිර්වචන ඇසුරින් ඔබ විසින් ගොඩනගන්නා වූ අර්ථකථනයක් නම් වඩාත් යෝග්‍ය වේ.)
    - ආණ්ඩුව සුවිශේෂ සමාජ සංවිධානයක් ලෙස සැලකීමට හේතු
    - ආණ්ඩුව ස්වාධිපති බලය ක්‍රියාත්මක කරන විධි
    - ආණ්ඩුවේ වර්තමාන ක්‍රියාකාරිත්වය
- අදාළ තේමාවන් හා ඊට අන්තර්ගත විය යුතු සුවිශේෂ කරුණු පිළිබඳ ව අවධානය යොමු කරමින් සිසුන් ප්‍රායෝගිකව ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය දෙස බැලීමට හුරු කිරීම අපේක්‍ෂා කෙරේ.
- එමගින් නිර්මාණශීලී සහ නිදහස් චින්තනයට මග පාදමින් වඩාත් ප්‍රශස්ත මට්ටමේ පැවරුමක් ඉදිරිපත් කිරීමේ අවස්ථාව උදාකර දෙන්න.

## මූලාශ්‍රය


1. ද.සොයිසා , එම්. ඕ.ඒ. (2003) , දේශපාලන විද්‍යාවේ මූලික සිද්ධාන්ත - කතෘ ප්‍රකාශන
2. දේශපාලන විද්‍යාවේ මූලිකාංග I (1998) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ
3. භග්වාන්, විෂ්ණු හා භූෂාන් විද්‍යා (1997 ප්‍රථම මුද්‍රණ) ලෝක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, කොළඹ අධ්‍යාපන ප්‍රකාශන.
4. හේනායක ආරච්චි, රංජිත් (2004) සජීවී ක්‍රමය සිම්ප්ල් ප්‍රකාශකයෝ
5. Mahajan, V.D, (1998), **Political Theory (Principles of Political Science),** New Delhi; S.Chand and Company Ltd.

## ආණ්ඩුකරණයට ජනතාව සම්බන්ධ වන විධික්‍රම

**නිපුණතාව 05 :-** දේශපාලන පරිණතභාවයකින් යුතු පුද්ගලයෙකු ලෙස දේශපාලන ක්‍රියාවලියට දායක වෙයි.

**නිපුණතා මට්ටම :-** **කාලච්ඡේද (30)**

5.1 ආණ්ඩුකරණයට ජනතාව සම්බන්ධ වන විධික්‍රම ගවේෂණාත්මකව හඳුනා ගනියි.

5.2 දේශපාලන කටයුතු වලදී ජනතාව දේශපාලනය ඉගෙන ගන්නා ආකාරය, හැසිරෙන ආකාරය, නායකත්ව කුසලතා වර්ධනය කර ගන්නා ආකාරය පැහැදිලි කර දෙයි.

**ඉගෙනුම් ඵලය :-**

- ජනතාව දේශපාලන ක්‍රියාවලියට සහභාගිවීම සඳහා විවිධ ක්‍රමෝපායන් පවතින බව අවබෝධ කර ගනියි.
- වත්මන් දේශපාලන ක්‍රමය පිළිබඳව අවබෝධ කර ගැනීම සඳහා දේශපාලන සමාජානුයෝජනය වැදගත් සාධකයක් බව තේරුම් ගනියි.
- නියෝජන ක්‍රම, මැතිවරණ ක්‍රම, ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම, දේශපාලන පක්ෂ, මහජන මතය, බලපෑම් කණ්ඩායම්, සිවිල් සමාජය යන සංකල්ප පිළිබඳ දැනුම දේශපාලන වශයෙන් පුද්ගලයෙකුට වැදගත් වන බව අවබෝධ කර ගනියි.

**හැඳින්වීම :-**

දේශපාලන ක්‍රියාදාමය පිළිබඳව අධ්‍යයනය කිරීම පදනම් කොට ගෙන මෙම ඒකකය සකස් කර ඇත. දේශපාලන ක්‍රියාදාමය යනුවෙන් අදහස් කරන්නේ සංවිධානය වූ දේශපාලන ක්‍රමයක් තුළ ගොඩනගා ඇති දේශපාලන බලධාරී ආයතන සහ එම දේශපාලන සමාජයේ පුද්ගලයන් එකට යාකරන්නා වූ උපාංග අන්තර්ගත වන්නා වූ ක්‍රියා පිළිවෙතයි. මෙම උපාංග ලෙස නියෝජන ක්‍රම, මැතිවරණ ක්‍රම, ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම, මහජන මතය, බලපෑම් කණ්ඩායම් සහ සිවිල් සමාජය හඳුනාගත හැක. දේශපාලන සමාජයක් තුළ මිනිසුන් එම ක්‍රියාදාමයට සම්බන්ධවීමේ මට්ටම සහ ගුණාංග රඳා පවතින්නේ ඔවුන් දේශපාලන සමාජානුයෝජනයට ලක්වන ප්‍රමාණය අනුවය. එබැවින් මෙම ඒකකය තුළින් දේශපාලන සමාජානුයෝජනය පිළිබඳවද ගැඹුරින් අධ්‍යයනය කෙරේ. මිනිසුන්ගේ දේශපාලන සමාජානුයෝජන මට්ටම අනුව දේශපාලන සංස්කෘතියේ ස්වරූපය ප්‍රකාශයට පත් වේ. නිදසුන් ලෙස යම් දේශපාලන සමාජයක මිනිසුන් ඉහළ මට්ටමේ දේශපාලන සමාජානුයෝජන මට්ටමකට ලක්ව තිබේ නම් එහි දී දේශපාලන සංස්කෘතියද ඉහළ මට්ටමක් පෙන්නුම් කරන අතර දේශපාලන සමාජානුයෝජනය පහළ මට්ටමක පවතින්නේ නම් එමගින් නිරූපනය වන දේශපාලන සංස්කෘතිය ද පහළ මට්ටමකට පැමිණේ. එබැවින් මෙම ඒකකය තුළ දේශපාලන සංස්කෘතිය පිළිබඳව අධ්‍යයනය කිරීම ද අවධාරණය කෙරේ. මෙයට අමතරව දේශපාලන සමාජයක් තුළ ප්‍රධාන ගණයේ දේශපාලන ක්‍රියාකාරීන් කණ්ඩායමකගේ පැවැත්ම දැකිය හැකිය. ඕනෑම දේශපාලන ක්‍රමයක පෙර ගමන් කරුවන් වන්නේ මොවුන්ය. ඔවුන් දේශපාලන ප්‍රභූන් ලෙස හඳුන්වනු ලැබේ. දේශපාලන ක්‍රමයක දේශපාලන ප්‍රභූන් ඉටු කරන භූමිකාව එම දේශපාලන ක්‍රමයේ පැවැත්ම සහ ඉදිරි ගමන පිළිබඳව දැඩි බලපෑමක් කරනු ලැබේ. එබැවින් මෙම ඒකකය තුළ දේශපාලන ප්‍රභූන් පිළිබඳව ද අධ්‍යයනය කිරීම අපේක්ෂා කෙරේ.

**විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්**

- දේශපාලන ක්‍රියාදාමය - ආණ්ඩුව හා ජනතාව
    - නියෝජන ක්‍රමය හා මැතිවරණ ක්‍රම
        - නියෝජනය යනු කුමක්ද?
        - නියෝජනය අවශ්‍ය වන්නේ ඇයි?

        (නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීම සඳහා නියෝජනය අවශ්‍ය බව පැහැදිලි කළ යුතුය)
        - නියෝජන ක්‍රම

        **ප්‍රාදේශීය නියෝජනය**
            - සරළ බහුතර නියෝජන ක්‍රමය
            - ඒකාන්ත බහුතර නියෝජන ක්‍රමය

        **සමානුපාතික නියෝජනය**
            - විවෘත ලැයිස්තු ක්‍රමය
            - සංවෘත ලැයිස්තු ක්‍රමය
            - මාරු කළ හැකි තනි ඡන්ද ක්‍රමය (STV)

මෙම නියෝජන ක්‍රමයන්හි යහපත් අයහපත් ලක්‍ෂණ හා ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය නිදසුන් සහිතව ගුරුවරයා පංති කාමරයේදී ඉගැන්විය යුතුය.

- ජර්මානු මැතිවරණ ක්‍රමය හෙවත් මිශ්‍ර නියෝජන ක්‍රමය

ශුද්ධ සරල බහුතර නියෝජන ක්‍රමයේ හා ශුද්ධ සමානුපාතික නියෝජන ක්‍රමයේ භාවිතාව තුළ ඇති වන ගැටළු වැලැක්වීම සඳහා මිශ්‍ර නියෝජන ක්‍රමවේදය භාවිතා කිරීම.

සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම

- නීති සම්පාදන කාර්යයට පුරවැසියන් කෙළින්ම සහභාගි වීම සෘජු ප්‍රජතාන්ත්‍රවාදයේ හරයයි.
- සෘජු ප්‍රජාතන්ත්‍රවාදි උපක්‍රම යනු මොනවාද?
    - ප්‍රාථමික ජනතා මණ්ඩල ක්‍රමය
    - ජනමත විචාරණ ක්‍රමය
    - ප්ලෙබිසයිට් ක්‍රමය (ජනතා ආඥාව)
    - ප්‍රාරම්භනය (නීතියට මුල පිරීම)
    - පුනරාවර්තනය ( නැවත කැඳවීම)

දේශපාලන පක්ෂ

- දේශපාලන පක්ෂයක් යනු කුමක්ද?
- දේශපාලන පක්ෂවල ආරම්භය
- දේශපාලන පක්ෂ රටින් රටට වෙනස් වුවද පොදුවේ පහත සඳහන් අංග ලක්ෂණ දැකිය හැකිය.
    - සහභාගිත්වය (හවුල්කාරිත්වය)
    - බහුවිධතාව
    - රාජ්‍ය බලය අල්ලා ගැනීම සඳහා සටන් වැදීම
    - ප්‍රතිපත්ති සම්පාදනයට හා ක්‍රියාත්මක කිරීමට හවුල් වීම
    - දේශපාලන පක්ෂවල කාර්යයන්
    - විසිරි ඇති මහජන මතය ඒකරාශී කිරීම
    - සමාජ බලය අධිකාරි බලය බවට පරිවර්තනය කිරීම
    - ඡන්ද දායකයන් දැනුවත් කිරීම
    - නායකයන් පුහුණු කිරීම

- සාමාජිකයන් බඳවා ගැනීම
- පක්ෂ වර්ගීකරණය
- කේවල පක්ෂ හා ජනතා පක්ෂ
- ජනතා පක්ෂ කොටස් 3කි

1. ඒක පක්ෂ ක්‍රමය
    - කොමියුනිස්ට් ආකෘතිය
    - පැසිස්ට් ආකෘතිය
    - නව රාජ්‍යයන් හි ක්‍රියාත්මක වන පක්ෂ ක්‍රමය
2. ද්විපක්ෂ ක්‍රමය
3. බහු පක්ෂ ක්‍රමය

(මෙම පක්ෂ රටාවන්ගේ යහපත් අයහපත් ලක්ෂණ හා ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය නිදසුන් සහිතව ගුරුවරයා පංති කාමරයේ දී ඉගැන්විය යුතුය.)

මහජන මතය

- මහජන මතය යනු කුමක්ද?
  ආණ්ඩුව හා එහි ක්‍රියාකාරිත්වය දේශපාලන වශයෙන් වැදගත් පුද්ගලයින් සහ දේශපාලන වශයෙන් වැදගත් සිදුවීම් යන අංශ තුන කෙරෙහි මහජනතාව ප්‍රකාශ කරන අදහස්වල සමාන්‍යකරණය කරන ලද අදහස් මහජන මතය වේ.
- මහජන මතය යනු පුද්ගල මත රාශියක එකතුව ලෙස ද සැලකිය හැකිය.
- මහජන මතය සකස්වීම කෙරෙහි සාධක කීපයක් බලපායි. (පවුල, අධ්‍යාපනය, ආගම, සමාජ සංවිධාන, ජනමත නායකයන්, ආර්ථික සාධක, ජනමාධ්‍යයන්, දේශපාලන පක්ෂ)
- රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී මහජන මතයේ වැදගත්කම
    - ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ කාර්යක්ෂමතාව සඳහා මහජන මතය සැලකිල්ලට ගැනීම.
    - යහපාලනය සඳහා මහජන මතය සැලකිල්ලට ගැනීම
    - මැතිවරණ දෙකක් අතර කාලයේ ජනතා මතය ප්‍රකාශ කළ හැකිවීම.

බලපෑම් කණ්ඩායම් (Presure Groups)

- දේශපාලන බලය හසුරුවන පුද්ගලයන්ට සහ ආයතනවලට බලපෑම් කිරීම මගින් තම අරමුණු සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක වන පුද්ගල කණ්ඩායම් හා සංවිධාන බලපෑම් කණ්ඩායම් වේ.
- බලපෑම් කණ්ඩායම් දේශපාලන පක්ෂයකින් වෙනස් වේ.
- ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වය සඳහා බලපෑම් කණ්ඩායම් අවශ්‍ය වේ.
- බලය හසුරුවන අය සමඟ සබඳතා පැවැත්වීම, විදුලි පුවත්, දුරකථන පණිවිඩ, පෙළපාලි, විරෝධතා ව්‍යාපාර, වැඩ වර්ජන, පත්‍රිකා හා ප්‍රකාශන, භෝජන සංග්‍රහ, තෑගි බෝග දීම, නිල පරීක්ෂණවලට සහභාගීවීම, උපදෙස් ලබාදීම යනාදි ක්‍රම මගින් බලපෑම් කරයි.
- ආශා කණ්ඩායම් (Interest Groups)
  බලපෑම් කණ්ඩායම්වලින් වෙනස් වන එහෙත් දේශපාලන ක්‍රියාවලියට ජනතාව සම්බන්ධ වන සමාජ සංවිධාන විශේෂයක් වේ.

සිවිල් සමාජය

- සිවිල් සමාජය යනු ආණ්ඩුව, පවුල සහ වෙළඳපල යන ආයතන තුන් වර්ගය හැරුණු විට සමාජය තුළ ක්‍රියාත්මක වන අනෙක් සියළුම ප්‍රජා හා සමාජ සංවිධානයන්ගේ සමස්ත එකතුව වේ.
- " බෙදාගත් ආශාවන් අරමුණු හා අගය කිරීම් උදෙසා බලය බෙදීමෙන් තොරව සාමුහිකව ක්‍රියාත්මකවන සමාජ ක්ෂේත්‍රය සිවිල් සමාජය ලෙස අදහස් වේ."
  (London School of Economics)

- සිවිල් සමාජයක ප්‍රධාන ලක්ෂණ
  - සාමුහික ක්‍රියාවන් වීම
  - බලය යෙදීමෙන් තොරවීම
  - අනන්‍යතාව
  - දේශසීමා නිශ්චිත ලෙස හඳුනාගත නොහැකිවීම

සිවිල් සමාජය පිළිබඳ අදහස 20 වන සියවස දෙවන භාගයේ දී ඉදිරියට පැමිණීමට හේතු කීපයක් බලපාන ලදි.

- තුන්වන ලෝකයේ රටවල ආණ්ඩුවල ප්‍රජාතන්ත්‍රවාදය දුර්වල වීම.
- ස්වාභාවික හා මානව සම්පත් පැවතිය ද ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමට අපොහොසත් වීම.
- දූෂණය, නාස්තිය අකාර්යක්ෂමතාව වර්ධනය වීම.
- සාමාන්‍ය ජනතාවගේ දේශපාලන අවබෝධය පුළුල්වීම සහ ජනතාව දේශපාලනික වශයෙන් පසුගාමී තත්ත්වයක පැවතීම.

- සිවිල් සමාජයක් ගොඩනැගීමෙන් අපේක්ෂා කරන්නේ ජනතාව දේශපාලනික වශයෙන් සවිබල ගැන්වීමයි.
- යහපාලනය ගොඩනැගීම සහ පවත්වාගෙන යාම සඳහා සිවිල් සමාජයට කිහිප ආකාරයකට බලපෑම් කළ හැකිය.
  - ප්‍රතිවිරෝධතා බලවේගයක් ලෙස ක්‍රියාකිරීම
  - ආණ්ඩුකරණය පිළිබඳ මුරබල්ලෙකු ලෙස ක්‍රියා කිරීම
  - පුද්ගලයින් සාමුහික සමාජ ජීවිතයකට හුරුපුරුදු කරවීම

- ජනතාව දේශපාලන ජීවින් වශයෙන්

දේශපාලන සමාජානුයෝජනය

මිනිසුන් තමන් ජීවත්වන දේශපාලන ක්‍රමයට අනුගත කිරීම සඳහා අවශ්‍ය දේශපාලන දැනුම හා අවබෝධය ලබාදෙමින් මිනිසුන්ගේ දේශපාලන ගතිගුණ, ආකල්ප විශ්වාසයන්, අගය කිරීම් යනාදිය හැඩගැස්වීම කෙරෙහි බලපාන සමස්ත ක්‍රියාවලිය දේශපාලන සමාජානුයෝජනය යනුවෙන් හැඳින්විය හැක.

සමාජානුයෝජන කාරක පහත සඳහන් පරිදි දැක්විය හැක.

- පවුල
- අධ්‍යාපන ආයතන පාසල හා විශ්ව විද්‍යාල
- මිත්‍ර සමාගම්
- වෘත්තිය අත්දැකීම්
- ජන මාධ්‍ය
- ආගමික සංවිධාන

- දේශපාලන පක්ෂ
- දේශපාලන සංකේත
- ආණ්ඩුව

දේශපාලන සංස්කෘතිය

දේශපාලන සංස්කෘතිය යනුවෙන් අදහස් කරන්නේ දේශපාලන ක්‍රමය තුළ ජීවත්වන ජනතාව විසින් එම දේශපාලන ක්‍රමය කෙරෙහි ගොඩනැගී තිබෙන ගතිගුණ, විශ්වාසයන්, අගය කිරීම් යනාදියෙහි සමස්ත එකතුවකි.

මෙම ක්‍රියාදාමය තුළින් ප්‍රකාශ වන මූලික ක්‍රියාකාරකම් 3කි.

1. දේශපාලන ක්‍රමය කෙරෙහි ගොඩනගා තිබෙන ආකල්ප හා දේශපාලන ක්‍රමය වඩාත්ම ප්‍රශස්ත දේශපාලන ක්‍රමයක් ද නැද්ද යන්න පිළිබඳව ජනතාව තුළ තිබෙන අවබෝධය .
2. දේශපාලන සංකේත කෙරෙහි ඇති බැඳීම් හා ගරු කිරීම්, එනම් ජාතික ගීය, ජාතික කොඩිය, ජාතික මුද්‍රාව, නිදහස් දිනය, ජාතික වීරයින් යනාදිය පිළිබඳ ව පවත්වන බැඳීම් සහ ගරු කිරීම
3. අවසාන අගයන් පිළිබඳ ව තාර්කික විනිශ්චයකට ඒමට ඇති හැකියාව ආණ්ඩුව විසින් කුමක් කළ යුතු ද, නොකළ යුතු ද යන්න අවසාන අගය කිරීම විනිශ්චය කිරීමට ඇති හැකියාව.

දේශපාලන ප්‍රචණ්ඩත්වය

- ප්‍රචණ්ඩත්වය යනු පුද්ගලයාගේ සමාජීය හැසිරීමේ විධික්‍රමයකි.

  උදාඃ- වර්ග වාදය

  වර්ග වාදය ආයතනික ගත කළහොත් එවන් දෙයක් හඳුන්වනු ලබන්නේ දේශපාලන ප්‍රචණ්ඩත්වය වශයෙනි.
  දේශපාලන ප්‍රචණ්ඩත්වය කැරලි කෝලාහල තුළින් ඇති විය හැක.
  මීට අමතරව විප්ලව, පැහැර ගැනීම්, හමුදා විසින් බලය පැහැරගැනීම්, ගරිල්ලා යුද්ධ ක්‍රම, ත්‍රස්තවාද, සාම්ප්‍රදායික යුද්ධ, ආගමික විප්ලව වැනි අවස්ථාවන්හි දී දේශපාලන ප්‍රචණ්ඩත්වය දැකිය හැක.

දේශපාලන චර්යාව

- දේශපාලන වශයෙන් සංවිධානය වූ සමාජයක පුද්ගලයින් එහි බල ආයතන සමඟ ක්‍රියාකාරී වෙමින් බල ආයතන වටා හැසිරෙන ආකාරය දේශපාලන චර්යාව ලෙස සැලකේ.
- දේශපාලන හැසිරීම කෙරෙහි බලපාන සාධක ගණනාවකි.
  - පුද්ගලයින්ගේ ආර්ථිකය
  - පුද්ගලයින්ගේ සමාජ මට්ටම්
  - ජන වර්ගය
  - කුලය
  - අධ්‍යාපනය
  - ලැදියාවන් (පුද්ගල)
  - වෙනත්

- දේශපාලන සමාජානුයෝජනය සඳහා දේශපාලන චර්යා මූලික වශයෙන් බලපායි.
- දේශපාලන චර්යා අවබෝධ කර ගත හැකි අවස්ථා

- Ø මහජනයා දේශපාලනයට සහභාගිවන ආකාරය
- Ø ප්‍රදර්ශනාත්මක දේශපාලන ක්‍රියාවලිය (වැඩ වර්ජන / උද්ඝෝෂණ / නායකත්ව චර්යා)
- Ø ආශා කණ්ඩායම්වල හා බලපෑම් කණ්ඩායම්වල ක්‍රියාකාරකම්.
- Ø ජාතික රාජ්‍යවල ක්‍රියාකාරකම්
- Ø ආණ්ඩු නොවන සංවිධානවල ක්‍රියාකාරකම්
- Ø ත්‍රස්තවාදී සංවිධානවල හැසිරීම
- Ø දේශපාලන සන්නිවේදනය

- දේශපාලන ප්‍රභූන්
  ඕනෑම සංවිධානාත්මක සමාජයක දේශපාලන ක්‍රියාවලියට නායකත්වය දෙන්නා වූ පුද්ගල කණ්ඩායමක් දේශපාලන ප්‍රභූන් ලෙස පොදුවේ හැඳින්විය හැකිය.
- ප්‍රභූ කණ්ඩායම් බිහිවීම කෙරෙහි බලපාන සාධක
  - Ø පරම්පරාව
  - Ø ධනය
  - Ø ආගම
  - Ø අධ්‍යාපනය
  - Ø ආකර්ෂණීය නායකත්වය
  - Ø කුලය
  - Ø නිලය
  - Ø බලය
  - Ø දේශපාලන හැකියාවන්
- නූතන සමාජයේ ධනය හා බලය වැනි සාධක මුල්කරගෙන ප්‍රභූන් බිහිවීම හඳුනා ගත හැක.
- දියුණු දේශපාලන සංස්කෘතියක් නොමැති රටවල ප්‍රජාතන්ත්‍රවාදි ආයතනික ව්‍යුහය තුළ ද නව ආකාරයකින් ප්‍රභූවාදය ඉස්මතු විය හැකිය.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම

- පිටු පෙරළනයක් සැකසීම
- පන්තියේ සිසුන් කණ්ඩායම් කර පහත සඳහන් මාතෘකා ලබා දෙන්න.
  - I සමානුපාතික නියෝජන ක්‍රමය හැඳින්වීම හා එහි ලක්ෂණ.
  - II සරල බහුතර නියෝජන ක්‍රමය හැඳින්වීම හා එහි ලක්ෂණ.
  - III සමානුපාතික හා සරල බහුතර නියෝජන ක්‍රමවලවාසි අවාසි.
  - IV සමානුපාතික හා සරල බහුතර නියෝජන ක්‍රම සම්බන්ධයෙන් වර්තමානයේ ගොඩ නැගී ඇති ගැටළු.
- මාතෘකාවට අදාළ තොරතුරු රැස් කිරීම නිර්මාණාත්මක බව මෙන්ම සමස්තය ගොඩ නැගීම පිළිබඳව අවධානය යොමු කරන්න.
- කණ්ඩායම් සියල්ලෙහි පිටු එකතු කර පිටු පෙරළනය සකස්කර පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

## මූලාශ්‍රය


1. **ද සොයිසා, එම්. ඕ. ඒ. (2003) දේශපාලන විද්‍යාවේ මූලික සිද්ධාන්ත කතෘ ප්‍රකාශන**
2. **දේශපාලන විද්‍යාවේ මූලිකාංග I (1998) අධ්‍යාපන ප්‍රකාශන**
3. **Mahajan, V.D (1998) Political Thery (Principles of political science) New Delhi; S. Chand and company**

# ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය අතර පවත්නා අන්තර් සම්බන්ධතාව

**නිපුණතාව 06** :- ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය සඳහා දේශපාලන විද්‍යාවේ මූලික සංකල්ප භාවිතා කරයි.

**නිපුණතා මට්ටම** :- **කාලච්ඡේද (20)**

6.1 ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයක මූලික මූලධර්ම විග්‍රහ කරයි.

6.2 ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය අතර පවත්නා අන්තර් සම්භන්ධතාව විග්‍රහ කරයි.

**ඉගෙනුම් ඵලය** :-

- අයිතිවාසිකම් නිර්වචනය කරයි.
- අයිතිවාසිකම් ප්‍රභේද කොට දක්වයි.
- අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා යොදා ඇති විධිවිධාන පැහැදිලි කරයි.
- අයිතිවාසිකම් භුක්ති විඳීම පිළිබඳව ඇති සීමාවන් ගවේෂණය කරයි.
- අයිතිවාසිකම් වල ප්‍රායෝගික වැදගත්කම පැහැදිලි කරයි.
- යහපත් පුරවැසියෙකු ලෙස යුතුකම් ඉටුකිරීමේ අගය වටහා ගනී.
- නිදහස වර්ග කොට දක්වයි.
- ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක නිදහස භුක්තිවිඳීමට ඇති සීමා පැහැදිලි කරයි.
- සමානාත්මතාවය සහ නිදහස අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරයි.
- නීතියක මූලික ලක්ෂණ හඳුන්වයි.
- නීතිය පිළිබඳ විවිධ මත විස්තර කරයි.
- නීති පැනවීමෙහිලා නීති මූලාශ්‍ර බලපාන ආකාරය පැහැදිලි කරයි.
- නීතිය හා සදාචාරය අතර ඇති සම්භන්ධතාව ගවේෂණය කරයි.
- පුද්ගලයා නීතියට අවනත වීම පිළිබඳ මත විශ්ලේෂනය කරයි.
- පුද්ගලික දේපල සංකල්පය හඳුනා ගනියි.
- යහපාලන සංකල්පය මගින් අවධාරණය කරන මූලික කරුණු පෙළගස්වයි.

**හැඳින්වීම** :-

නූතනයේ බොහොමයක් ආණ්ඩු ක්‍රම ගොඩනගා තිබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම පදනම් කොට ගෙනය. එබැවින් දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේදී මෙම මූලධර්ම පිළිබඳ ගැඹුරින් විමසා බැලීම සහ අවබෝධ කර ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් වේ. මිනිසුන් ක්‍රියාකාරී දේශපාලනජීවීන් ලෙස දේශපාලන ක්‍රමයට සහභාගි වී බලපෑම් සහගත ක්‍රියාකලාපයක් ඉටු කිරීමට නම් මෙම මූලධර්මවල න්‍යායාත්මක පදනම සහ ඒවායේ ප්‍රායෝගික භාවය පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය. මෙම ඒකකයෙන් එම ඉලක්කය සපුරා ගැනීම අපේක්ෂා කෙරේ. මෙම ඒකකය තුළ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ තෝරාගත් සංකල්ප කිහිපයක් අධ්‍යයනයට ලක්කෙරේ. ඒවා නම් ප්‍රජාතන්ත්‍රවාදය, එහි න්‍යායාත්මක බදනම, ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය, අයිතිවාසිකම් සහ යුතුකම්, ඒවායේ න්‍යාය සහ භාවිතය, නිදහස සහ සමානාත්මතාවය, නීතිය හා නීතියේ ආධිපත්‍යය සහ යහපාලනය යනාදියයි.

ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් වඩාත් ජනහිතකාමී ආණ්ඩු ක්‍රමයක් බවට පත්වන්නේ එය යහපාලනය මූලධර්ම පදනම් කර ගෙන ක්‍රියාත්මක වූවහොත් පමණි. එබැවින් යහපාලනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? එහි සංයුතික

මූලධර්ම මොනවාද? යන්න ගැඹුරින් අධ්‍යයනය කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

**විෂයකරුණු පැහැදිලි කරගැනීම සඳහා අත්වැලක්**

**අයිතිවාසිකම් හා යුතුකම්**

- පිරිපුන් සමාජ ජීවිතයක් ගත කිරීම සඳහා මිනිසුන්ට අවශ්‍යයෙන්ම තිබිය යුතුයැයි පිළිගැනෙන සමාජ හිමිකම් අයිතිවාසිකම් ලෙස හඳුන්වා දිය හැක.
- පුද්ගලයෙකු මනුෂ්‍යයෙකු වශයෙන් ඉපදීම නිසා ගෞරවාන්විතව සහ සුරක්ෂිතව ජීවත්වීම සඳහා ලැබෙන හිමිකම් විශේෂයකි.
- අයිතිවාසිකම් පිළිබඳ පහත සඳහන් චින්තකයින්ගේ නිර්වචන පිළිබඳ අවධානය යොමු කරවන්න. (හොබ් හවුස්, ජෝන් ලොක්, හැරල්ඩ් ජේ ලැස්කි, වයිල්ඩ්)

**අයිතිවාසිකම් වර්ගීකරණය**

1. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්
2. ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම්

- අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා යොදා ඇති විධිවිධාන
  - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අයිතිවාසිකම් සහතික කිරීම.
  - අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීම අධිකරණයට පැවරීම.
  - අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම.
  - නීතියේ ආධිපත්‍ය පිළිගැනීම.
  - රාජ්‍ය සේවය හා පොලිසිය ස්වාධීනව පවත්වා ගෙන යාම.
  - ආර්ථික සාධාරණත්වය.
  - අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් වීම.
  - නිදහස් හා ස්වාධීන ජන මාධ්‍ය තිබීම.
- සීමා
  - අන් අයගේ අයිතිවාසිකම් වලට බාධා නොවන පරිදි අයිතිවාසිකම් භුක්ති විඳීම.
  - සමාජයේ පොදු යහපතට බාධාවක් නොවන පරිදි අයිතිවාසිකම් භුක්ති විඳීම.
  - පවත්නා නිතිමය විධිවිධිනා උදා:- හදිසි අවස්ථා

**අයිතිවාසිකම්වල ප්‍රයෝගික වැදගත්කම**

- සංවර්ධනය මැනීමේ නිර්ණායකයක් වීම
- විදේශාධාර ලබාගැනීමේ නිර්ණායකයක් විම.
- මානව අයිතිවාසිකම් කඩවීම අනාවරණය කරගත හැකි වීම.

- යුතුකම් :- යුතුකම් හුදු බැඳීම් ලෙස අර්ථකථනය කළ හැක.
  - පුද්ගලයෙකු යම් දෙයක් කිරීමට හෝ නොකිරීමට බැඳීමක් ඇති වූ විට එය අනිවාර්යයෙන්ම යුතුකමක් හා සමඟ සම්බන්ධවේ.
- යුතුකම් හා අයිතිවාසිකම් අතර වෙනස
  - සෑම අයිතිවාසිකමක්ම යුතුකමක් හා බැඳී පවතී.
  - යුතුකම් හා අයිතිවාසිකම් එකිනෙකට වෙන් කළ නොහැකිය.

## යුතුකම්

### සදාචාරාත්මක යුතුකම්

- ආචාර විද්‍යාත්මක සංකල්ප පදනම් කොට ගෙන ගොඩ නැගී තිබීමය.

  උදා- - වැඩිහිටියන්ට සැලකීම
  - වැඩිහිටියන්ට ගරු කිරීම
  - දූ දරුවන්ට සැලකීම

### නීතිමය යුතුකම්

- පොදු සමාජ යහපත සඳහා පුරවැසියන් විසින් ඉටු කළ යුතු බවට රාජ්‍යයේ නීතිය මගින් විධානය කර ඇති කාර්යයන්

  උදා- - රාජ්‍යයට අවනතභාවය දැක්වීම
  - රාජ්‍යය මගින් පනවන නීති පිළිගැනීම
  - අයබදු ගෙවීම
  - නීතිය හා සාමය පවත්වා ගෙන යාම සඳහා රාජ්‍යයට සහාය දැක්වීම.

- නිදහස හා සමානාත්මතාව
  - නිදහස හැඳින්වීම

    තම පෞද්ගලික ක්‍රියාකාරකම් වර්ධනය කර ගනිමින් යහපත් සමාජ ජීවිතයක් ගත කිරිම සඳහා මිනිසාට ඇති අයිතිය නිදහස යනුවෙන් හැඳින්වේ.
    නිදහස යනු අසීමිත හා අසහාය නිදහසක් නොවිය යුතුය.
    ( නිදහස පිළිබඳ ඉදිරිපත් කර ඇති නිර්වචන ඔස්සේ තව දුරටත් සංකල්පය පැහැදිලි කරන්න)

නිදහස වර්ගීකරණය

- සිවිල් නිදහස
- පෞද්ගලික නිදහස
- ආර්ථික නිදහස
- දේශපාලන නිදහස

( ඉහත සඳහන් කරුණු ගුරු සිසු, සිසු - සිසු අන්තර් ක්‍රියාකාරිත්වය ඇති වන ලෙස නිදසුන් සහිතව සාකච්ඡාවට යොමු කරන්න)

නිදහස සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති අදහස්

- නිදහස සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති අදහස් කොටස් දෙකකට බෙදා දැක්විය හැක.
  - ප්‍රතිශේධාත්මක නිදහස පිළිබඳ මතවාදය
  - ප්‍රතිජානාත්මක නිදහස පිළිබඳ මතවාදය

නිදහස සුරක්ෂිත කිරීමට නූතන රාජ්‍යවල යොදා ඇති විධිවිධාන

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ මූලික මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශනයක් අන්තර්ගත කිරීම.
- අධිකරණයේ ස්වාධීනත්වය
- නිතියේ ආධිපත්‍යය
- ආර්ථික සාධාරණත්වය
- නිදහස් ජනමාධ්‍යයක පැවැත්ම
- මහජනතාව දැනුවත් කිරීම

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක නිදහස භුක්තිවිදීමේදී ප්‍රායෝගික සීමා පවතින බව

- අන් අයගේ නිදහසට බාධා නොවන පරිදි නිදහස භුක්තිවිදිය යුතු වීම.
- සමාජයේ නීතියට යටත්ව නිදහස භුක්තිවිදිය යුතු වීම.
- සිවිල්, ආර්ථික හා දේශපාලන නිදහස භුක්තිවිදීමේදී ඒවා එකිනෙකට ගැටෙන සුළුවීම.

සමානාත්මතාව

- හැඳින්වීම
  සමාජය තුළ ජීවත්වන සියලුම දෙනාටම සමාන අයුරින් අයිතිවාසිකම් භුක්තිවිදීමට ඉඩ සැලසීම සමානාත්මතාව යනුවෙන් හැඳින්වේ.
- සමානාත්මතාවය සඳහා තිබිය යුතු ප්‍රධාන ගුණාංග
  - පුද්ගලයින් විශේෂීකරණයට භාජනය නොකිරීම
  - සමාන ඉඩ ප්‍රස්තා සියලු දෙනාටම ලබා දීම.
  - සියලු දෙනාටම සමාන අයිතිවාසිකම් හිමිවීම.
- නිදහස හා සමානාත්මතාව අතර සම්බන්ධතාව
  - නිදහස හා සමානාත්මතාව එකිනෙකට පටහැනි නොවන එකිනෙකෙහි අනුපූරක බව.
  - නිදහස සහ සමානාත්මතාව එකිනෙකට පටහැනි සංකල්ප බව.
  - ප්‍රායෝගික ආර්ථික සමානාත්මතාව ඇති කළ විට නිදහසේ ඇතැම් අංග සීමා වන බව.
  - නිදහස හා සමානාත්මතාව අතර ඇති සම්බන්ධතාවය.
- නීතිය හා නීතියේ අධිපත්‍යය හැඳින්වීම
  - සංවිධිත සමාජයක් තුළ මිනිසුන්ගේ පැවැත්ම පාලනය කිරීම සඳහා අධිකාරී බලය පදනම් කොට ගෙන රාජ්‍ය පනවන ලද රෙගුලාසි නීතිය යන පදයෙන් හැඳින්වේ.
  - ඇරිස්ටෝටල්/ සල්මන්ඩ්/ තෝමස් හොබ්ස්/ ජෝන් ලොක්/ එච්. ආර් සෝල්ටූ/ හොලන්ඩ් ආදින්ගේ නිර්වචන වලින් නීතියේ විවිධ පැතිකඩ හඳුන්වාදීම.
- නීතියේ මූලාශ්‍ර
  - ව්‍යවස්ථාදායකය
  - යුක්තිය
  - නීති විශාරද මත
  - අධිකරණ තීරණ
  - සිරිත් විරිත්
  - ආගම
- නීති පැනවීමෙහිලා නීති මූලාශ්‍ර බලපාන ආකාරය පැහැදිලි කළ යුතුය.
- නීතියක පැවතිය යුතු මූලික ලක්ෂණ
  - අධිකාරී බලය
  - පුද්ගලයන්ගේ බාහිර සමාජ හැසිරීම පාලනය කිරීම.
  - නීති කඩකිරීම දඬුවම් ලැබීමට හේතුවක් වන බව.
  - සමාජයේ පොදු යහපත අරමුණු කොට ගෙන පැනවීම.
  - වෙනස්වන සමාජ අවශ්‍යතාවන් සහ ආශාවන් අනුව නීතිය වෙනස්වන බව.
  - නීති නිරවුල් හා පැහැදිලිව දැක්විය යුතු බව.

- නීති වර්ග







- නීතිය හා සදාචාරය අතර සම්බන්ධතාව
  - සදාචාරය නීතියේ මූලාශ්‍රයක් වීම
  - පුද්ගලයාගේ සදාචාරාත්මක තත්ත්වය උසස් කිරීම නීතියේ අරමුණක් බව.

- නීතිය හා සදාචාරය අතර වෙනස්කම්
  ( නීතියේ මූලික ලක්‍ෂණ හා සසඳමින් වෙනස ඉස්මතු කර දක්වන්න)

- පුද්ගලයා නීතියට අවනත වීම පිළිබඳ ඇති මත
  - සදාචාරාත්මක වාදය - මිනිසා නීතියට යටත් වන්නේ එමගින් ''ජනතා අභිමතය පිළිබිඹු වන නිසාය''
  - ප්‍රත්‍යක්‍ෂ මූලික නීතිවේදී මතය - '' ස්වාධිපතිත්වයේ ආඥාවක් වන බවයි''

- නීතියේ ආධිපත්‍යය
  නීතියට අනුව පාලනය කිරීම - නීතියේ ආධිපත්‍යය යනුවෙන් හැඳින්වේ.

- නීතියේ ආධිපත්‍යය පිළිබඳ සංකල්පය ( මහාචාර්ය A.V. ඩයිසිගේ මතයට අනුව)
  - පුද්ගලයෙකුට දඬුවම් කළ යුත්තේ පවත්නා නීතියට අනුව අධිකරණය මගින් පමණක් වීම.
  - නීතිය ඉදිරියේ සියළු දෙනාම සමාන වීම.
  - පුද්ගල අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම හා තහවුරු කිරීම නීතිය මගින් සිදුවිය යුතු අතර අයිතිවාසිකම් සමාජයෙන් හා සම්මතයෙන් හිමි වන බව.
  - ප්‍රායෝගිකව මෙම සංකල්පය බිඳවැටෙන බව.
  - නීතියේ ආධිපත්‍යය පිළිබඳ ජාත්‍යන්තර නීතිවේදීන්ගේ සමුළුවේ අදහස් විශ්ලේෂණය කිරීම.
- පුද්ගලික දේපල

## යහපාලනය

- 1980 දශකයෙන් පසු කාලය තුළ ඇතිවූ කතිකාවතින් ඉස්මතු වූ සංකල්පයකි.

- මෙම සංකල්පය ගොඩනැංවීම කෙරෙහි බලපෑවේ තුන්වන ලෝකයේ රටවල ආර්ථික සංවර්ධනය මන්දගාමී වීම සහ සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපා ඇති හේතු සාධක විමසා බැලීමේදීය.

- තුන්වන ලෝකයේ රටවල ආර්ථික හා මානව සම්පත් නිසි කළමනාකරණයක් නොකිරීම හේතුවෙන් ආර්ථික සංවර්ධනය මන්දගාමී වි ඇති බවත් ,එමගින් සමාජ සාධාරණත්වය ගොඩ නැගීම බිඳවැටී ඇති බවත් තහවුරු විය.

- අනවශ්‍ය ආකාරයෙන් බලය මධ්‍යගත වීම, රාජ්‍ය පාලනයේ අකාර්යක්ෂමතාව, රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම, රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම හා ක්‍රියාවට නැංවීම කෙරෙහි ජනතා සහභාගිත්වය නොමැතිවීම, අල්ලස හා දූෂණය ඉහළයාම, රාජ්‍ය පාලකයින් වගකීමෙන් තොර වීම යනාදී හේතු සාධක රටක් තුළ යහපාලනය බිඳ වැටීමට බලපා ඇති හේතු වේ.

- තුන්වන ලෝකයේ රටවල් පොදුවේ මුහුණ දී ඇති මෙම ගැටළුවලින් මිදීම සඳහා ඉදිරිපත් වූ එක් ක්‍රමවේදයක් වන්නේ යහපාලනය ගොඩනැගීමය.

- මෙම සංකල්පය ඉදිරියට ගෙන ඒම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන (UNDP) ද, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ට්‍රාන්ස්ෆේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය හා සංවර්ධනය සඳහා දායක වන වෙනත් ආයතන විසින් ද කටයුතු කර ඇත.

- මෙම සංකල්පය මගින් අවධාරණය කරන මූලික කරුණු කිහිපයකි.
  - සහභාගිත්වය
  - නීතියේ අධිපතිත්වය
  - වගකීම
  - විනිවිදභාවය
  - ප්‍රතිචාරාත්මක බව
  - සහමිතිකභාවය
  - කාර්යක්ෂමතාව සහ ප්‍රතිඵලදායීතාව
  - සාධාරණත්වය

- ආණ්ඩුකරණ ක්‍රියාවලියට සක්‍රීය ජනතා සහභාගිත්වය (Active People's Participation) ලබා ගැනීම වැදගත් යහපාලන මූලධර්ම භාවිතාවක් බව අවධාරණය කරන ජාත්‍යන්තර සංවිධාන දක්වයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම

- බිත්ති පුවත්පතක් සකස් කිරීම.
- ක්‍රියාකාරකමට අදාළ තොරතුරු පහත සඳහන් ශීර්ෂ ඔස්සේ ලබාගන්න.
  - අයිතිවාසිකම් පිළිබඳ ඉදිරිපත් වී ඇති නිර්වචන.
  - අයිතිවාසිකම් වර්ග කිරීම.
  - අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමට යොදා ඇති විධිවිධාන හා යාන්ත්‍රණයන්.
  - අයිතිවාසිකම් හා යුතුකම් අතර සම්බන්ධතාවය.
  - අයිතිවාසිකම් හා යුතුකම්වල ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය.
- කණ්ඩායම්වලට බෙදී මාතෘකාවලට අදාළව නිවැරදි තොරතුරු විවිධ මූලාශ්‍ර අතුරෙන් රැස් කරන්න.
- බිත්ති පුවත්පත පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

## මූලාශ්‍රය


1. **ද සොයිසා, එම්. ඕ. ඒ. (2003) දේශපාලන විද්‍යාවේ මූලික සිද්ධාන්ත කතෘ ප්‍රකාශන**
2. **දේශපාලන විද්‍යාවේ මූලිකාංග I (1998) කොළඹ අධ්‍යාපන ප්‍රකාශන**
3. **Mahajan, V.D (1998) Political Thery (Principles of political science) New Delhi; S. Chand and company Ltd'**

## ශ්‍රී ලංකාවේ පැවති යටත් විජිත පාලනයේ ස්වභාවය

**නිපුණතාව 07 :-** ශ්‍රී ලංකාවේ පැවති යටත් විජිත පාලනයේ ස්වභාවය හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම :-** **කාලච්ඡේද (50)**

7.1 බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමය තුළ ශ්‍රී ලංකාවේ සමාජීය, ආර්ථික, ව්‍යවස්ථා සහ දේශපාලන සංවර්ධනය හඳුනා ගනියි.

7.2 යටත් විජිත යුගයේ ක්‍රියාත්මක වූ සමාජ ව්‍යාපාර හඳුනා ගැනීම, ඒවා ක්‍රියාත්මක වි ඇති ආකාරය විනිවිද දකියි.

**ඉගෙනුම් ඵලය :-**

- යටත් විජිත යුගයේ ලංකාවේ සිදු වූ දේශපාලන, ආර්ථික සහ සමාජීය වෙනස්කම් පැහැදිලි කරයි.
- එක් එක් වෙනස්කම් හරහා ලංකාව තුළ ඇති දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රතිඵල ගවේෂණය කරයි.

**හැඳින්වීම :-**

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමය තුළ අනුගමනය කළ ප්‍රතිපත්තිවල බලපෑමෙන් ලංකාව තුළ සිදු වූ දේශපාලන, ආර්ථික, සමාජීය වෙනස්කම් මොනවාද? යන්න මෙම ඒකකය යටතේ සලකා බැලේ. ඒ යටතේ රාජාණ්ඩුවාදී පාලන ක්‍රමය අහෝසි වීම, යැපුම් මට්ටමේ ආර්ථික ක්‍රමය වෙනස් වීම, සාම්ප්‍රදායික සමාජ සම්බන්ධතා බිඳ වැටීම යනාදියට අමතරව බටහිර ප්‍රජාතන්ත්‍රවාදී පාලන මූලධර්ම පදනම් කරගත් ආණ්ඩු ක්‍රම ආයතන ආරම්භ වීම, වෙළඳ පොළ ආර්ථික ක්‍රමය බිහි වීම, ඉංග්‍රීසි අධ්‍යාපනය ආරම්භ වීම. වාණිජ මධ්‍යම පන්තියක් බිහිවීම, ධනවාදයට රට හැඩගැස්වීම යනාදී වෙනස්කම් පිළිබඳව හැදෑරීම මෙම ඒකකයෙන් බලාපොරොත්තු වේ.

**විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්**

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය යටතේ ශ්‍රී ලංකාව:

- දේශපාලන, ආර්ථික, සමාජීය වෙනස්කම් සහ ඒ කෙරෙහි බලපෑ හේතු සාධක
  - බ්‍රිතාන්‍ය පාලනය යටතේ ක්‍රියාවට නැංවූ දේශපාලන, ආර්ථික ප්‍රතිපත්ති හඳුනා ගැනීම.
  - එම ප්‍රතිපත්ති යටතේ ලංකාවේ සිදු වූ දේශපාලන, ආර්ථික සහ සමාජීය වෙනස්කම් හඳුනා ගැනීම.
- කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ යටතේ
  - ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම පදනම් කොට ගත් ආණ්ඩුකරණ ආයතන හඳුන්වා දීම.
  - වැඩවසම් ක්‍රමය අහෝසි කිරීම, නිදහස් ශ්‍රම වෙළඳපොළ ආරම්භය සහ වාණිජ වතු වගාව හඳුන්වා දීම.
  - නිර්බාධවාදී ආර්ථික ක්‍රමයක් යටතේ ධනවාදයේ වර්ධනයට දායක වීම.
  - නගර බිහිවීම, නාගරීකරණය ආරම්භවීම, ගම පදනම් කරගත් සමාජ සම්බන්ධතා මාලාව බිඳ වැටීම.
  - බටහිර අධ්‍යාපනය හඳුන්වා දීම.
  - ඉහත දැක්වූ හේතු සාධක වල ප්‍රතිඵල ලෙස උගත් මධ්‍යම

පන්තියක් බිහිවීම සඳහා අවශ්‍ය පදනම දැමීම
- නව අධිකරණ ආයතන පද්ධතියක් හඳුන්වා දීම.
- නීතියේ ආධිපත්‍යය සහිත පාලන ක්‍රමයක වර්ධනය සඳහා අවශ්‍ය පදනම දැමීම.

- මෙම ප්‍රතිසංස්කරණවල දේශපාලන, ආර්ථික සහ සමාජීය ප්‍රතිඵල විග්‍රහ කිරීම.
    - ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයකට ලංකාව හුරු කිරීමේ ආරම්භය.
    - ධනවාදී ආර්ථික ක්‍රමයකට ලංකාව පරිවර්තනයවීමේ ආරම්භය.
    - නිදහස් ශ්‍රම වෙළඳපොළ ක්‍රමයක් මගින් කුල කුල ක්‍රමය බිඳ වැටීමේ ආරම්භය සනිටුහන් වීම.
    - වාණිජවාදය පදනම් කර ගත් ධනපති මධ්‍යම පන්තියක් බිහි වීම.
    - බටහිර අධ්‍යාපනය ඇසුරින් වෘත්තීයමය සමාජ පන්තියක් බිහිවීම.
    - දේශීය කෘෂිකර්මාන්තය අඩපණවීම.
    - බටහිරකරණයට ගොදුරුවීම තුලින් සාම්ප්‍රදායික අංග ලක්‍ෂණ පිරිහීම.

ඉහත දැක්වූ හේතු සාධක වල සමස්ත ප්‍රතිඵලය ලෙස " නිර්බාධවාදී රාජ්‍ය ක්‍රමය" ස්ථාපිත වීම.

- 1910 - 1912 කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය, 1920 - 1921 මැනිං ප්‍රතිසංස්කරණය, 1924 මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ පහත සඳහන් මූලධර්ම පදනම් කර ගෙන විග්‍රහ කිරීම.
    - ගොඩනගන ලද ආයතන ව්‍යුහය.
    - බලතල, කාර්යයන් හා වගකීම.
    - අන්තර් ආයතනයන්ගේ සම්බන්ධතාවය.
    - ප්‍රායෝගිකව ක්‍රියාත්මක වූ ආකාරය.
    - දේශපාලන ප්‍රතිඵල

- **1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය**

ප්‍රතිසංස්කරණයට හේතු :-

- මැනිං ආණ්ඩු ක්‍රමයේ දුර්වලතා
    - වගකීම හා බලය බෙදා තිබීම
    - ලාංකික නායකයන් අනවශ්‍ය ආකාරයෙන් පරිපාලන කටයුතු වලට මැදිහත් වීම.
- පැවති ව්‍යවස්ථාවට එරෙහිව, නව ව්‍යවස්ථාවක් ලබා ගැනීමට පැවති උද්ඝෝෂණ
  උදා:- ලාංකික නායකයන් නව ප්‍රතිසංස්කරණයක් සඳහා උද්ඝෝෂණය කිරීම.
  ශ්‍රීමත් හ්‍යු ක්ලිෆර්ඩ් ආණ්ඩුකාරවරයා මෙම ආණ්ඩු ක්‍රමය විවේචනය කරමින් මෙය වෙනස් කිරීමේ අවශ්‍යතාව අවධාරණය කිරීම.
- ව්‍යවස්ථාදායක සභාවේ හා විධායක සභාවේ බලතල මුදල් කාරක සභාව වෙත ඒකරාශී වීම නිසා එම ආයතන දෙක දුර්වල වීම.
- සීමිත ඡන්ද බලය පුළුල් නොවීම.
- ලංකා සමාජයේ බිහි වී තිබූ විවිධ සංවිධාන වල ඉල්ලීම්.
  උදා:- 1926 ලංකා ජාතික සංගමයේ යෝජනා
- බ්‍රිතාන්‍යයන් විසින් යටත් විජිත සම්බන්ධයෙන් ගෙන ගිය ප්‍රතිපත්තියේ ඇතිවූ වෙනස්කම්.
- අසල්වැසි ඉන්දීය ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා ගෙන ගිය උද්ඝෝෂණ ව්‍යාපාර සහ ඔවුන් ලත් ජයග්‍රහණ.

ඩොනමෝර් කොමසාරිස්වරුන්ගෙන් ලාංකික නායකයන් කළ ඉල්ලීම්

- විවිධ සංවිධාන සහ පුද්ගලයෝ 141 ක් අදහස් හා යෝජනා ඉදිරිපත් කළහ. ඒ අතුරින් කණ්ඩායම් තුනක් වැදගත් වේ.
- ලංකා ජාතික සංගමයේ පහතරට සිංහල මධ්‍යම පාන්තික නායකයෝ (1927 වන විට ලංකා ජාතික සංගමය තුල ඉතිරිව සිටියේ ඔවුන් පමණි) කැබිනට් ක්‍රමයක් සහ ප්‍රදේශ බද නියෝජනයක් ඉල්ලා සිටියහ.
- සුළු ජාතික නායකයෝ කැබිනට් ක්‍රමයක් ලබා නොදෙන ලෙසත් ජාති මූල නියෝජනය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටියහ.
- මෙම දෙපිරිසම සර්ව ජන ඡන්ද බලය ලබා දීමට විරුද්ධ වූහ.
- ඒ.ඊ. ගුණසිංහ මහතා ප්‍රමුඛ කම්කරු නායකයෝ සර්වජන ඡන්ද බලය, ස්වරාජ්‍යය ඉල්ලා සිටියහ.

ඩොනමෝර් කොමිසමේ යෝජනා

- ආණ්ඩුකාරවරයා
- රාජ්‍ය නිලධාරීන් තිදෙනා
- අමාත්‍ය මණ්ඩලය
- රාජ්‍ය මන්ත්‍රණ සභාව
- විධායක කාරක සභාව
- සර්වජන ඡන්ද බලය හා ප්‍රදේශබද නියෝජනය හඳුන්වාදීම.

මෙම එක් එක් යෝජනාවන් පිළිබඳව වෙන් වශයෙන් ගුරුවරයා පංති කාමරය තුළ ඉගැන්වීම අවශ්‍ය වේ.

ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ යහපත් අයහපත් ලක්ෂණ :-

යහපත් ලක්ෂණ

- සර්ව ජන ඡන්ද බලය හා ප්‍රාදේශීය නියෝජන ක්‍රමය හඳුන්වා දීම.
- ලාංකික නියෝජිතයන්ට පාලනයට සහභාගිවීමට වැඩි අවස්ථාවක් උදා වීම.
- ප්‍රභූ පන්තියට පමණක් සීමා වූ දේශපාලන ක්‍රියාකාරකම් වලට සාමාන්‍ය ජනතාවට ද සම්බන්ධ වීමට අවස්ථා හිමි වීම.
- ලාංකික නියෝජිතයින් වැඩි වගකීමකින් යුතුව ක්‍රියා කිරීමට පෙළඹීම.
- ලංකාව සුභසාධන රාජ්‍යයක් කරා වර්ධනය වීම.
  (සමකාලීන ලෝක ආර්ථිකය සුභසාධනවාදය කරා ගමන් කිරීම හරහා මෙම ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය ද සිදු වූ බැවින් සුභසාධන රාජ්‍යයක් කරා ගමන් කිරීමේ දොරටු විවෘත විය.)
- ලාංකික නියෝජිතයන්ට ව්‍යවස්ථාදායක හා විධායක කටයුතු සම්බන්ධයෙන් වැඩි අත්දැකීමක් හිමි වීම.
- දේශපාලන පක්ෂ ක්‍රමය සඳහා අවශ්‍ය මූලබීජ තැන්පත් වීම.
- සුළු ජන කොටස් වලටද දේශපාලන ක්‍රියාදාමයට වැඩි වැඩියෙන් සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාව ලැබීම.

අයහපත් ලක්ෂණ

- විධායක කාරක සභා මගින් රට පාලනය කිරීම තුළින් රටේ පාලනය අකාර්යක්ෂම හා දුර්වල එකක් වීම.
- ඇමති මණ්ඩලය තුළ පාලන කොටස් දෙකක් පැවතීම.
  1. රාජ්‍ය නිළධාරීන් තිදෙනා
  2. ලාංකික ඇමතිවරුන් හත් දෙනා

- අමාත්‍ය මණ්ඩලය තුළ සාමූහික වගකීමක් නොතිබීම.
- රාජ්‍ය නිළධාරීන් තිදෙනා මෙරට පාලනය සම්බන්ධයෙන් වැඩි වගකීමක් ඉසිලීම.
- ආණ්ඩුකාරවරයා සතු අවධාරිත හා නිෂේධ බලය නිසා ඔහුගේ බලය වර්ධනය වීම.
- මන්ත්‍රීවරයාගේ පෞද්ගලික ප්‍රතිරූපය සාමූහිකත්වය ඉක්මවා ඉස්මතුවීම.

- රාජ්‍ය පරිපාලනය අධිකරණ හා පළාත් පාලන ක්ෂේත්‍රවල සිදුවූ වෙනස්කම් 1833 සිට 1948 දක්වා

  1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ මගින් පොදු පරිපාලන ක්‍රමයක් සහ තනි අධිකරණ ක්‍රමයක් ඇති කිරීම.
  - ලංකාවේ පැවති පළාත් 16 පළාත් 5 දක්වා අඩු කිරීම.
  - එම පළාත් 5 සඳහා ආණ්ඩුවේ ඒජන්තවරයෙකු බැගින් පත් කිරීම.
  - මුළු දිවයිනටම බලපාන පරිදි ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රධානත්වයෙන් තනි අධිකරණ ක්‍රමයක් පිහිටු වීම හා විධායකයේ බලපෑමෙන් එය නිදහස් කිරීම.
  - යුරෝපීයයන් සහ ලාංකිකයන් යන දෙකොටසටම බලපාන පරිදි තනි නීති ක්‍රමයක් තනි අධිකරණ ක්‍රමයක් ඇති කිරීම.
  - නීතියේ ආධිපත්‍ය පිළිබඳ මූලධර්මය ක්‍රියාත්මක කිරීම.
  - දිවයිනේ ප්‍රධාන නගරවල දිස්ත්‍රික් අධිකරණ පිහිටුවීම.

1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මගින්
  - නීති ලේකම්වරයාට රටේ අධිකරණ පාලනයේ වගකීම පැවරීම. මොහු ආණ්ඩුවේ නීති උපදේශකයා වීම
  - රටේ පරිපාලනය හා රාජ්‍ය සේවය සම්බන්ධ පාලන වගකිම රාජ්‍ය ලේකම් වෙත පැවරීම.
  - පළාත් පාලනය සම්බන්ධයෙන් වූ සිය වගකීම් පළාත් පාලනය පිළිබඳ විධායක කාරක සභාවට පැවරීම. (මහ නගර සභා , නගර සභා, ගම් කාර්ය සභා යනාදී පළාත් පාලන ආයතනවලට අදාළ කරුණු)

යටත් විජිත යුගයේ ක්‍රියාත්මක වූ සමාජ ව්‍යාපාර

ආගමික පුනර්ජීවන ව්‍යාපාරය

- බෞද්ධ, හින්දු, ඉස්ලාම් ආගම් වෙත කතෝලික ආගමෙන් එල්ල වූ බලපෑම් නිසා ආගමික පුනර්ජීවන ව්‍යාපාරය ආරම්භ වීමට අවශ්‍ය පදනම ගොඩ නැගුණි.

  ඒ සඳහා නායකත්වය ගත් ආගමික නායකයන්

| | | |
|---|---|---|
| - බෞද්ධ ආගම | - | වලානේ සිද්ධාර්ථ හිමි. |
| | - | හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි |
| | - | රත්මලානේ ධර්මාරාම හිමි |
| - හින්දු ආගම | - | ආරුමුග නාවලර් තුමා |
| | - | පොන්නම්බලම් රාමනාදන් මහතා |
| | - | පොන්නම්බලම් අරුණාචලම් මහතා |
| - ඉස්ලාම් ආගම | - | එම්.සී. සිද්දි ලෙබ්බේ තුමා |
| | - | ටී.බී. ජයා මහතා |
| | - | අයි. එල්. එම්. අබ්දුල් අසීස් මහතා |

- 1870 දශකයේදී ඇති වූ බෞද්ධ, හින්දු, ඉස්ලාම් ප්‍රබෝධය තුළින් ජාතික ව්‍යාපාරයේ පසුබිම සකස් වුණි.
- ආගමික පුනර්ජීවන ව්‍යාපාරය තුළින් ඇති වූ ජාතික ප්‍රබෝධය, ජාතික ව්‍යාපාරය හරහා දේශපාලන මුහුණුවරක් ගත් ආකාරය කෙරෙහි අවධානය යොමු කරමින් පාඩම සංවර්ධනය කරන්න.

**ජාතික ව්‍යාපාර**

- වැඩවසම් ක්‍රමය බිඳ වැටීමත් සමග පොල් වගාව, මිනිරන් කර්මාන්තය, කරත්ත ප්‍රවාහන කොන්ත්‍රාත්තු , මත්පැන් පෙරීම ආදී කටයුතු තුළින් ධනය රැස් කරගත් මධ්‍යම පන්තියක් බිහි විය.
- එම මධ්‍යම පන්තියේ දරුවන්ට රාජ්‍ය සේවයේ උසස් වෘත්තීන්ට ඇතුළත් වීම සඳහා පුළුල් ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබා දීම.
- යුරෝපා ජාතීන් විසින් සිදු කරන ලද ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය (ජෝර්ජ් වොල්) හා ලාංකිකයන් විසින් 19 වන සියවසෙන් පසු කාලයේ දී ජාතික හැඟීමකින් යුතුව නැගී සිටීම
- ජාතික ව්‍යාපාරයේ ආරම්භක කණ්ඩායම ආගමික පුනර්ජීවන ව්‍යාපාරයයි.
- එම ව්‍යාපාරය 1915 සිංහල - මුස්ලිම් කෝලාහලයෙන් පසු අවදිය තුළ යටපත් විය.
- මේ සඳහා ආගමික උද්ඝෝෂණ උපයෝගී කර ගැනීම හා ක්‍රිස්තියානි විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
- ජාතික ව්‍යාපාරයකට අවශ්‍ය පදනම ග්‍රාමීය මට්ටම දක්වා ගොඩ නැගීම අමද්‍යප ව්‍යාපාරය හරහා සිදු වීම.
- ජාතික ව්‍යාපාරයේ නායකත්වය මධ්‍යස්ථ මතවාදීන්, ගතානුගතිකවාදීන් සහ රැඩිකල්වාදීන් යටතට පත් විය.
- ලංකා ප්‍රතිසංස්කරණ සංගමය (1917) ජාතික ව්‍යාපාරය සඳහා අවශ්‍ය පදනම සැපයීම.
- 1919 දී ලංකා ජාතික සංගමය ජාතික ව්‍යාපාරයේ නිළ ආරම්භය සනිටුහන් කිරීම.
- බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය තුළ අභ්‍යන්තර ස්වයංපාලිත සාමාජිකයකුගේ තත්ත්වය ලංකාවට හිමි කර ගැනීම.
- මෙරට ජාතික ව්‍යාපාරය ඉන්දීය ජාතික ව්‍යාපාරයට සාපේක්ෂව පහත සඳහන් ලක්ෂණ නිරූපණය කළේය.
  - ප්‍රභූ පන්තික ව්‍යාපාරයක් වීම
  - මධ්‍යම පන්තික අරමුණුවලට පමණක් සීමා වීම.
  - ප්‍රතිසංස්කරණවාදී ව්‍යාපාරයක් වීම.
  - ව්‍යවස්ථානුකූල හා සම්මුතිකාමී ස්වරූපයක් ගැනීම.
- 1921 දී ඇති කළ ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ ජාතික ව්‍යාපාරයේ මුල්ම බෙදීමට හේතු විය.
- 1927 වන විට මෙය භේදභින්න වී යෑම නිසා එක් එක් කණ්ඩායම් එකිනෙකට වෙනස් දිශාවන්ට ගමන් කළේය. (පහත රට සිංහල, උඩරට සිංහල, සුළුජාතීන්)
- ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳ පොදු එකඟතාවයක් ඇති කර ගැනීමට නොහැකි තත්ත්වයක් මෙමඟින් උදා වූ අතර ලංකා ජාතික සංගමය තනි සිංහලයන්ගේ සංවිධානයක් බවට පත් විය.
- එහි ප්‍රතිඵලයක් වශයෙන් බෙදා වෙන් කිරීමේ පාලන ප්‍රතිපත්තිය තව දුරටත් බ්‍රිතාන්‍යයන්ට ක්‍රියාත්මක කළ හැකි වූ අතර එමගින් ජාතික අභිමානයක් ඇති විය.

**කම්කරු ව්‍යාපාරය**

- වාමාංශික ව්‍යාපාරයේම පැතිකඩකි.
- 1922 දී ඒ. ඊ. ගුණසිංහ මහතා විසින් ලංකා කම්කරු සංගමය පිහිටුවීම.
- ජාතික ව්‍යාපාරයේ ඇතැම් නායකයෝ කම්කරු ව්‍යාපාරය සඳහා විවිධ බාධා ඇති කළහ.

  උදා :- 1924 දී එච් .ජේ. සී. පෙරේරා සභාපතිත්වය දැරූ ලංකා ජාතික සංගම් සම්මේලනය
- 1923 - 1925 අතර කාලයේ ලංකාවේ ප්‍රථම වැඩ වර්ජනය ඇති වීම.
- 1928 - 1929 අතර කාලයේ කම්කරු පන්තිය වඩාත් සටන්කාමී මාවතක් කරා ඇදීයාම.

  උදා :- ට්‍රැම්කාර් වර්ජනය හා මරදාන පොලීසිය ගිනි තැබීම.

**වාමාංශික ව්‍යාපාරය**

- 1935 දෙසැම්බර් මස ලංකා සම සමාජ පක්ෂය පිහිටුවීම මෙරට වාමාංශික ව්‍යාපාරයේ සංවිධානාත්මක ආරම්භයයි.
- වාමාංශික ව්‍යාපාරය බිහි කිරීමට දායක වූ තරුණ නායකයින් ඊට පෙර වෘත්තීය සමිති ව්‍යාපාරය හා සාමාන්‍ය දේශපාලනය තුළ සිය ක්‍රියාකාරකම් ආරම්භ කර තිබුණි.
- වාමාංශික ව්‍යාපාරයට අවශ්‍ය පිරිස් බලය , අනුගාමිකත්වය , දේශපාලන ශක්තිය ලබා දුන්නේ නාගරික කම්කරු පන්තියයි.
- රැඩිකල් මධ්‍යම පාන්තික බුද්ධිමතුන් විසින් මෙහි නායකත්වය උසුලන ලදී.
- මෙම ව්‍යාපාරය ඉදිරියට ගමන් කිරීම සඳහා සමකාලීනව පැවති ආර්ථික අර්බුදය හේතු විය.
- වාමාංශික ව්‍යාපාරයේ ප්‍රකාශිත ප්‍රධාන අරමුණු 02 ක් විය.
  1. ජාතික නිදහස දිනා ගැනීම.
  2. සමාජවාදී සමාජ ක්‍රමයක් ගොඩ නැගීම.
- 1932 වන විට වාමාංශික ව්‍යාපාරයේ කාර්යයන් ප්‍රධාන ක්ෂේත්‍ර 02 ක් කෙරෙහි යොමු විය.
  - තරුණ ක්ෂේත්‍රය
  - කම්කරු ක්ෂේත්‍රය

වාමාංශික ව්‍යාපාරයේ ආරම්භය හා වර්ධනය කෙරෙහි බලපෑ විවිධ හේතු :-

- 1930 ගණන් ආරම්භයේ ඇති වූ ලෝක ආර්ථික අර්බුදය
- කම්කරු ව්‍යාපාරයේ නැගී ඒම
- 1930 වනවිට බටහිර අධ්‍යාපනය හැදෑරීමෙන් හා 1921 ලංකාවේ ආරම්භ කරන ලද විශ්ව විද්‍යාල කොලීජිය තුළින් අධ්‍යාපනය හදාරා බිහිවන උගත් , තරුණ කොටස් රැඩිකල්වාදී වාමාංශික දේශපාලනයට නැඹුරු වීම.
- ජාතික නිදහස දිනා ගැනීම සම්බන්ධයෙන් ලංකා ජාතික සංගමය අනුගමනය කළ ඔතැනි ක්‍රියා කලාපය.
- 1917 ඇතිවූ රුසියානු විප්ලවය.
- පොපිමල් ව්‍යාපාරයට එරෙහිව 1933 දී ආරම්භ කරන ලද සූරියමල් ව්‍යාපාරය.
- 1934 වර්ෂයේ අවසාන භාගයේදී ඇතිවූ මැලේරියා වසංගතය

- සූරියමල් ව්‍යාපාරය හා මැලේරියා වසංගතය වාමාංශික ව්‍යාපාරයේ ආරම්භය හා වර්ධනයට විශාල දායකත්වයක් සැපයූ අතරම ජනතා ව්‍යාපාරයක් බවට එය පත්වීමට අවශ්‍ය අඩිතාලම ද සැපයීය.
- 1935 දෙසැම්බර් 18 දින ලංකා සමසමාජ පක්ෂය පිහිටුවා ගැනීමේ දී ප්‍රකාශයට පත් කළ ප්‍රධාන අරමුණු 03 ක් විය.
  - I පූර්ණ ජාතික නිදහස දිනා ගැනීම
  - II නිෂ්පාදනය, බෙදා හැරීම හා හුවමාරු මාධ්‍යයන් සමාජ සන්තක කිරීම.
  - III පන්ති, කුල,වර්ග හා ස්ත්‍රී, පුරුෂ භේදයන්ගෙන් පැන නැගුණු සියළු සමාජ හා ආර්ථික භේද නැති කිරීම.
- බ්‍රිතාන්‍ය යටත් විජිතභාවයෙන් නිදහස දිනා ගැනීම සඳහා ලංකා ජාතික සංගමය අනුගමනය කළ ඔතැනි පිළිවෙතින් ඔවුන් ඈත් කර රැඩිකල්වාදී පිළිවෙතක් කරා කරා යොමු කිරීම වාමාංශික ව්‍යාපාරය හරහා සිදුවිය.
- එහි ප්‍රතිඵලයක් වශයෙන් 1942 දී බ්‍රිතාන්‍ය පාලකයන් විසින් සමසමාජ නායකයින් අත් අඩංගුවට ගැනීමත්, ලංකා සමසමාජ පක්ෂය තහනම් සංවිධානයක් බවට පත් කිරීමත් සිදු කරනු ලැබීය.
- වර්තමානය වන විට වාමාංශික ව්‍යාපාරය තුළ ඇති වූ මතභේදාත්මක හේතු නිසාවෙන් එය දියාරු දේශපාලන සංවිධානයක් බවට පත්ව ඇත.

# යටත් විජිත යුගයේ ව්‍යවස්ථාදායකයේ වර්ධනය
# 1833 - 1931 දක්වා වූ කාලය

## 1833 කෝල්බෲක් ව්‍යවස්ථාදායක සභාව

- මුළු සංඛ්‍යාව 15
  - නිළලත් 09
  - නිළනොලත් 06
    - යුරෝපීය 03
    - සිංහල 01
    - ද්‍රවිඩ 01
    - බර්ගර් 01

## කෲව් මැකලම් ව්‍යවස්ථාදායක සභාව

- මුළු සංඛ්‍යාව 21
  - නිළලත් 11
  - නිළනොලත් 10
    - නාමකරණයෙන් 06
      - පහත රට සිංහල 02
      - දෙමළ 02
      - උඩරට 01
      - මුස්ලිම් 01
    - ඡන්ද බලයෙන් 04
      - බර්ගර් 02
      - යුරෝපීය 01
      - උගත් ලාංකික 01

## 1920 /21 මැනිං ව්‍යවස්ථාදායක සභාව



## 1924 මැනිං ඩෙවොන්ෂයර් ව්‍යවස්ථාදායක සභාව




## 1931 - රාජ්‍ය මන්ත්‍රණ සභාව



## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම
## ශ්‍රී ලංකාවේ යටත් විජිත රාජ්‍යයේ ස්වභාවය හඳුනා ගනියි

- සංවාද මණ්ඩපය
- සිසුන් කණ්ඩායම් කර ඔවුන්ගේ අභිමතය පරිදි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය බැගින් තෝරාගෙන ඊට අදාළව පහත සඳහන් ශීර්ෂ යටතේ කරුණු රැස්කර ගැනීමට ඉඩ ලබා දෙන්න.
  - ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ගෙන ඒමට හේතු
  - හඳුන්වාදුන් ප්‍රතිසංස්කරණ
  - ඒවායේ දේශපාලන වැදගත්කම / ප්‍රතිඵල
- නියමිත කාලය තුළ තොරතුරු ගොනු කර ගැනීමෙන් අනතුරුව සංවාද මණ්ඩපයක් වශයෙන් සිසුන්ට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සංවාද මණ්ඩපය සංවිධානය කර ගැනීම, මෙහෙයවීම, තේමා වෙන්කර ගැනීම, සංවර්ධනාත්මක හා නිර්මාණශීලී අදහස් ඉදිරිපත් කිරීම හා තර්කානුකූල බව පිළිබඳ වද අවධානය යොමු කරන්න.

## මූලාශ්‍රය


1. ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම විකාශය හා ජාතික ව්‍යාපාරය (1802 - 1927) එම්. යූ. ද සිල්වා
2. බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය ( සිංහල බෞද්ධ ජාතිවාදය සහ ලංකා ජාතික සංගමය)
3. ලංකා ආණ්ඩුක්‍රම විකාශනය (1796 - 1948) - බී. සී පෙරේරා
4. ජාතික ව්‍යාපාරය , ව්‍යවස්ථා වර්ධනය හා වාමාංශික ව්‍යාපාරයේ උපත - ලක්සිරි ප්‍රනාන්දු
5. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය සහ දේශපාලනය - අතුල විතානවසම්
6. ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා විකාශනය -
   නීතිඥ රජිත පණ්ඩිතසේකර, නීතිඥ නිරෝෂ් බණ්ඩාර
7. ලංකා ආණ්ඩු ක්‍රම විකාශය - ඩබ්ලිව්. ජයවර්ධන
8. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශය ( 1815 - 1977 ) - කේ. වැන්සස් පෙරේරා
9. ශ්‍රී ලංකාවේ ඉතිහාසය ( සිවුවන කොටස ) - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
10. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශය හා වර්ධනය (තුලනාත්මක අධ්‍යාපනයක් ) - කමල් ආරියසිංහ
11. සංස්කෘතිය - ත්‍රෛමාසික ශාස්ත්‍රීය සංග්‍රහය 2002
    ජනවාරි - පෙබරවාරි - මාර්තු
    සංස්කෘතික අමාත්‍යාංශයේ සංස්කෘතික දෙපාර්තමේන්තුව
12. ලංකා ආණ්ඩුක්‍රම විකාශය 1796 - 1948 - බී. සී. පෙරේරා

# නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේ පසුබිම

**නිපුණතාව 08** :- නිදහසින් පසු කාලය තුළ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේ පසුබිම් සාධක හඳුනා ගනී.

**නිපුණතා මට්ටම** :- **කාලච්ඡේද** (50)

- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේ පසුබිම් සාධක විග්‍රහ කරයි.
- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ආයතන තුලනාත්මකව අධ්‍යයනය කරයි.

**ඉගෙනුම් ඵලය** :-

- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය කෙරෙහි බලපෑ පසුබිම් සාධක විග්‍රහ කරයි.
- එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මගින් නිර්මාණය කළ ආයතනයන්ගේ ස්වරූපය, බලතල හා කාර්යයන් විග්‍රහ කරයි.
- මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුලනාත්මකව අධ්‍යයනය කරමින් ඒවායේ සමාන හා අසමාන ලක්ෂණ හඳුනා ගනියි.

**හැඳින්වීම** :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධ්‍යයනයේදී අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් තිබේ. ප්‍රථම කරුණ වන්නේ ව්‍යවස්ථා සම්පාදනය කෙරෙහි බලපාන දේශපාලන, ආර්ථික හා සමාජ පසුබිම් සාධක හඳුනා ගැනීමය. හේතුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වූ කලී තත්කාලීනව පවතින දේශපාලන, ආර්ථික හා සමාජ සාධකයන්ගේ ප්‍රතිඵලයක් වීමය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින් කරනුයේ ආණ්ඩුකරණය හා සම්බන්ධ ආයතන පද්ධතිය ගොඩ නැගීම පමණක් නොවේ. දේශපාලන සමාජයක් අයත්කර ගැනීමට අපේක්ෂා කරන දේශපාලන ආර්ථික හා සමාජ ඉලක්කයන්ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින් නිරූපණය වේ.ව්‍යවස්ථානුකූල දර්ශනය යනුවෙන් මෙය හැඳින්වේ. ව්‍යවස්ථානුකූල දර්ශනය හැඩ ගැසෙන්නේ තත්කාලීනව පවතින දේශපාලන ආර්ථික හා සමාජ විශ්වාසයන් පදනම් කොට ගෙනය. එබැවින් ව්‍යවස්ථා සම්පාදනයේදී බලපෑම් කරන පසුබිම් සාධක හඳුනා ගැනීම ව්‍යවස්ථාව මගින් ගොඩනගන ලද ආණ්ඩුකරණ ආයතන හඳුනා ගැනීම සඳහා අවශ්‍යයෙන්ම කළ යුත්තක් වේ.

දෙවනුව අවධානය යොමු කළ යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නිර්මාණය කළ ආයතන පද්ධතියේ ස්වරූපය, බලතල හා කාර්යයන් හඳුනා ගැනීමය. නිදහසින් පසු කාලය තුළ මෙරට මේවන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුනක් ක්‍රියාවට නංවා ඇත. මෙම ව්‍යවස්ථා මගින් සපයන ලද ව්‍යවස්ථානුකූල දර්ශනය ගොඩනගන ලද ආයතන පද්ධතිය, ඒවායේ බලතල හා කාර්යයන් මෙන්ම අන්තර් ආයතනික සම්බන්ධතාවන්ද අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට වෙනස් වේ. මේවා පිළිබඳව තුලනාත්මකව අධ්‍යයනය කළයුතු අතර එම ආයතනයන්ගේ සාපේක්ෂ වාසි අවාසි සහ යහපත් හා අයහපත් ලක්ෂණ හඳුනාගත හැක්කේ එසේ කරණු ලබන තුලනාත්මක අධ්‍යයනයකින් පමණි.

**විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්**

**සෝල්බරි ව්‍යවස්ථාව සම්පාදනය කිරීමෙහිලා බලපෑ පසුබිම් සාධක**

1943 මැයි 26 දින බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් නිකුත් කරණ ලද ප්‍රකාශනයක් මගින් ලංකාවේ ඇමතිවරුන්ට ව්‍යවස්ථා යෝජනා සැලැස්මක් සම්පාදනය කිරීමට අවශ්‍ය බලය ලබා දුන්නේය. එසේ සකස් කරනු ලබන ව්‍යවස්ථා කෙටුම්පත කොමිසමක් මගින් පරීක්ෂා කිරීමටද යෝජනා විය. ඉහත විධි විධානයන්ට යටත්ව සකස් කරනු ලැබූ සෝල්බරි ව්‍යවස්ථාව සම්බන්ධව සෝල්බරි කොමිසම ඉදිරියේ

මෙරට විවිධ ජන කණ්ඩායම්වලට අයත් නියෝජිතයෝ ස්වකීය අදහස් ඉදිරිපත් කළහ. ඒ අනුව සෝල්බරි ව්‍යවස්ථාව සම්පාදනය කිරීමෙහිලා බලපෑ පසුබිම් සාධක හඳුනාගත හැක්කේ සෝල්බරි කොමිසම ඉදිරියේ මෙරට නායකයින් ලබාදුන් සාක්ෂි සහ සෝල්බරි කොමිසම විසින් අවධාරණය කළ බ්‍රිතාන්‍ය කිරීටයේ අභිලාෂයන් තුළින්ය. ඒ අනුව සෝල්බරි ව්‍යවස්ථාව සම්පාදනයෙහිලා බලපෑ පසුබිම් සාධක පහත සඳහන් ආකාරයට හඳුනා ගත හැක.

- ප්‍රජාතන්ත්‍රවාදී සාරධර්ම ආරක්ෂා කරගැනීම
- සුළු ජාතීන් ආරක්ෂාකර ගැනීම
- බ්‍රිතාන්‍යයට සමාන දේශපාලන ක්‍රමයක වර්ධනය
- අධිකරණයේ ස්වාධීනත්වය
- පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වය
- ශක්තිමත් සිවිල් පරිපාලනයක් ගොඩ නැගීම
- බලතල මධ්‍යගත කිරීම

සෝල්බරි කොමිසම ඉදිරියේ සාක්ෂි දුන් මෙරට නායකයින්ගේ බහුතර අදහස වූයේ අනාගත ව්‍යවස්ථාවක ප්‍රජාතන්ත්‍රවාදී සාරධර්ම ව්‍යාප්ත කිරීමේ මූලධර්ම අන්තර්ගත කළ යුතු බවයි. අනෙක් අතට ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන බ්‍රිතාන්‍යය විසින් ලබා දෙනු ලැබූ ව්‍යවස්ථාවක එවැන්නක් අන්තර්ගතවීම අනිවාර්ය විය.

ස්වදේශීය ජනතාවට බලය පැවරූ ව්‍යවස්ථාව පිළිබඳ දෙමළ ජන නායකයින් විරෝධය ප්‍රකාශ කිරීමට හේතු වූයේ බහුතරයේ පාලනයක් ස්ථාපිත වෙනු ඇතැයි යන භීතියයි. ඒ අනුව ව්‍යවස්ථාව තුළ අඩංගු වූ සුළු ජාතික රැකවරණ ස්ථාපිත කිරීම සඳහා සුළු ජාතික නායකයින් ගෙන ගිය උද්ඝෝෂණ ප්‍රබල ලෙස බලපා ඇත. මේවන විට ශ්‍රී ලංකාවේ ලාබාල අවධියක පැවති පක්ෂ ක්‍රමය බ්‍රිතාන්‍යයේ මෙන් ද්වී පක්ෂ ක්‍රමයක් ඇති කිරීමට කටයුතු කිරීම අවධාරණය කළේය.

**1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේ දී බලපෑ පසුබිම් සාධක**

1948 පෙබරවාරි 04 දින ලංකාව නිදහස ලැබුවායැයි කීවද, පූර්ණ නිදහසක් නොලැබුණේය යන මතය 1956 වර්ෂයෙන් පසුව බිහි වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන උද්ඝෝෂණයක් ලෙස ඉදිරියට ගෙන ගියේය. ලංකා පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීති ව්‍යවස්ථා විරෝධී යැයි බ්‍රිතාන්‍යය ප්‍රිවි කවුන්සලය මගින් ප්‍රකාශ කරන විටත්, බ්‍රිතාන්‍ය ගුවන් සහ නාවික නඳවුරු මෙරට ක්‍රියාත්මක වන විටත් පාර්ලිමේන්තුව පනවන ලද නීති බ්‍රිතාන්‍ය සිවිල් නිළධාරීන් කඩා කප්පල් කරනවා යන චෝදනා මත මෙරට ආණ්ඩුව තව දුරටත් ලංකාව තුළ ඩොමීනියන් තත්ත්වය ඇගයිය නොහැකි බවට තර්ක කළහ මේනිසා 1956 සිට පත් වූ සෑම ආණ්ඩුවක්ම නව ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම පිළිබඳව කරුණු සලකා බලා ඇත.

සෝලබරි ආණ්ඩුක්‍රමයට මුලින්ම විරුද්ධත්වය ප්‍රකාශ කළේ මෙරට වාමාංශිකයින්ය. මේ සම්බන්ධව ඔවුහු කරුණු කිහිපයක් ඉදිරිපත් කළහ.

I ලංකාව පොදු රාජ්‍ය මණ්ඩලය තුළ ඩොමීනියන් රාජ්‍යයක් වීම.

II සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළ පැවතියාවූ නියෝජනයේ අඩුපාඩු

III සෙනෙට් මණ්ඩලය තුළ පැවතියාවූ අඩුපාඩු හා දුබලතාවයන්

මෙවැනි අඩුපාඩු සහ ඔවුන් තුළ පැවති සමාජවාදී දෘෂ්ටිකෝණය නිසා සෝල්බරි ව්‍යවස්ථාව තුළ පැවති ධනපති ප්‍රජාතන්ත්‍රවාදය ඔවුහු ප්‍රතික්ෂේප කළහ.

ඉන්දියාව බ්‍රිතාන්‍ය පාලනයෙන් මිදීමත් සමඟම ඩොමීනියන් තත්ත්වයෙන් මිදී පොදු රාජ්‍ය මණ්ඩලයේ ස්වාධීන රාජ්‍යයක් බවට පත්වේ. එමගින් ඉන්දියාවේ ස්වාධීනත්වය තහවුරු වූ අතර ව්‍යවස්ථාවට මූලික අයිතිවාසිකම් වැනි නවාංගද ඇතුළත් කළේය. මෙහි ආභාෂය ලබන ලාංකිකයෝ නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ අවශ්‍යතාවය ප්‍රකාශ කළෝය.

1956 බලයට පත්වූ බණ්ඩාරනායක මහතා පොදු රාජ්‍ය මණ්ඩලීය අගමැති සමුළුවේදී

ශ්‍රී ලංකාව පොදු රාජ්‍ය මණ්ඩලය තුළ සමූහාණ්ඩුවක් බවට පත්වීමේ අපේක්ෂාවෙන් සිටින බව ප්‍රකාශ කරන ලදි.

ආණ්ඩුක්‍රමවේදීන් පොදුවේ දැක්වූ අදහස් සලකා බලන විට සෝල්බරි ව්‍යවස්ථාව සම්පාදනය කරනවාට වඩා නව ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම යෝග්‍ය බව ඔවුන්ගේ තර්කය විය. එම තර්ක වලට අනුව ඒවායේ අඩංගු පොදු ලක්ෂණ පහත දැක්වෙන ආකාරයට සඳහන් කළ හැක.

I ලංකාව පොදු රාජ්‍ය මණ්ඩලය තුළ සමූහාණ්ඩුවක් බවට පත්වීම.

II සෙනෙට් මණ්ඩලය ඇතුළු ප්‍රජාතන්ත්‍රීය නොවූ අංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීම.

III සිංහල හා දෙමළ භාෂාවලට සමතැන් දීම.

IV පළාත් පාලන කටයුතු පුළුල් කිරීම.

මෙම කරුණු පදනම් කරගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයක් මගින් නව ව්‍යවස්ථාවක් සම්පාදනය සඳහා විධිවිධාන යෙදිය යුතු බව බොහෝ දෙනාගේ මතය විය.

**1978 ආණ්ඩුක්‍රමය බිහිවීමට බලපෑ පසුබිම් සාධක**

1972 පළමු ජනරජ ව්‍යවස්ථාව සම්පාදනයේ පටන් ජේ.ආර්. ජයවර්ධන මහතා එයට විරෝධය පෑවේය. පාර්ලිමේන්තුවට වගකීමට බැඳී නොසිටින පූර්ණ බලතල වලින් යුත් ජනාධිපති විධායකයක් සහිත ආණ්ඩුක්‍රමයක් බිහිකර ගැනීමට ඔහුට අවශ්‍ය විය. 1966 විද්‍යාභිවර්ධන සංගමයේ 22 සම්මේලනයේදී කරනු ලැබූ දේශපාලනයෙන්ද ඔහු මෙම අදහස අවධාරනය කර තිබුණි. ජයවර්ධන මහතා තමන් බලයට පත් වූ විගසම මෙම ආණ්ඩුක්‍රම රටාව වෙනස් කරන බවට ප්‍රතිඥා දී තිබූ අතර 1977 මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයද 1972 ව්‍යවස්ථාව වෙනස් කිරීම සඳහා ජනතාවගෙන් වරමක් ඉල්ලා තිබුණි. මැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂය විශිෂ්ට ජයක් අත්පත් කර ගන්නා අතර ඒ අනුව 1972 ව්‍යවස්ථාව වෙනස් කිරීමට විධිවිධාන යොදනු ලබයි. ඒ අනුව 1978 ව්‍යවස්ථාව සම්පාදනයෙහි ලා බලපෑ පසුබිම් සාධක පහත සඳහන් ආකාරයට හඳුනා ගත හැක.

I 1977 මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය 5/6ක බහුතරයක් ලබා ගැනීම.

II එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය ජේ. ආර්. ජයවර්ධන මහතා විසින් ඉසිලීම. ඔහු 1960 දශකයේ සිටම විධායක ජනාධිපති ආණුඩුක්‍රමයක් පිළිබඳව අදහස් ඉදිරිපත් කළේය.

III පැවති ව්‍යවස්ථාවේ දුර්වලතා
1972 ව්‍යවස්ථාවට අනුව වසර 5ක ආණ්ඩු කාලය තුළ වසරක් මැතිවරණ ජයග්‍රහණය භුක්තිවිඳීමටත්, වසරක් ඉදිරි මැතිවරණය සඳහා සූදානම් වීම සඳහා යෙදවීමට සිදුවන නිසා සංවර්ධනය සඳහා කාලය අල්ප විය.

IV කඩිනම් සංවර්ධනය සඳහා බලය මධ්‍යගත කිරීමට තිබූ අවශ්‍යතාව.
1972 - අංක I දරණ පනත සහ 1975 අංක 35 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත කඩිනම් සංවර්ධනය සම්බන්ධ තීරණ ගැනීමට බාධාකාරී විය.

- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යුහයන් හා කාර්යයන් යටතේ විමසා බලමු. මේ යටතේ 1948, 1972, 1978 ආණ්ඩුක්‍රම තුලනාත්මකව අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වේ.

# ව්‍යවස්ථාදායකය

| | 1948 ආණ්ඩු ක්‍රමය | 1972 ආණ්ඩු ක්‍රමය | 1978 ආණ්ඩු ක්‍රමය |
|---|---|---|---|
| **01. ව්‍යුහය** | පාර්ලිමේන්තුව ද්විමාණ්ඩලික වේ.<br>(අ) මහජන මන්ත්‍රී මණ්ඩලය<br>(ආ) සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය | ජාතික රාජ්‍ය සභාවඃ ඒකමාණ්ඩලික වේ. | 1978 ආණ්ඩුක්‍රමය යටතේ ව්‍යවස්ථාදායකය හඳුන්වනු ලැබුවේ පාර්ලිමේන්තුව නමින්ය. එය ඒක මාණ්ඩලික වේ. |
| **02. සංයුතිය** | **මහජන මන්ත්‍රී මණ්ඩලය**<br>1947- 1959 කාල පරිච්ඡේදය තුළ සාමාජිකයින් 101 කි. 1960 සිට සාමාජිකයින් 157කි. මහජන මන්ත්‍රී මණ්ඩලය 1947- 1959 කාල පරිච්ඡේදය තුළ සාමාජිකයින් 101 දෙනෙකුගෙන් යුක්ත විය. සාමාජිකයින් අතරින් 95 දෙනෙකු ජනතාවගේ ඍජු ඡන්දයෙන් තෝරා පත් කර ගත් අතර 6 දෙනෙකු අගමැතිවරයාගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරයා විසින් පත් කරනු ලැබීය. 1960 සිට සාමාජිකයින් 157 දෙනෙකුගෙන් සමන්විත විය. සාමාජිකයින් 151 දෙනෙකු ජනතාවගේ ඍජු ඡන්දයෙන් ද 6 දෙනෙකු අගමැතිවරයාගේ උපදෙස් මත ආණ්ඩුකාරයා විසින් ද තෝරා පත් කර ගන්නා ලදී. | ජාතික රාජ්‍ය සභාව සමන්විත වන මන්ත්‍රී සංඛ්‍යාව කොපමණ ද යන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් කර නැත. ජාතික රාජ්‍ය සභාවේ සාමාජික සංඛ්‍යාව තීරණය කිරීමේ බලය 77 වගන්තිය යටතේ බලය පැවරුණේ මැතිවරණ සීමා නිර්ණය කොමිෂන් සභාව වෙත ය. ඒ අනුව මුල් කාලය තුළ ජාතික රාජ්‍ය සභාව සාමාජිකයින් 157 දෙනෙකුගෙන් සමන්විත විය. ජාතික රාජ්‍ය සභාවේ සියළුම සාමාජිකයින් ජනතාවගේ ඍජු ඡන්දයෙන් තේරී පත් වේ. | පාර්ලිමේන්තුවේ සම්පූර්ණ සාමාජික සංඛ්‍යාව 225 ක් වූ අතර එය ව්‍යවස්ථාවේ සඳහන් නිශ්චිත සංඛ්‍යාවක් විය. සාමාජිකයන් 196 ක් මැතිවරණ කොට්ඨාස පදනම් කර ගෙන තෝරා ගනු ලබන අතර ඉතිරි 29 දෙනා තෝරා ගනු ලබන්නේ ජාතික ලැයිස්තුවෙනි. |

| | | | |
|---|---|---|---|
| | **තෝරා ගැනීමේ පදනම**<br>ඡන්ද කොට්ඨාස මත පදනම් විය. ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරිමේ දි කරුණු දෙකක් සැලකිල්ලට ගන්නා ලදී.<br>1. වර්ග සැතපුම් 1000 කට එක් ආසනයක්<br>2. ජනගහනය 15000 කට එක ආසනයක් | | |
| **03. නිල කාලය** | මහජන මන්ත්‍රී මණ්ඩලයේ නිල කාලය වසර 5 කි. | ජාතික රාජ්‍ය සභාවේ නිල කාලය ව්‍යවස්ථාවේ 40 වගන්තියට අනුව ජාතික රාජ්‍ය සභාව රැස් වන පළමු දින සිට සය අවුරුද්දකට නො වැඩි කාලයකි. | පාර්ලිමේන්තුවේ නිල කාලය වසර සයකි. නිල කාලය ඉකුත් වීමට පෙර එය විසුරුවා හැරිය හැක. නිල කාලය ඉකුත් වූ විට එය විසුරුවා ගියා සේ සැළකේ. |
| **04. බලතල හා කාර්යන්** | 1. කැබිනට් මණ්ඩලය විසින් ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් සලකා බැලීම<br>2. කැබිනට් මණ්ඩලය විසින් ඉදිරිපත් කරන මුදල් පනත් කෙටුම්පත් සලකා බැලීම<br>3. පෞද්ගලික මන්ත්‍රිවරුන්ගේ යෝජනා සලකා බැලීම | ව්‍යවස්ථාවේ 5 වගන්තියට අනුව ශ්‍රී ලංකා සමූහාණ්ඩුවේ රාජ්‍ය බලය ක්‍රියාවට නංවන උත්තරීතර ආයතනය ජාතික රාජ්‍ය සභාවයි. ව්‍යවස්ථාදායක සහ ආරක්‍ෂාව ඇතුළු ජනතාවගේ විධායක බලය ජනාධිපතිවරයා සහ අමාත්‍ය මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන්නේ ද ජාතික රාජ්‍ය සභාව විසින් ය. ඒ අනුව ජාතික රාජ්‍ය සභාව විසින්<br>1.වගන්ති 44 ට අනුව මුදල් හා සාමාන්‍ය නීති සම්පාදනය කිරිම | ව්‍යවස්ථාදායක බලය පාර්ලිමේන්තුව වෙත පවරනු ලැබුව ද ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව ඒකාධිකාරි බලයක් භුක්ති විඳින්නේ නැත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ව්‍යවස්ථාදායක බලය ජනතාව විසින් තෝරා පත් කර ගනු ලබන මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව විසින් ද ජනමත විචාරණයක දි ජනතාව විසින් ද ක්‍රියාත්මක කරනු ලබයි. |

| | | | |
|---|---|---|---|
| | **සෙනේට් මන්ත්‍රී මණ්ඩලයේ සංයුතියඃ**<br>සභිකයන් 30ක<br>**තෝරා පත් කර ගන්නා ආකාරය**<br><br>මින් 15 දෙනෙකු අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරයා විසින් පත් කැරිණ. ඉතිරි 15 දෙනා මහජන මන්ත්‍රී මණ්ඩලය තුළ නියෝජනය වන දේශපාලන පක්ෂ විසින් මාරු කළ හැකි තනි ඡන්ද ක්‍රමය යටතේ පත් කරන ලදී.<br><br>**නිල කාලය**<br>සෙනෙට් සභිකයෙකුගේ නිල කාලය වසර හයකී<br><br>**බලතල හා කාර්යයන්**<br>1.මුදල් නොවන පනත් ආරම්භ කිරීම<br>2.මුදල් නොවන පනත් ප්‍රමාද කිරිම | 2. කැබිනට් මණ්ඩලය ජාතික රාජ්‍ය සභාවට වග නොකියන අවස්ථාවක කැබිනට් මණ්ඩලය ඉවත් කිරිම මගින් විධායකය පාලනය කිරිම.<br>3. මුදල් පාලනය කිරිම | පාර්ලිමේන්තුව සතු ව්‍යවස්ථාදායක බලයට;<br>(අ) අතීතයට බලපාන්නා වූ නීති ඇතුළු ව<br>(ආ)ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් පරිච්ඡින්න කරන හෝ සංශෝධනය කරන<br>(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යම් විධිවිධානයක් එකතු කරන නීති පැනවීමේ බලය හිමි වේ.<br>එහෙත් පාර්ලිමේන්තුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ එහි යම් කොටසක හෝ ක්‍රියාකාරිත්වය අත්හිටවන්නා වූ නීතියක් පැනවීම හෝ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පනවනු ලබන්නේ නම් මිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මුළුමනින්ම පරිච්ඡින්න කරන්නා වූ නීතියක් පැනවිය නොහැක. ඊට අමතරව<br>1.මුදල් සහ සාමාන්‍ය නීති සම්පාදනය කිරීම<br>2. කැබිනට් මණ්ඩලය පාලනය කිරිම<br>3. මුදල් පාලනය කිරිම<br>1978 ව්‍යවස්ථාදායකය පරම බලය සහිත පාර්ලිනේතුවක් නොවේ. එනම් වෙනත් ආයතනවල බලපෑමකින් තොරව නීති සම්පාදනය කළ නොහැක. |

# විධායකය

| | 1948 ආණ්ඩු ක්‍රමය | 1972 ආණ්ඩු ක්‍රමය | 1978 ආණ්ඩු ක්‍රමය |
|---|---|---|---|
| **01. සංයුතිය** | සෝල්බරි ව්‍යවස්ථාව යටතේ මෙරට විධායකය ද්විත්ව ස්වරූපයක් ගනියි. එනම් නාමික විධායකය සහ දේශපාලන විධායකය යි. ඒ අනුව<br>විධායකය<br>නාමිකවිධායකය දේශපාලන විධායකය<br>( අග්‍රාණ්ඩුකාරවරයා) (අගමැති සහ කැබිනට් මණ්ඩලය) | 1972 විධායකය ද නාමික සහ දේශපාලන වශයෙන් ද්විත්ව ස්වරූපයකින් යුක්ත වේ.<br>විධායකය<br>නාමික විධායකය දේශපාලනවිධායකය<br>(ජනාධිපතිවරයා)(අගමැති සහ අමාත්‍යමණ්ඩලය) | 1978 ආණ්ඩුක්‍රමය මගින් හඳුන්වා දෙනු ලැබුවේ දෙමුහුන් විධායකයකි.<br>විධායකය<br>(ජනාධිපති) (අගමැති සහ කැබිනට් මණ්ඩලය) |
| **02. පත් කරන ආකාරය** | **අග්‍රාණ්ඩුකාරවරයා**<br>අග්‍රාණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ රැජින විසිනි. ලංකාවේ අගමැතිවරයාගේ උපදෙස් මත මෙම පත්වීම සිදු කරයි. මේ අනුව රැජිනගේ නාමයෙන් අගමැතිවරයා විසින් අග්‍රාණ්ඩුකාරවරයා පත් කරයි.<br><br>**අගමැති සහ කැබිනට් මණ්ඩලය**<br>කැබිනට් මණ්ඩලය පත් කරනු ලබන්නේ අග්‍රාණ්ඩුකාරවරයා විසින් ය. පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ වැඩි දෙනාගේ විශ්වාසය දිනා ගත් මන්ත්‍රීවරයාව අග්‍රාණ්ඩුකාරවරයා විසින් අගමැති ධූරයට | **ජනාධිපතිවරයා**<br>1972 ව්‍යවස්ථාව යටතේ හඳුන්වා දී ඇති නාමික විධායකය වන්නේ ජනාධිපති ධූරයයි. ඡන්ද බලය හිමි ඕනෑම පුද්ගලයෙකු ජනාධිපති ධූරයට පත් කිරිම අගමැතිවරයා විසින් සිදු කෙරෙයි.<br><br>**අගමැති සහ අමාත්‍ය මණ්ඩලය**<br>1972 ව්‍යවස්ථාව යටතේ දේශපාලන විධායකය වන්නේ අමාත්‍ය මණ්ඩලයයි. අමාත්‍ය මණ්ඩලය අගමැති ඇතුළු අමාත්‍ය මණ්ඩලයකින් යුක්ත වේ. ජාතික රාජ්‍ය සභාවේ බහුතර විශ්වාසය දිනාගත් මන්ත්‍රීවරයා ජනාධිපති විසින් | **විධායක ජනාධිපතිවරයා**<br>1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා තෝරා පත් කිරීම සිදු කරන්නේ ජනාධිපතිවරණයක් මගින් ය. ව්‍යවස්ථාවේ 94 වගන්තියට අනුව ජනතාවගේ ඍජු ඡන්දයෙන් ජනාධිපතිවරයා තෝරා පත් කර ගනු ලැබේ. මුළු ලංකාවම එක් ඡන්ද කොට්ඨාසයක් ලෙස එහිදී සලකනු ලැබේ.<br>**අගමැති සහ කැබිනට් මණ්ඩලය**<br>1978 ව්‍යවස්ථාවේ 43(3) වගන්තියට අනුව පාර්ලිමේන්තුවේ උපරිම විශ්වාසය ඇති මන්ත්‍රීවරයා අගමැති ලෙස ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නේය. |

| | | | |
|---|---|---|---|
| | පත් කරයි. ඉන් අනතුරුව අගමැතිවරයා විසින් පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙක තුළින් ම තම අමාත්‍ය මණ්ඩලය තෝරා ගන්නා අතර අග්‍රාණ්ඩුකාරවරයා විසින් ඔවුන් අමාත්‍ය මණ්ඩලයට පත් කරනු ලැබේ. | අගමැතිවරයා ලෙස පත් කරයි. අනතුරුව අගමැතිවරයා විසින් ජාතික රාජ්‍ය සභාවෙන් තෝරා පත් කර ගන්නා ලද සාමාජිකයින් ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලයට පත් කරයි | 44(1) වගන්තියට අනුව අගමැතිවරයාගේ අදහස් විමසීමට අවශ්‍ය යැයි ජනාධිපතිවරයා කල්පනා කරන්නේ නම් අදහස් විමසා අමාත්‍යවරුන් ජනාධිපති පත් කරන්නේය |
| **03. නිල කාලය** | **අග්‍රාණ්ඩුකාරවරයා**<br>අග්‍රාණ්ඩුකාරවරයාගේ නිල කාලය පිළිබඳ ව ව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් කර නැත. රැජිනගේ විශ්වාසය ඔහු කෙරෙහි පවතින තුරු ඔහු ධූරය හොබවනු ලැබේ.<br><br>**අගමැති සහ කැබිනට් මණ්ඩලය**<br>කැබිනට් මණ්ඩලයේ නිල කාලය වසර 5 කි. | **ජනාධිපතිවරයා**<br>ජනාධිපතිවරයාගේ නිල කාලය වසර 4 කි. නැවත ජනාධිපතිවරයෙකු පත් කරන තෙක් ඔහු සිය ධූරය දරන්නේය.<br><br>**අගමැති සහ අමාත්‍ය මණ්ඩලය**<br>ජාතික රාජ්‍ය සභාවේ නිල කාලය වන අවුරුදු 6 ක් අගමැති සහ අමාත්‍ය මණ්ඩලය ස්වකීය ධූර හොබවති. | **ජනාධිපතිවරයා**<br>ජනාධිපතිවරයාගේ නිල කාලය වසර සයකි.<br><br>**අගමැති සහ කැබිනට් මණ්ඩලය**<br>අගමැති සහ කැබින මණ්ඩලයේ නිල කාලය වසර සයකි. |
| **04. ඉවත් කරන ආකාරය** | **අග්‍රාණ්ඩුකාරවරයා**<br>අග්‍රාණ්ඩුකාරවරයා කෙරෙහි රැජින තුළ පවතින විශ්වාසය පළුදු වූ විට රැජිනට අග්‍රාණ්ඩුකාරවරයා ඉවත් කළ හැක. | **ජනාධිපතිවරයා**<br>නිල කාලයට ප්‍රථම ජාතික රාජ්‍ය සභාවේ 2/3 ක යෝජනා සම්මතයෙන් හෝ අගමැති ගෙනෙන යෝජනාවක් ජාතික රාජ්‍ය සභාවේ බහුතරය සම්මත කිරීමෙන් ජනාධිපතිවරයා ඉවත් කළ හැක. | **විධායක ජනාධිපතිවරයා**<br>1978 ව්‍යවස්ථාවට අනුව විධායක ජනාධිපතිවරයා ඉවත් කිරීමට නම් දෝෂාභියෝග යෝජනාවක් ගෙනා යුතුයි එනම්<br>• මානසික හෝ ශාරීරික ආබාධයකින් පෙළීම |

| | | | |
|---|---|---|---|
| | **අගමැති සහ කැබිනට් මණ්ඩලය**<br>නිල කාලය ඉක්මවූ විට කැබිනට් මණ්ඩලය විසුරුවා හැරියාක් සේ සැලකේ. ඊට අමතරව පාර්ලිමේන්තුවේ වැඩි දෙනාගේ විශ්වාසය බිඳ වැටුණු විටෙක විශ්වාස භංග යෝජනාවක් මගින් කැබිනට් මණ්ඩලය ඉවත් කිරිමට පාර්ලිමේන්තුවට හැකියාව ඇත. | **අගමැති සහ අමාත්‍ය මණ්ඩලය**<br>නිල කාලයට ප්‍රථම ව්‍යවස්ථාදයකය තුළ සම්මත කරනු ලබන විශ්වාස භංග යෝජනාවක් මගින් ඉවත් කළ හැක. | • චරිත දූෂණය<br>• අල්ලස් හෝ වෙනත් දූෂණ<br>• රටට ද්‍රෝහි වීම<br>• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම<br>වැනි චෝදනා ඇතුළත් චෝදනා පත්‍රයක් පාර්ලිමේන්තුවේ 2/3 ක් අත්සන් කර කථානායකවරයාට ඉදිරිපත් කළ යුතුය. කථානායකවරයා චෝදනා පත්‍රය නැවත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් එය සාකච්ඡා කොට අනතුරුව 2/3 ක වැඩි ඡන්දයෙන් සම්මත කළ යුතුය.<br>අනතුරුව කථානයකවරයා එය ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ යුතු අතර ශ්‍රේෂ්ඨාධිකරණය එය පරීක්ෂා කොට ඒ පිළිබඳ වාර්තාවක් කථානායකවරයාට ඉදිරිපත් කළ යුතු වේ.<br>අනතුරුව එම වාර්තාව පාර්ලිමේන්තුවට කථානායකවරයා විසින් ඉදිරිපත් කරනු ලබන අතර එයද සාකච්ඡා කොට 2/3 බලයකින් අනුමත කළ විට ජනාධිපතිවරයා ධූරයෙන් ඉවත් විය යුතුය.<br>1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා ඉවත් කිරීම ඉතාමත් සංකීර්ණ ක්‍රියාවලියකි. ඉහත චෝදනා පත්‍රය කථානායකවරයා වෙත ඉදිරිපත් වූ විගස ඔහු ඒ පිළිබඳ ව ජනාධිපතිවරයා |

| | | | |
|---|---|---|---|
| | | | දැනුවත් කරනු ලැබේ. එවැනි අවස්ථාවක පාර්ලිමේන්තුව පිහිටුවා වසරකට වඩා ඉක්ම ගොස් ඇත්නම් ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරීම තුළින් දෝෂාභියෝග යෝජනාවෙන් මිදිය හැක.<br><br>**අගමැති සහ කැබිනට් මණ්ඩලය**<br>අගමැති හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙකු ජනාධිපතිවරයාගේ අත්සන යටතේ යවන ලිපියක් මගින් ඉවත් කරනු ලැබුවහොත් හෝ ස්වකීය අත්සන යටතේ ජනාධිපතිවරයාට යවන ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් අස්වුවහොත් හෝ තවදුරටත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් නොවූවහොත් හෝ මිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම්තාක් කල් අමාත්‍ය මණ්ඩලය පවත්නේ ද ඒ තාක් කල් ස්වකීය ධූරය දරන්නේය. |

| | | | |
|---|---|---|---|
| **05. බලතල සහ කාර්යයන්** | **අග්‍රාණ්ඩුකාරවරයාගේ බලතල**<br>ව්‍යවස්ථාදායක බලතල<br>1. පනත් කෙටුම්පත්වලට අවසාන අනුමැතිය ලබා දීම<br>2. පාර්ලිමේන්තුව කැඳවීම සහ කල් තැබීම හා විසුරුවා හැරීම<br>3. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට මන්ත්‍රීවරුන් 6 ක් පත් කිරීම<br>4. සෙනෙට් සභාවට මන්ත්‍රීන් 15 ක් පත් කිරීම<br>5. විශේෂ අවස්ථාවක දී පාර්ලිමේන්තුවේ මූලාසනය දැරීම<br><br>විධායක බලතල<br>1. අගමැති පත් කිරීම<br>2. අමාත්‍ය මණ්ඩලය පත් කිරීම<br>3. රාජාසන කථාව කියවීම<br>4. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කිරීම. | **ජනාධිපතිවරයාගේ බලතල**<br>ජනාධිපතිවරයාට ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන ත්‍රිවිධ අංශ ඔස්සේ බලතල පවරා තිබුණ ද ඒවා ක්‍රියාවට නැංවිය යුත්තේ අගමැතිවරයාගේ උපදෙස්වලට යටත්වය.<br>ව්‍යවස්ථාදායක බලතල<br>1. ජාතික රාජ්‍ය සභාවේ සැසිවාර කැඳවීම, කල් දැමීම හා විසුරුවා හැරීම<br>2. විශේෂ අවස්ථාවල දී ජාතික රාජ්‍ය සභාවේ මූලාසනය දැරීම.<br><br>විධායක බලතල<br>1. අගමැති පත් කිරීම<br>2. අමාත්‍ය මණ්ඩලය පත් කිරීම<br>3. ප්‍රතිපත්ති ප්‍රකාශනය කියවීම<br>4. යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම<br>5. සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා වීම<br>6. පොලිස්පති සහ හමුදා ප්‍රධානීන් පත් කිරීම<br>7. තානාපතිවරුන් පත් කිරීම සහ පත් කර එවන අය පිළිගැනීම<br>8. සභාවේ උසස් නිළධාරින් පත් කිරීම<br>9. රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලයට සහ රාජ්‍ය සේවා විනය මණ්ඩලයට සාමාජිකයින් පත් කිරීම | **විධායක ජනාධිපතිවරයාගේ බලතල**<br>ව්‍යවස්ථාදායක බලතල<br>1. පාර්ලිමේන්තුව කැඳවීම, කල් තැබීම, විසුරුවා හැරීම<br>2. ජනමත විචාරණ මගින් අවශ්‍ය නීති සකස් කර ගැනීම<br>3. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අමාත්‍ය පදවි පිරි නැමීම<br>4. විශේෂ අවස්ථාවලදී පාර්ලිමේන්තුවේ මූලාසනය ගැනීම<br>5. පාර්ලිමේන්තු වරප්‍රසාද භුක්ති විඳීම<br><br>විධායක බලතල<br>1. අගමැති පත් කිරීම<br>2. අමාත්‍ය මණ්ඩලය පත් කිරීම<br>3. හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කිරීම<br>4. ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය කියවීම<br>5. යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම<br>6. සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා වීම<br>7. පොලිස්පති සහ හමුදා ප්‍රධානීන් පත් කිරීම<br>8. තානාපතිවරුන් පත්කිරීම සහ පත් කර එවන අය පිළිගැනීම<br>9. ආණ්ඩුකාරවරුන් පත් කිරීම |

| | | | |
|---|---|---|---|
| | අධිකරණ බලතල<br>1. උසස් අධිකරණ ආයතනවලට විනිසුරුවන් පත් කිරීම<br>2. වරදකරුවන්ට සමාවදීම<br>3. අධිකරණ සේවා කොමිෂන් සභාවට සාමාජිකයින් පත් කිරීම<br><br>**කැබිනට් මණ්ඩලය**<br>1. ආණ්ඩුවේ ප්‍රතිපත්ති තීන්දු කිරීම<br>2. නීති ක්‍රියාත්මක කිරීම<br>3. පරිපාලන කටයුතු විධිමත් කිරීම<br><br>**අගමැතිවරයා**<br>ව්‍යවස්ථාදායක බලතල<br>1. පාර්ලිමේන්තුව කැඳවීම, කල් තැබීම, විසුරුවා හැරීම<br>2. මහජන මන්ත්‍රී මණ්ඩලයට මන්ත්‍රීවරු 6 ක් පත් කිරීම | අධිකරණ බලතල<br>1. උසස් අධිකරණ ආයතනවලට විනිසුරුවන් පත් කිරීම<br>2. වරදකරුවන්ට සමාව දීම<br>3. අධිකරණ සේවා උපදේශක මණ්ඩලයට සාමාජිකයින් පත් කිරීම<br><br>**අමාත්‍ය මණ්ඩලය**<br>1. ආණ්ඩුවේ ප්‍රතිපත්ති තීන්දු කිරීම<br>2. නීති ක්‍රියාත්මක කිරීම<br>3. පරිපාලන කටයුතු විධිමත් කිරීම<br><br>**අගමැතිවරයා**<br>ව්‍යවස්ථාදායක බලතල<br>1. ජාතික රාජ්‍ය සභාවේ සැසිවාර කැඳවීම, කල් දැමීම හා විසුරුවා හැරීම | 10. ඔම්බුඩ්ස්මන්වරයා පත් කිරිම<br>11. රජයේ උසස් නිළධාරින් පත් කිරීම<br>12. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කිරීම<br><br>අධිකරණ බලතල<br>1. උසස් අධිකරණ ආයතනවලට විනිසුරුවන් පත් කිරීම<br>2. අධිකරණ සේවා කොමිෂන් සභාවට සාමාජිකයින් පත් කිරීම<br>3. වරදකරුවන්ට සමාව දීම<br><br>ඉහත බලතල ජනාධිපතිවරයාගේ කැමැත්ත පරිදි භුක්ති විඳීමට අගමැතිවරයාට හැකිය. |

| | | | |
|---|---|---|---|
| | 3. සෙනෙට් සභාවට මන්ත්‍රීවරු 15 ක් පත් කිරීම<br><br>විධායක බලතල<br>1. අමාත්‍යවරුන් පත් කිරීම<br>2. අමාත්‍යවරුන් ඉවත් කිරීම<br>අධිකරණ බලතල<br>1. උසස් අධිකරණ ආයතනවලට විනිසුරුවන් පත් කිරීම<br>2. අධිකරණ සේවා කොමිෂන් සභාවට සාමාජිකයින් පත් කිරීම | විධායක බලය<br>1. ජනාධිපතිවරයා පත් කිරීම<br>2. අමාත්‍ය මණ්ඩලය පත් කිරීම<br>3. යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම<br>4. සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා වීම<br>5. පොලිස්පති සහ හමුදා ප්‍රධානීන් පත් කිරීම<br>6. තානාපතිවරුන් පත් කිරීම සහ පත් කර එවන අය පිළිගැනීම<br>7. රජයේ උසස් නිළධාරීන් පත් කිරීම<br>8. රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලයට සහ රාජ්‍ය සේවා විනය මණ්ඩලයට සාමාජිකයින් පත් කිරීම<br><br>අධිකරණ බලය<br>1. උසස් අධිකරණ ආයතනවලට විනිසුරුවන් පත් කිරීම<br>2. වරදකරුවන්ට සමාව දීම<br>3. අධිකරණ සේවා උපදේශක මණ්ඩලයට සාමාජිකයින් පත් කිරීම | |

# අධිකරණය

| | 1948 ආණ්ඩු ක්‍රමය | 1972 ආණ්ඩු ක්‍රමය | 1978 ආණ්ඩු ක්‍රමය |
|---|---|---|---|
| **01. ව්‍යුහය** | සෝල්බරි ව්‍යවස්ථාව යටතේ අධිකරණ පද්ධතිය තුළ ප්‍රධාන ස්ථර දෙකක් දැකිය හැක.<br>උසස් අධිකරණ ආයතන<br>1. ශ්‍රේෂ්ඨාධිකරණය<br>2. අභියාචනාධිකරණය<br><br>පහළ අධිකරණ ආයතන<br>1. දිසා අධිකරණය<br>2. මහේස්ත්‍රාත් අධිකරණය<br>3. රික්වෙස්ට් උසාවිය<br>4. ගම්බද උසාවි | 1972 ව්‍යවස්ථාවේ 121 වන වගන්තියේ දැක්වෙන්නේ අධිකරණ ආයතන පිහිටුවීමට ජාතික රාජ්‍ය සභාවේ සාමාන්‍ය පනතකින් හැකි බවයි මේ අනුව 1973 අංක 44 දරණ යුක්තිය පසිඳලීමේ පනත මගින් අධිකරණ ආයතන දෙවර්ගයක් පිහිටුවා ඇත.<br>උසස් අධිකරණ ආයතන<br>1. ශ්‍රේෂ්ඨාධිකරණය<br>2. අභියාචනාධිකරණය<br>පහළ අධිකරණ ආයතන<br>1.මහාධිකරණය<br>2.දිසා අධිකරණය<br>3.මහෙස්ත්‍රාත් අධිකරණය | 1978 ව්‍යවස්ථාවේ 105 වගන්තියට අනුව අධිකරණ ව්‍යුහය පහත සඳහන් ආකාරයට හඳුනාගත හැක.<br>1.ශ්‍රේෂ්ඨාධිකරණය<br>2.අභියාචනාධිකරණය<br>3.මහාධිකරණය<br>4.පාර්ලිමේන්තුව විසින් පිහිටවනු ලබන මුල් අවස්ථා අධිකරණ<br>5.විනිශ්චය අධිකරණ ආයතන |
| **02. සංයුතිය** | ශ්‍රේෂ්ඨාධිකරණය<br>අග්‍රවිනිශ්චයකාරවරයා ඇතුළු විනිසුරුවන් 10-20 අතර සංඛ්‍යාවකින් සමන්විත වේ. | ශ්‍රේෂ්ඨාධිකරණය අග්‍ර නිශ්චයකාරවරයා ඇතුළු විනිසුරුවන් 10-20 අතර සංඛ්‍යාවකින් සමන්විත වේ. | ශ්‍රේෂ්ඨාධිකරණය<br>අග්‍රවිනිශ්චයකාරවරයා ගෙන් සහ 10 කට නොවැඩි 6 කට නොඅඩු විනිශ්චයකාරුවන් සංඛ්‍යාවකින් සමන් විත වේ. |
| **03. පත් කරන ආකාරය** | උසස් අධිකරණ ආයතනවල විනිශ්චයකාරවරු අගමැතිවරයාගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරවරයා විසින් සිදු කරන ලදහ. | ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු අගමැතිගේ උපදෙස් මත ජනාධිපති විසින් පත් කළේය. | ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු ජනාධිපති විසින් පත් කරනු ලබන අතර ජනාධිපතිගේ නිර්දේශය ව්‍යවස්ථා සභාව අනුමත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පහළ අධිකරණ ආයතනවල පත් කිරීම් ස්වාධීන අධිකරණ සේවා කොමිෂමට පවරා තිබුණේය. | | |
| **04. සේවා කාලය** | වයස අවුරුදු 62 ක විශ්‍රාමික වයස එළඹෙන තෙක් සේවය කිරීමට විනිශ්චයකරුවන්ට හැකියාව තිබුණි. එහෙත් අවශ්‍ය නම් වසරකින් සේවා කාලය දීර්ඝ කර ගැනීමට හැකි විය. | විශ්‍රාමික වයස අවුරුදු 63 ක් වන අතර ඒ තාක් සේවය කළ හැක. | විශ්‍රාමික වයස අවුරුදු 65 ක් වන අතර ඒ තාක් සේවය කළ හැක. |
| **05. ඉවත් කරන ආකාරය** | ශාරීරික හෝ මානසික හෝ කිසියම් ආබාධිත තත්ත්වයක් තුළ විනිශ්චයකාරවරයෙකු ඉවත් කිරීමට හැකි අතර එසේ කිරීමට නම් පාර්ලිමේන්තුව ගෙනෙන යෝජනාවක් අනුව අග්‍රාණ්ඩුකාරයා විසින් සිදු කළ යුතුය. පහළ අධිකරණ ආයතනවල විනිශ්චයකරුවන් ඉවත් කිරීම් සහ විනය පාලනය ස්වාධීන අධිකරණ සේවා කොමිෂම විසින් සිදු කළේය. | විනිශ්චයකාරවරුන් ඉවත් කිරීම ජාතික රාජ්‍ය සභාව ගෙනෙන යෝජනාවක් අනුව ජනාධිපතිවරයා විසින් සිදු කළ යුතුයි පහළ අධිකරණ ආයතනවල විනිශ්චයකරුවන් ඉවත් කිරීමේදී අමාත්‍ය මණ්ඩලයට අධිකරණ සේවා උපදේශක මණ්ඩලය උපදෙස් ලබා දිය යුතු වේ. | විශ්‍රාමික කාල සීමාවට පෙර ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් ඉවත් කිරීමට නම් පාර්ලිමේන්තුව ගෙනෙන යෝජනාවක් අනුව ජනාධිපති විසින් සිදුකළ යුතුය. |
| **06. අධිකරණයේ ස්වාධීනත්වය** | උසස් අධිකරණ ආයතනවල ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා විධිවිධාන කිහිපයක් ගෙන තිබුණි.<br>1.පත් කිරීම් ආණ්ඩුකාරවරයා විසින් සිදු කිරීම<br>2.ජ්‍යෙෂ්ඨත්වය මත පත් කිරීම් සිදු කිරීම<br>3.නිශ්චිත සේවා කාලයක් දක්වා තිබීම<br>4.වැටුප් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම | 1. පත් කිරීම් ජනාධිපතිවරයා සහ අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ උපදෙස් මත අමාත්‍ය මණ්ඩලය විසින් සිදු කිරීම<br>2. වැටුප් ජාතික රාජ්‍ය සභාව යෝජනා කළ යුතු අතර ඒකාබද්ධ අරමුදල මගින් ගෙවීම<br>3. නිශ්චිත සේවා කාලයක් දක්වා තිබීම | 1. පත් කිරීම් ජනාධිපතිවරයා සහ ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත සිදු කිරීම<br>2. වැටුප් ඒකාබද්ධ අරමුදල මගින් ගෙවීම<br>3. නිශ්චිත සේවා කාලයක් දක්වා තිබීම<br>4. අධිකරණ සේවා කොමිෂමක් ස්ථාපිත කර තිබීම<br>5. ව්‍යවස්ථාදායක සභාවක් ස්ථාපිත කර තිබීම |

| | | | |
|---|---|---|---|
| | 5. සේවාකාලය තුළ වැටුප් අඩුකළ නොහැකි යැයි කොන්දේසියක් පැනවීම<br>6. ස්වාධීන අධිකරණ සේවා කොමිෂමක් පත් කිරීම<br><br>පහළ අධිකරණ ආයතනවල පත් කිරීම. මාරු කිරීම් ඉවත් කිරීම් සහ විනය පාලනය ස්වාධීන අධිකරණ සේවා කොමිසමට පවරා තිබුණේය. | 4. අධිකරණ සේවා උපදේශක මණ්ඩලයක් ස්ථාපිත කර තිබිම<br>5. අධිකරණ සේවා විනය මණ්ඩලයක් ස්ථාපිත කර තිබීම<br><br>එසේ වුව ද සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පැවති ස්වාධීන අධිකරණ සේවා කොමිසම අහෝසි කිරීම තුළින් 1972 ව්‍යවස්ථාව අධිකරණයේ ස්වාධීනත්වයට බාධා පමුණුවා ඇත. | |

**මෙහිදී සළකා බලනුයේ 1947, 1972, සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යටතේ රාජ්‍ය සේවය පාලනය කිරීම සඳහා යොදා තිබූ විධිවිධානයන්ය.**

| 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව | 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව | 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව |
|---|---|---|
| • අදාළ වගන්තිඃ 57 සිට 65<br>• රාජ්‍ය සේවා කොමිසම<br>සංයුතිය : සාමාජිකයන් තිදෙනෙකි.<br>පත්කිරීම : ආණ්ඩුකාරයා විසින්<br>යෝග්‍යතාව :<br>• තිදෙනාගෙන් එක් අයෙකුවත් පත් කිරිමේ දිනට පස්වසරකට පෙර කාලය තුළ රාජ්‍ය සේවයේ හෝ අධිකරණ සේවයේ තනතුරක් නොදැරිය යුතුය.<br>• සෙනෙට් සභාවේ හෝ පාර්ලිමේන්තුවේ සාමාජිකයකු පත් නොකළ යුතුයි.<br>• රාජ්‍ය නිලධාරියකු පත් කරන්නේනම් පත්කළ දිනයේ සිට දැරූ තනතුරින් ඉවත්විය යුතුය.<br>සභාපති : සාමාජිකයන් තිදෙනා අතුරින් එක් අයකු අග්‍රාණ්ඩුකාරයා විසින් සභාපති තනතුරට පත් කළ යුතුය.<br>නිල කාලයඃ පත්කළ දිනයේ සිට වසර පහකි.නැවත පත්නළ හැක.<br>නිලය අහිමිවීමඃ<br>1 ඉවත් කිරීමෙන් - හේතු දැක්වීම මත ඕනෑම සාමාජිකයකු ඉවත් කිරිමට අග්‍රාණ්ඩුකාරවරයාට බලය හිමිවීම.<br>2 ඉල්ලා අස්වීමෙන් | • අදාළ වගන්ති : 105 සිට 120<br>• 1947 ව්‍යවස්ථාව යටතේ ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා කොමිසම අහෝසි කරන ලදි.<br>• රාජ්‍ය සේවකයින් පත් කිරීම, මාරු කිරීම, පහ කිරීම, විනය පාලනය පිළිබඳ වගකීම අමාත්‍ය මණ්ඩලයට පවරාගනු ලැබීම සහ එම කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය ජාතික රාජ්‍ය සභාවට වගකිව යුතු වීම.<br>• අමාත්‍ය මණ්ඩලයේ කාර්යභාරය<br>1 රාජ්‍ය සේවකයින් පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහකිරීම සහ විනය පාලනය.<br>2 මෙම කාර්යයන් හා සම්බන්ධ ක්‍රියාපටිපාටිය මෙන්ම එම කාර්යයන් වෙනත් ආයතනයකට හෝ පුද්ගලයෙකුට පවරා දෙන්නේනම් ඒ සඳහා අදාළ ක්‍රියාපටිපාටියද සම්පාදනය කිරීම.<br>• ඉහත දැක්වූ කාර්යයන් කරගෙනයාම සඳහා සහය වීම පිණිස නව ආයතන දෙකක් පිහිටුවීම.<br>1 රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය<br>2 රාජ්‍ය සේවා විනය මණ්ඩලය<br>රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය<br>i සාමාජිකයින් සංඛ්‍යාව තිදෙනෙකි.<br>ii ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබේ.<br>iii එයින් එක් අයෙකු ජනාධිපති විසින් සභාපති ලෙස නම් කළ යුතුය. | • අදාළ වගන්ති : 54 සිට 61<br>(17 වන ව්‍යවස්ථා සංශෝධනයට පෙර)<br>• නව ව්‍යවස්ථාව යටතේ කලින් පැවති ව්‍යවස්ථාව මගින් සංස්ථාපනය කර තිබූ රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය සහ රාජ්‍ය සේවා විනය මණ්ඩලය අහෝසි කොට රාජ්‍ය සේවා කොමිසන් සභාව පිහිටුවනු ලැබීය.<br>• රාජ්‍ය සේවය ක්‍රියාවට නංවන ආකාරය<br>(අ) ජනාධිපතිවරයා විසින් කරනු ලබන පත්කිරීම්<br>• සන්නද්ධ හමුදාවන්හි ප්‍රධානීන් සහ පොලිස්පතිවරයා<br>• නීතිපතිවරයා<br>• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන ජනාධිපති විසින් පත්කළ යුතු වෙනත් පත් කිරීම්<br>• වෙනත් ලිඛිත නීතියක් මගින් ජනාධිපතිවරයාට පවරා ඇති පත්කිරීම් පිළිබඳව ජනාධිපතිවරයා කරනු ලබන පත්කිරීම්.<br>(ආ) අමාත්‍ය මණ්ඩලය විසින් ක්‍රියාවට නංවන බලතල<br>• රජයේ නිලධරයන් පත්කිරීම, මහජන සේවකයන් පත්කිරීම සහ විනය පාලනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අමාත්‍ය මණ්ඩලයට පවරා ඇත.<br>• මෙයින් දෙපාර්තමේන්තු ප්‍රධානයින් සම්බන්ධයෙන් පත්කිරීම්, මාරු කිරීම්, සේවයෙන් පහ කිරීම් හා විනය |

| | | |
|---|---|---|
| වටුප් හා දීමනා :<br>1 පාර්ලිමේන්තුවෙන් තීරණය කොට ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතුය.<br>2 සේවා කාලය තුළ දී වැටුප් අඩු නොකළ යුතුය.<br>ලේකම්වරයා :<br>රාජ්‍ය සේවා කොමිසන් සභාව විසින් පත් කළ යුතුය.<br>බලතල හා කාර්යයන් :<br>ව්‍යවස්ථාවෙන් විශේෂයෙන් සඳහන් කොට නොමැති රාජ්‍ය සේවකයන් පත් කිරීම, මාරුකිරී, අස්කිරීම සහ විනයානුකූල පාලනය පවත්වාගෙන යාම.<br>ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා යොදාතිබූ විධිවිධාන :<br>1 අග්‍රාණ්ඩුකාරවරයා විසින් සාමාජිකයින් පත් කිරීම.<br>2 හේතු දැක්වීමකින් තොරව ඉවත් කිරීමට නොහැකි වීම.<br>3 කොමිසමේ වැඩ කටයුතු වලට ඇඟිලි ගැසීම හෝ දඬුවම් ලැබිය හැකි වරදක් බවට ව්‍යවස්ථාවෙන් නියම කිරීම. වසරක සිරදඬුවම් හෝ රුපියල් දහසක දඩයක් හෝ එම දඬුවම් දෙකම. | iv ජාතික රාජ්‍ය සභාවේ සාමාජිකයෙකු හෝ රාජ්‍ය සේවා විනය මණ්ඩලයේ සාමාජිකයෙකු රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් නොකළ යුතුය.<br>v රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු ජාතික රාජ්‍ය සභාවේ සාමාජිකයෙකු ලෙස හෝ රාජ්‍ය සේවා විනය මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස හෝ රාජ්‍ය නිලධාරියකු ලෙස පත් කළ හොත් රාජ්‍ය සේවා උපදේශක මණ්ඩල සාමාජිකත්වය අහෝසි වන්නේය.<br>vi රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලයේ සාමාජිකත්වය අහෝසිවීම<br>(අ) මියගිය විටක<br>(ආ) ලිඛිත දැනුම් දීමකින් ඉල්ලා අස් වූ විට<br>(ඇ) ජනාධිපතිවරයා විසින් ධූරයෙන් ඉවත් කළ විටෙක<br>vii ලේකම්වරයා - රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලයට ලේකම්වරයෙකු සිටින අතර ඔහු / ඇය අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන්නේය.<br>viii වැටුප් හා දීමනා - රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලයේ වැටුප් හා දීමනා ජාතික රාජ්‍ය සභාව විසින් තීරණය කොට ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතුය. | පාලනය පිළිබඳ අමාත්‍යවරුන් සතු බලතල වෙනත් ආයතනයකට හෝ පුද්ගලයකුට පවරාදීමට නොහැකි බව ව්‍යවස්ථාවේ සඳහන් වේ.<br>• අනෙක් රාජ්‍ය සේවකයින් හා සම්බන්ධ පත්කිරීම්, පහකිරීම්, සේවකයින් ඉවත් කිරීම් හා විනය පාලනය පිළිබඳ බලතල අමාත්‍ය මණ්ඩලය විසින් කලින් කලට රාජ්‍ය සේවා කොමිසමට පවරා දිය හැක.<br>• රාජ්‍ය සේවයේ යම් නිලධාරී කාණ්ඩවලට අයත් නිලධාරීන් මාරු කිරීමේ බලය අමාත්‍ය මණ්ඩලය විසින් අමාත්‍යවරුන්ට පවරා දිය හැක. එසේ පවරනු ලැබූ විට ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිසම ක්‍රියාත්මක නොවිය යුතුය.<br>• අමාත්‍ය මණ්ඩලය විසින්<br>i රාජ්‍ය නිලධාරීන් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය<br>ii රාජ්‍ය නිලධාරීන්ගේ පැවැත්ම පිළිබඳ රීති මාලා<br>iii උසස් කිරීමේ හා මාරු කිරීම් පිළිබඳ ප්‍රතිපත්ති<br>iv රාජ්‍ය සේවකයින් පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහකිරීම හා විනය පාලනය හා සම්බන්ධ බලතල ක්‍රියාවට නංවන ආකාරය පිළිබඳ පටිපාටිය.<br>v ඉහත දැක්වූ බලතල පවරා දීම හා අදාල ක්‍රියා පටිපාටිය යනාදී දේ පිළිබඳව ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව අදාල නීතිරීති තීරණය කළ යුතුය. |

| | | |
|---|---|---|
| | රාජ්‍ය සේවා විනය මණ්ඩලය<br>• මෙම මණ්ඩලයේ සාමාජිකයින් පත් කිරීම ඉවත් කිරීම වැටුප් හා දීමනා, නිල කාලය, ලේකම්වරයා යනාදී කරුණු සම්බන්ධයෙන් ඉහතින් දක්වන ලද i - viii යන විධිවිධාන එයාකාරයෙන්ම අදාළ වේ.<br>රාජ්‍ය නිලධාරින් පත් කිරීම<br>(අ) දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ අමාත්‍ය මණ්ඩලය විසින් නියම කරන වෙනත් තනතුරු වලට පත් කිරීම.<br>- මෙම තනතුරුවලට පත් කිරීම් කිරීම අමාත්‍ය මණ්ඩලය විසින් කරනු ලැබේ.<br>- අමාත්‍ය මණ්ඩලය එසේ කළ යුත්තේ අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තු භාර අමාත්‍යවරයාගේ නිර්දේශය අනුවය.<br>- අමාත්‍යවරයා තම නිර්දේශ ඉදිරිපත් කළ යුත්තේ රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලයේ අදහස් විමසීමෙන් පසුවය.<br>- යම් නිලධාරියෙකු වෙනත් දෙපාර්තමේතුවක සේවයේ යෙදී සිටියදී තවත් දෙපාර්තමෙන්තුවකට පත් කර ගැනීමට අදහස් කරන්නේනම් එසේ කිරීම සඳහා නිර්දේශ කළ යුත්තේ එම නිලධාරියා සේවයේ යෙදී සිටින දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයාගේ අදහස් විමසීමෙන් පසුවය. | • අමාත්‍ය මණ්ඩලය සතු මෙම බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ව්‍යවස්ථාවේ 126 වන වගන්තියේ දැක්වෙන විධිවිධාන වලට අනුව පමණක් මිස වෙනත් ආකාරයකින් අධිකරණයක ප්‍රශ්න කළ නොහැක.<br>• රාජ්‍ය සේවා කොමිසන් සභාව<br>- ජනාධිපතිවරයා විසින් පත්කරන සාමාජිකයින් 5 දෙනෙකුගෙන් කොමිසන් සභාව සමන්විත වේ.<br>- එයින් එක් සමාජිකයකු ජනාධිපතිවරයා විසින් කොමිසමේ සභාපතිවරයා ලෙස පත්කළ යුතුය.<br>- පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුව සිටින අයෙකු රාජ්‍ය සේවා කොමිසමේ සාමාජිකයෙක් ලෙස පත් නොකළ යුතුය.<br>- කොමිසමේ සාමාජිකයකු ලෙස පත්කරන අයෙකු ඒ වනවිට රජයේ වෙනත් තනතුරක් දරන්නේනම් එම තනතුරින් ඉවත් විය යුතුය.<br>- නිල කාලය වසර 05 කි. ඕනෑම සාමාජිකයෙකුටම ලිඛිත දැන්වීමක් ජනාධිපති වරයාට ඉදිරිපත් කිරීමෙන් ඉල්ලා අස්විය හැක. නැතිනම් හේතු දැන්වීමෙන් නිලයෙන් ඉවත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත.<br>- සාමාජිකයින් යළි පත් කළ හැක. |

| | | |
|---|---|---|
| | (ආ) රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු<br>- අමාත්‍ය මණ්ඩලය විසින් පත් කිරීම කරනු ලබන්නේය.<br>- අමාත්‍ය මණ්ඩලය එසේ කළ යුත්තේ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු භාර අමාත්‍යවරයාගේ නිර්දේශ අනුව පමණි.<br>- අමාත්‍යවරයා නිර්දෙශ ඉදිරිපත් කළ යුත්තේ රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලයේ නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුවය. පත්කිරීමේ බලතල අමාත්‍යවරුන්ට පැවරීම<br>- ඉහතින් දැක් වූ 'ආ' කාණ්ඩයේ තනතුරු සඳහා පත් කිරීමේ බලය අමාත්‍ය මණ්ඩලය විසින් නියම කරන කොන්දේසිවලට යටත්ව අමාත්‍යවරුන්ට පැවරිය හැක.<br>- මෙසේ පවරනු ලබන බලය අමාත්‍යවරුන් විසින් ක්‍රියාවට නැංවිය යුත්තේ රාජ්‍ය සේවා උපදේශක සභාවේ නිර්දේශ ලබා ගැනීමෙන් පසුව පමණි.<br>පත් කිරීමේ බලතල නිලධාරීන්ට පැවරීම<br>- පත්කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරුන්ට පවරන බලතල අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වයට<br>හා නියමිත කොන්දේසිවලට යටත්ව ඒ ඒ අමාත්‍යවරුන් විසින් නිලධාරින්ට පැවරිය හැක. රාජ්‍ය නිලධාරීන් සේවයෙන් පහකිරීම හා විනය පාලනය. | - සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා පාර්ලිමේන්තුවෙන් තීරණය කොට ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතුය. නිල කාලය තුළදී වැටුප් අඩු කළ නොහැක.<br>- ගණ පූරණය සඳහා අදාල සංඛ්‍යාව 3කි.<br>- සාමාජික ධූරයක් හිස්ව පැවතුණ ද කොමිසන් සභාවේ ක්‍රියාකාරිතවය අඛණ්ඩව පවතින්නේය.<br>- රාජ්‍ය කොමිසන් සභාවේ කාර්යයන් හා බලතල ක්‍රියාවට නැංවීම සඳහා අනුකමිටු පත් කිරීමට රාජ්‍ය සේවා කොමිසමට නියෝග කිරීමේ බලය අමාත්‍ය මණ්ඩලයට ඇත්තේය.<br>- අනු කමිටුවක සාමාජික සංඛ්‍යාව තිදෙනෙක් විය යුතුය. රාජ්‍ය සේවා කොමිසන් සභාවේ සභාපතිවරයා අනු කමිටුවක සාමාජිකයෙකු වන්නේනම් නිල බලයෙන්ම ඔහු අනු කමිටුවේ සභාපති ද වන්නේය. එසේ නොවන්නේනම් අනු කමිටුවේ සාමාජිකයින් අතුරින් එක් අයෙකු සභාපති ලෙස රාජ්‍ය සේවා කොමිසමේ සභාපති විසින් ලිඛිතව පත්කළ යුතුය.<br>- අනු කමිටුවක් පත්කළ විට එයට පැවරෙන කාර්ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ක්‍රියාත්මකවීම රාජ්‍ය සේවා කොමිසම විසින් අත්හල යුතුය. |

| | | |
|---|---|---|
| | - මේ හා සම්බන්ධ බලතල ක්‍රියාවට නැංවීමේ බලය හිමි වන්නේ අමාත්‍ය මණ්ඩලයටය.<br>- අමාත්‍ය මණ්ඩලය එම බලතල ක්‍රියාවට නැංවිය යුත්තේ අදාල නිලධාරියා අයත් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයාගේ නිර්දේශය අනුවය.<br>- අමාත්‍යවරයා තම නිර්දේශ ඉදිරිපත් කළ යුත්තේ රාජ්‍ය සේවා විනය මණ්ඩලයේ නිර්දේශ ලබා ගැනීමෙන් පසුවය.<br>- අමාත්‍ය මණ්ඩලය විසින් මෙම බලතල ක්‍රියාවට නැංවීම අමාත්‍යවරුන්ට පවරා දිය හැක. අමාත්‍යවරුන් එම බලතල ක්‍රියාවට නැංවිය යුත්තේ රාජ්‍ය සේවා විනය මණ්ඩලයේ නිර්දේශවලට අනුකූලවය.<br>- රාජ්‍ය සේවා විනය මණ්ඩලයේ නිර්දේශ මත අමාත්‍යවරයෙකු විසින් යම් රාජ්‍ය නිලධාරියෙකු පිළිබඳව ගන්නා විනය තීරණයක් සේවයෙන් පහකිරීම හා සම්බන්ධ නොවන්නේ නම් එහිදී එම නියෝගය අදාළ කරුණ සම්බන්ධයෙන් අවසාන තීරණය වන්නේය.<br>- නියෝගය සේවයෙන් පහකිරීම හා සම්බන්ධ වන්නේ නම් එහි දී ඒ පිළිබඳව අමාත්‍ය මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කිරීමට අදාල නිලධාරියාට අයිතිය ඇත. | - රාජ්‍ය සේවා කොමිසම හෝ අනුකොමිසමක් සතු රාජ්‍ය සේවාව හා සම්බන්ධ බලතල ක්‍රියාවට නැංවීම යම් නිලධාරියෙකුට පවරන ලෙස නියෝග කිරීමේ බලය අමාත්‍ය මණ්ඩලය සතුවේ.<br>- නිලධාරියෙකු විසින් එම බලතල ක්‍රියාවට නැංවීමේදී අතෘප්තියට පත්වන පාර්ශවයකට අනු කමිටුවට හෝ රාජ්‍යසේවා කොමිසමට අභියාචනා කිරීමේ අයිතිය ඇත.<br>- රාජ්‍ය සේවය පාලනය සම්බන්ධයෙන් අමාත්‍යකවරයෙකු, රාජ්‍ය සේවා කොමිසන් සභාව, අනු කොමිසන් සභාව සහ නිලධරයෙකු ගන්නා තීරණයන් වෙනස් කිරීමට අමාත්‍ය මණ්ඩලයට බලය ඇත්තේය.<br>- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ අනු කොමිසන් සභාවක හෝ නිලධරයෙකුගේ කාර්යන්ට බලපෑම් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වේ.<br>- එවැනි චෝදනාවන් ජූරි සභාවක් නොමැතිව මහාධිකරණයක විනිශ්චය කළ යුතු අතර, වරදකරු වුවහොත් රුපියල් දහසක දඩයකට හෝ එක් අවුරුදු සිර දඬුවමකට හෝ ඒ දෙකටම යටත් වන්නේය. |

| | | |
|---|---|---|
| | - අභියාචනය විමසීමෙන් පසුව නියෝගය ස්ථිර කිරීමට හෝ වෙනස් කිරීමට අමාත්‍ය මණ්ඩලයට බලය ඇත.<br>- විනය පාලනය පිළිබඳව අමාත්‍යවරුන්ට බලය පවරා ඇති විටක අමාත්‍යවරුන් විසින් අමාත්‍ය මණ්ඩලයේ එකගත්වය ඇතිව එම බලතල ක්‍රියාවට නැංවීම නිලධාරීන්ට පැවරිය හැක.<br>- එසේ බලතල ක්‍රියාවට නැංවීමේදී විනය කරුණක් සම්බන්ධයෙන් ගනු ලබන තීරණයන් පිළිබඳව අතෘප්තියට පත්වන පුද්ගලයාට ඒ පිළිබඳව රාජ්‍ය සේවා විනය මණ්ඩලයට එක් අභියාචනයක් ඉදිරිපත් කළ හැක.<br>- රාජ්‍ය සේවා විනය මණ්ඩලයේ තීරණය සේවයෙන් පහකිරීම නොවන්නේනම් එය අවසාන තීරණය වන්නේය. සේවයෙන් පහකිරීම නම් එහි දී අමාත්‍ය මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කළ හැක.<br>• පොදු ලක්ෂණ<br>(අ) රාජ්‍ය සේවය දේශපාලන විධායකය යටතට පත් කිරීම<br>(ආ) රාජ්‍ය සේවකයින් සේවයේ යෙදී සිටින්නේ ජනාධිපතිවරයාගේ අභිමතය හා කැමැත්ත ඇතිතාක් වීම. | **17 වන ව්‍යවස්ථා සංශෝධනය සහ රාජ්‍ය සේවාව සම්බන්ධ විධිවිධාන**<br>• රාජ්‍ය සේවා කොමිසන් සභාව සාමාජිකයින් නව දෙනෙකුගෙන් සමන්විත වන්නේය.<br>• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් කොමිසන් සභාවේ සාමාජිකයින් පත්කළ යුතුය.<br>• සමාජිකයින් අතුරින් අවම වශයෙන් තිදෙනෙකුටවත් රජයේ නිලධරයන් වශයෙන් අවුරුදු 15 කට වැඩි ප්‍රමාණයක පලපුරුද්ද තිබිය යුතුය.<br>• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත සාමාජිකයින් අතුරින් එක් අයෙකු ජනාධිපතිවරයා විසින් කොමිසමේ සභාපතිවරයා ලෙස පත්කළ යුතුය.<br>• පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙකු රාජ්‍ය සේවා කොමිසන් සභාවේ සමාජිකයෙකු ලෙස පත් නොකළ යුතුය. යම් සාමාජිකයෙකු ඉහත දැක්වූ තනතුරකට පත්වුවහොත් කොමිසමේ සාමාජිකත්වයෙන් ඉවත්විය යුතුය.<br>• රාජ්‍ය නිලධරයෙකු හෝ අධිකරණ නිලධරයෙකු, සාමාජිකයෙකු ලෙස පත්කළ විට ඔහු/ ඇය දැරූ තනතුරින් ඉවත් විය යුතුය. කොමිසමේ සේවයෙන් පසුව යලි රාජ්‍ය සේවයේ හෝ අධිකරණ සේවයේ තනතුරකට පත්විය නොහැක. |

| | | |
|---|---|---|
| | (ඇ) රාජ්‍ය සේවය පාලනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය සතු බලතලක්‍රියාවට නැංවීම පිළිබඳව කිසිදු අධිකරණයක ප්‍රශ්න කිරීම තහනම් කිරීම. | • සාමාජිකයින්ගේ නිළ කාලය අවුරුදු තුනකි. පහත දැක්වෙන හේතු මත සාමාජිකත්වය අහෝසි විය හැක.<br>(අ) පාර්ලිමේන්තුවේ, පළාත් සභාවක, පළාත් පාලන ආයතනයකට සාමාජිකයෙකු ලෙස පත්වීම.<br>(ආ) ලිඛිතව ජනාධිපතිවරයාට කරන දැන්වීමක් මගින් ඉල්ලා අස්විම.<br>(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් ඉවත් කිරීම.<br>(ඈ) චරිත දූෂණ වරදකට අධිකරණය මගින් වරදකරු කිරීම.<br>(ඉ) ප්‍රජා අනුශක්තාවකට භාජනය වීම.<br>(ඊ) කොමිසන් සභාවේ අනුමැතිය නොලබා කොමිසන් සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට සහභාගි නොවීම.<br>• සාමාජිකයින් යලි පත්කළ හැක.<br>• කොමිසම් සභාවේ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා පාර්ලිමේනතුව විසින් තීරණය කොට ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතුය.<br>• කොම්සන් සභාවට ලේකම්වරයෙකු සිටින අතර කොමිසන් සභාව විසින් පත්කළ යුතුය.<br>• රජයේ නිලධරයන් පත්කිරීම, උසස් කිරිම, මාරුකිරීම විනය පාලනය සහ සේවයෙන් පහකිරීම පිළිබඳ බලතල කෙමිසන් සභාවට හිමිවේ. |

| | | |
|---|---|---|
| | | • මේ හා සම්බන්ධව නීතියෙන් පිහිටුවන ලද පළාත් රාජ්‍ය සේවා කොමිසන් සභාවල බලතල හීන කරවීමට කොමිසම ක්‍රියා නොකළ යුතුය.<br>• අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීම, උසස් කිරීම, මාරු කිරීම, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම පිළිබඳ බලතල අමාත්‍ය මණ්ඩලය සතුවන අතර අමාත්‍ය මණ්ඩලය එම බලතල ක්‍රියාවට නැංවිය යුත්තේ රාජ්‍ය සේවා කොමිසන් සභාවේ අදහස් විමසා දැන ගැනීමේ පසුවය.<br>• රාජ්‍ය නිලධාරීන් පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සහ ඒවා ක්‍රියාවට නංවීම සඳහා අවශ්‍ය විධිවිධාන සැළසීම අමාත්‍ය මණ්ඩලය සතු වගකීමක් වන්නේය.<br>• රාජ්‍ය සේවා කොමිසම තම බලතල හා කාර්යයන් ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකිව යුතු අතර තම කාර්යයන් පිළිබඳ වාර්තා වාර්ෂිකව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.<br>• කොමිසන් සභාවේ වැඩ කටයුතු ක්‍රියාවට නැංවීම සඳහා අනු කොමිසන් පිහිටුවීම මෙන්ම නිලධරයන්ට පැවරීමටද කොමිසමට බලය ඇත. සෑම අනුකොමිසමකටම ලේකම්වරයෙකු සිටින අතර ලේකම්වරයා රාජ්‍ය සේවා කොමිසම විසින් පත්කළ යුතුය. |

| | | |
|---|---|---|
| | | • අනු කොමිසමක සාමාජික සංඛ්‍යාව තිදෙනෙකි.<br>• අනු කොමිසම් සභාවක හෝ නිලධරයෙකුගේ තීරණයකට එරෙහිව කොමිසන් සභාවට අභියාචනා කිරීමේ අයිතිය අතෘප්තියට පත් පාර්ශවයට හිමිවේ.<br>• එවැනි අභියාචනා සම්බන්ධයෙන්:<br>(අ) දෙන ලද තීරණය වෙනස් කිරීමට<br>(ආ) මද වශයෙන් වෙනස් කිරීමට<br>(ඇ) ස්ථිර කිරීමට<br>(ඈ) නැවත වරක් පරීක්ෂා කරන මෙන් අණ කිරීමට කොමිසමට බලය ඇත්තේය<br>• රාජ්‍ය සේවා කොමිසමේ රැස්වීම්වල ගණ පූරණය පහකි. තීරණ රැස්වීමට සහභාගිවී සිටින සාමාජිකයින්ගේ බහුතර අනුමැතියෙන් ගත යුතුය.<br>• සම චන්ද අවස්ථාවක දී සභාපතිවරයාට තීරක ඡන්දයක් හිමිවේ.<br>• සභාපතිවරයා රැස්වීම්වල මුලසුන දැරිය යුත්තේය. ඔහු නොමැති විටෙක පැමිණ සිටින සාමාජිකයන් අතුරින් කෙනෙකු මූලාසනයට පත්කළ යුත්තේය.<br>• කොමිසමේ, අනුකොමිසමක හෝ නිලධරයෙකු තමන්ට පැවරී ඇති බලතල හා කාර්යයන් ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් අධිකරණයක ප්‍රශ්න කළ නොහැක. (126 වන වගන්තියට යටත්ව) |

• මෙසේ සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමෙන් පසුව රාජ්‍ය සේවය ස්වාධීනව සහ අපක්ෂපාතීව පවත්වාගෙන යාම සඳහා වඩාත් සුදුසු විධිවිධාන අඩංගු වූයේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකද යන්න ගුරුවරයා විසින් සිසුන්ට අවබෝධකර දිය යුතුය.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම්

- ද්විත්ව සටහන් ජර්නලයක් සැකසීම
- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සෝල්බරි, 1972,1978 යන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයෙහි ලා බලපෑ පසුබිම් සාධක සම්බන්ධයෙන් සිසුන්ගේ අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ද්විත්ව සටහන් ජර්නලයක් සකස් කරන්න.
- පන්තිය කුඩා කණ්ඩායම් වලට බෙදා ද්විත්ව සටහන් ජර්නල සකසා පසුව පොදු ද්විත්ව සටහන් ජර්නලයක් සකසන්න.
- ප්‍රතිචාරවල තර්කානුකූල බව, අර්ථාන්විත බව තෝරාගත් තොරතුරු තේමාවට දක්වන අදාළ බව පිළිබඳ අවධානය යොමු කරන්න.

### කාර්ය පත්‍රිකාව

| තෝරාගත් අදහස් | ශිෂ්‍ය ප්‍රතිචාර |
|---|---|
| 1947 සෝල්බරි | ............................................................ |
| ♦ ............................................................ | ............................................................ |
| ♦ ............................................................ | ............................................................ |
| ♦ ............................................................ | ............................................................ |
| 1947 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව | ............................................................ |
| ♦ ............................................................ | ............................................................ |
| ♦ ............................................................ | ............................................................ |
| ♦ ............................................................ | ............................................................ |
| 1947 දෙවන ජනරජ ව්‍යවස්ථාව | ............................................................ |
| ♦ ............................................................ | ............................................................ |
| ♦ ............................................................ | ............................................................ |
| ♦ ............................................................ | ............................................................ |

## මූලාශ්‍රය


1. **අබේසිංහ, ඩබ්.ඒ. (1995) ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රමය: අතීතය හා වර්තමානය කොළඹ ගොඩගේ ප්‍රකාශන**
2. **විතානවසම්, අතුල (2007) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය සහ දේශපාලනය දේශපාලන විද්‍යා අංශය පේරාදෙණිය විශ්ව විද්‍යාලය, කතෘ ප්‍රකාශන**
3. **1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**
4. **1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

# පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම

ඉගෙනුම් - ඉගැන්වීම් සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත් ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදාගත යුතු බවත් සෑම ගුරුවරයෙකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියාකරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දීය. මෙය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයකුට අවශ්‍ය ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතුවෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදා ගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටුකරන කාර්ය නිරීක්ෂණයකරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහිදී ශිෂ්‍යයා නිරතුරුව ඇගයීමට ලක්විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරණු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේදැයි තහවුරු කර ගැනීමය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය.එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රති පෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත්විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්නුම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනා ගැනීම සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගේ බලාපොරොත්තු වන අතර සිසුන් හා සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතු ය. මේ සඳහා යොදාගත හැකි හොඳම ක්‍රමය වන්නේ පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථෝක්ත අරමුණු සහිතව ක්‍රියාකරන ගුරුවරුන් විසින් තම ඉගැන්නුම් ක්‍රියාවලියත් සිසුන් ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස වඩා හොඳ කාර්යක්ෂමතාවයෙන් යුක්ත ඉගෙනුම් ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේය.

| | | | |
|---|---|---|---|
| 01. | පැවරුම් | 02 | ව්‍යාපෘති |
| 03. | සමීක්ෂණ | 04 | ගවේෂණ |
| 05 | නිරීක්ෂණ | 06 | ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම |
| 07 | ක්ෂේත්‍ර චාරිකා | 08 | කෙටි ලිඛිත පරීක්ෂණ |
| 09 | ව්‍යුහගත රචනා | 10 | විවෘත ග්‍රන්ථ පරීක්ෂණ |
| 11 | නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 12 | ශ්‍රවණ පරීක්ෂණ |
| 13 | ප්‍රායෝගික ක්‍රියාකාරකම් | 14 | කථනය |
| 15 | ස්ව නිර්මාණ | 16 | කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 17 | සංකල්ප සිතියම | 18 | ද්විත්ව සටහන් ජර්නල |
| 19 | බිත්ති පුවත්පත් | 20 | ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් |
| 21 | ප්‍රශ්න හා පිළිතුරු පොත් | 22 | විවාද |
| 23 | සාකච්ඡා මණ්ඩල | 24 | සම්මන්ත්‍රණ |
| 25 | ක්ෂණික කථා | 26 | භූමිකා රංගන |

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රම සෑම එකක්ම සෑම විෂයයක් සම්බන්ධයෙන් සෑම විෂයය ඒකකයකට ම යොදා ගතයුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනිමට ගුරුවරුන් දැනුවත් විය යුතුය; වග බලා ගත යුතුය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ගුරුවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි ඉගෙනුම් - ඉගැන්නුම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදාගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මග හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන්ම ආවේදනික ගති ලක්ෂණත් මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළගා කර ගැනිමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

## ඇගයීම් සැලසුම්

### I වාරය - ඇගයීම් 01

ග්‍රීක යුගයේ සිට නව යුගය දක්වා ක්‍රමිකව සිදු වූ සමාජ විකාශනයේ ප්‍රතිඵලයක් ලෙස දේශපාලන විද්‍යාව අධ්‍යයනය විෂයයක් ලෙස ආරම්භ වූ ආකාරය දක්වමින් බිත්ති පුවත්පතක් නිර්මාණය කිරීම. මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමකි.

**අවධානය යොමුකළ යුතු කරුණු**

I දේශපාලන විද්‍යා විෂය විවිධ යුග ඔස්සේ වර්ධනය වෙමින් ඉදිරියට පැමිණ ඇති බව.

II විවිධ යුග වල විෂයට එක් වූ නව තේමාවන් පිළිබඳ තුලනාත්මක අවබෝධය.

III නිර්මාණාත්මක සහ සංවිධානාත්මක ලෙස කරුණු ගොනු කර ඇති ආකාරය.

### I වාරය - ඇගයීම් - 02

දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය කලින් කලට වෙනස් වෙමින් නවාංග එකතුවෙමින් පැවතියද මේ දක්වා පොදු එකඟතාවක් ඇති වී නැත. මේ පිළිබඳ ව සිසු අවබෝධය පුළුල් කිරීම සඳහා ගවේෂණ පත්‍රිකාවක් සකස් කිරීම. මෙය කේවල ක්‍රියාකාරකමකි.

**අවධානය යොමු කළ යුතු කරුණු**

I දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයට ඇතුලත් අංග පිළිබඳ දැනුම.

II සිවිල් ජන ජීවිතය යහපත් කිරීම සඳහා දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයේ කරුණු බලපාන ආකාරය.

III විවිධ මූලාශ්‍ර ඇසුරෙන් තොරතුරු ගවේෂණය කර ඇති ආකාරය.

IV ගවේෂණය අවසානයේ ඇසුරුකර ගත් ග්‍රන්ථ නාමාවලිය අකාරාදී පිළිවෙළට සටහන් කිරීම.

### I වාරය - ඇගයීම් - 03

රාජ්‍යයේ ආරම්භය හා විකාශය දෙස බැලීමේදී පෙනීයන ලක්ෂණයක් වන්නේ යුගයෙන් යුගයට රාජ්‍යයේ කාර්ය භාරය ඉදිරියට ගමන්කර ඇති බවයි .මෙම කරුණු තේමා කර ගනිමින් පහත සඳහන් මාතෘකා ඔස්සේ කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සිසුන් යොමු කරන්න.

**අවධානය යොමු කළ යුතු කරුණු**

I රාජ්‍යයක මූලික ලක්ෂණ හා විවිධ රාජ්‍ය බිහිවීමට හේතු.

II ඒ ඒ යුගවල ක්‍රියාත්මක වූ විවිධ රාජ්‍ය පිළිබඳ තොරතුරු.

III සිසු කණ්ඩායම් නිර්මාණශීලී ලෙස "කණ්ඩායම් ඉදිරිපත් කිරීමක"ට යොමු කිරීම.

IV සංවිධානාත්මක බව හා මාතෘකාවට අදාළ කරුණු ඉදිරිපත් කිරීම.

## II වාරය - ඇගයීම් 01

ආණ්ඩුවේ ස්වභාවය හා ක්‍රියාකාරිත්වය යන මාතෘකාව ඔස්සේ පිටු පෙරළනයක් සකස් කිරීම මෙමගින් බලාපොරොත්තුවේ. මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමකි.

අදාළ මාතෘකා
1. ආණ්ඩුව පිළිබඳ විවිධ නිර්වචන
2. ආණ්ඩුව සුවිශේෂ සංවිධානයක් ලෙස හැඳින්වීමට හේතු
3. ආණ්ඩුවේ ස්වාධිපති බලය ක්‍රියාත්මක කරන විධි
4. ආණ්ඩුවේ වර්තමාන ක්‍රියාකාරිත්වය
5. ආණ්ඩුව හා මහජනයා අතර ඇති සම්බන්ධතාවය

**අවධානය යොමු කළ යුතු කරුණු**

I කණ්ඩායමේ සහභාගිත්වයෙන් මාතෘකාවට අදාළ තොරතුරු රැස් කිරීම.
II නිවැරදි ලෙස තොරතුරු සටහන් කිරිම.
III නිර්මාණාත්මක ලෙස පිටුපෙරළනය සකස් කිරීම.

## II වාරය - ඇගයීම් 02

සංවිධානය වු දේශපාලන ක්‍රමයක් තුළ පුද්ගලයන් එකට යා කරන්නා වූ උපාංග රාශියක් අතර නියෝජන ක්‍රම වලට වැදගත් තැනක් හිමිවේ. දැනට පවතින ප්‍රධාන නියොජන ක්‍රම එනම් සරල බහුතර හා සමානුපාතික නියෝජන ක්‍රමය අදාළ කරගනිමින් කේවල පැවරුමක් ලෙස සංකල්ප සිතියමක් ගොඩ නගන්න.

**අවධානය යොමු කළ යුතු කරුණු**

I තොරතුරුවල අදාළත්වය සහ අර්ථවත් බව
II තොරතුරුවල අන්තර් සබදතා දැක්විම මගින් සංකල්ප ගොඩ නැගීම.
III සංකල්ප පැහැදිලි කිරීම සඳහා තොරතුරු ව්‍යාප්ත කර ඇති ආකාරය.
IV සංවිධානාත්මක බව

## II වාරය - ඇගයීම් 03

නූතන රාජ්‍යයන් තුළ යහපාලනයේ මූල ධර්ම කොතෙක් දුරට ක්‍රියාත්මක වන්නේ ද යන්න ශිෂ්‍යයා තුළ ප්‍රයෝගික නිරීක්ෂණ දැනුම මැනීම මින් අපේක්ෂිතය. ඒ යටතේ ඔබ පාසල පිහිටි ගමේ / නගරයේ / පළාතේ ස්වේච්ඡා සංවිධාන, සමිති ආදී ජනතා සහභාගිත්වයෙන් ක්‍රියාත්මකවන්නා වූ එක් ආයතනයක් තෝරාගෙන එහි දක්නට ලැබෙන යහ පාලනයේ මූලික ගුණාංග පහත සඳහන් තේමා ඔස්සේ නීරීක්ෂණය කරමින් නිරීක්ෂණ පත්‍රිකාවක් සකස් කිරීම. මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමකි.

- ජනතා සහභාගිත්වය
- විනිවිද භාවය
- සාධාරණත්වය
- වගකීම් සහගත බව
- ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංගවල සක්‍රීය ක්‍රියාකාරිත්වය (උදා: නිලධාරීන් තෝරාපත් කරගන්නා ආකාරය)

**අවධානය යොමු කළ යුතු කරුණු**

I කණ්ඩායම් නායකයෙකු පත්කර ගනිමින් අදාළ නිරීක්ෂණයට අවශ්‍ය පසුබිම සකසා ගැනීම. (උදා: ආයතනයෙන් අවසර ලබා ගැනීම වැනි)

II වඩාත් පහසු හා උසස් මට්ටමින් අධ්‍යයන අවශ්‍යතාවය ඉටුකර ගත හැකි ස්වේච්ඡා සංවිධානය / සමිතිය තෝරා ගැනීම.

III නිරීක්ෂණ ක්‍රියා සංවිධානය කරගැනීමත් ඒ සඳහා අනුගමනය කරන විවිධ ක්‍රම පිළිබඳ ක්‍රමානුකූල නිරීක්ෂණ සටහන් තබා ගැනීම.

IV නිශ්චිත කාළ සීමාව තුළ අධ්‍යයනයට අවශ්‍ය පහසුකම් සලසා ගනිමින් අදාළ නිරීක්ෂණය සිදුකර වාර්තාව සකස් කිරීම.

## III වාරය - ඇගයීම් 01

බ්‍රිතාන්‍ය යටත් විජිත යුගය තුළ ලංකාවේ සමාජ ආර්ථික ක්ෂේත්‍රය තුළ සිදුවූ වෙනස් වීම් පිළිබඳ සිසු අවබෝධය පුළුල් කිරීමට පහත සඳහන් මාතෘකා යටතේ ක්ෂණික කථා වාරයක් සංවිධානය කරන්න.

- යටත් විජිත යුගයේ ක්‍රියාත්මක වූ සමාජ ව්‍යාපාර
  - ආගමික පුනර්ජීවන ව්‍යාපාරය
    බෞද්ධ පුනරුදය / ඉස්ලාම් පුනරුදය / හින්දු පුනරුදය
  - ලංකා ජාතික සංගමය
  - කම්කරු ව්‍යාපාරය
  - මධ්‍යම පන්තිකයන්ගේ නැගීම
  - වාමාංශික ව්‍යාපාරය
  - අමද්‍යප ව්‍යාපාරය
  - සූරිය මල් ව්‍යාපාරය

**අවධානය යොමු කළ යුතු කරුණු**

I මාතෘකාවට අදාළව කරුණු ඉදිරිපත් කිරීම
II තර්කානුකූල බව
III කරුණු පැහැදිලි ලෙස විග්‍රහ කිරිම.
IV කථනයෙහි සංවිධානාත්මක බව

## III වාරය - ඇගයීම් 02

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමය තුළ සාමාජීය, ආර්ථික,ව්‍යවස්ථා හා දේශපාලන සංවර්ධනය හඳුනා ගැනිම සඳහා කෙටි ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්නෝත්තර සංග්‍රහයක් සකස් කිරීම. මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමකි.

**අවධානය යොමු කළ යුතු කරුණු**

I පාඩමේ සියළුම අංශ ආවරණය වන පරිදි මාතෘකා සකස් කිරීම.
II එක් මාතෘකාවකින් කෙටි ප්‍රශ්ණ 10 බැගින් ඉදිරිපත් කිරිම.
III ඵල දායි ලෙස ප්‍රශ්න හා පිළිතුරු සකස් කිරීම.
IV කණ්ඩායම් සියල්ලේම ප්‍රශ්න ඇතුළත් කර ප්‍රශ්නෝත්තර සංග්‍රහයක් සකස් කිරීම.

## III වාරය - ඇගයීම් 03

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව සහ 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව පහත සඳහන් මාතෘකා ඔස්සේ සසඳමින් බුද්ධි මණ්ඩල සාකච්ඡාවක් පැවැත්වීම.

- විධායකයේ ස්වරූපය
- ව්‍යවස්ථාදායකයේ ස්වරූපය
- අධිකරණයේ ස්වරූපය
- රාජ්‍ය පරිපාලනය

**අවධානය යොමු කළ යුතු කරුණු**

I ව්‍යුහය, සංයුතිය, නිලකාලය, බලතල හා කාර්යයන් පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම.
II නිවැරදි ලෙස කරුණු ඉදිරිපත් කිරීම, තර්කානුකූල බව
III සාකච්ඡාව මෙහෙයවීම හා ඉදිරිපත් කිරීමේ කුසලතා